35 වෙළුම විශේෂ කලාපය 2018 ඔක්තෝම්බර් - දෙසැම්බර්

ISSN 1391-0299

# විදුරාව

ජාතික විද්‍යා පදනමේ විද්‍යා සඟරාව




## ජාතික විද්‍යා පදනම -
## විද්‍යාව සහ තාක්ෂණය තුළින් රට පෙරට

NATIONAL SCIENCE FOUNDATION

# විදුරාව

35 වෙළුම - විශේෂ කලාපය
2018 ඔක්තෝබර් - දෙසැම්බර්

**සභාපතිනිය**
මහාචාර්ය සිරිමලී ප්‍රනාන්දු
**අධ්‍යක්ෂ ජනරාල්**
මහාචාර්ය ආනන්ද ජයවර්ධන

**ජාතික විද්‍යා පදනමේ විද්‍යාව ප්‍රචලිතකිරීම පිළිබඳ ක්‍රියාකාරී කමිටුව**
ආචාර්ය ජයන්ත වත්තවිදානගේ (සම සභාපති)
ආචාර්ය ඩී. එම්. සූරතිස්ස (සම සභාපති)
තුසිත මලලසේකර
ආචාර්ය කුමාරි තිලකරත්න
ආචාර්ය රෝහිණී ද සිල්වා
ඉංජිනේරු ජයවිලාල් මීගොඩ
එරින් විජේකෝන්
ඩී.ඩබ්:ජී. ඩිල්හානි
ජේ. යෝගරාජ්
එච්. එම්. බී. සී. හේරත්

**සංස්කාරකවරු**
**තුසිත මලලසේකර - සිංහල**
අසෝක ද සිල්වා - ඉංග්‍රීසි
ආචාර්ය ආර්. සෙන්තිල්නිදි - දෙමළ

**සහාය සංස්කාරක**
කේ. ජී. ජනක කරුණාසේන

**අකුරු සැකසුම හා පිටු නිර්මාණය**
ලක්ෂිකා පියුමි නිශ්ශංක

**පිටකවරය**
ලක්ෂිකා පියුමි නිශ්ශංක

**ප්‍රකාශනය සහ මුද්‍රණය**
ජාතික විද්‍යා පදනම
47/5, මේට්ලන්ඩ් පෙදෙස
කොළඹ 07

**පිළිබිඹු මූලාශ්‍රය: ලේඛකයන්/අන්තර්ජාලය**
දුරකථනය: 2696771
ෆැක්ස්: 2694754
විද්‍යුත් ලිපිනය: vidurava@nsf.ac.lk

විදුරාව විද්‍යා සඟරාව ජාතික විද්‍යා පදනමේ වෙබ් අඩවිය වන www.nsf.ac.lk හි අන්තර්ගත කොට ඇත.

## පටුන

2 **කතුවැකිය**

3 **ජාතික විද්‍යා පදනම - අද්විතීය ඉතිහාසයක් සහිත ආයතනයකි**
එම්. අසෝක ටී. ද සිල්වා

12 **විද්‍යාව ප්‍රචලිතකිරීමේ අවශ්‍යතාවය**
කේ. ජී. ජනක කරුණාසේන

22 **ලොව ජය ගැනීමට තාක්ෂණවිද්‍යාත්මක කුසලතා**
ජේ. පී. ශාන්ත සිරි

27 **විද්‍යාව සංවර්ධනයෙහිලා ජාත්‍යන්තර සම්බන්ධතා**
වසන්ත අනුරුද්ධ

32 **සංවර්ධනය වෙමින් පවතින දේශයක විද්‍යාත්මක පර්යේෂණ**
ආචාර්ය ගීතිකා යාපා

38 **තහවුරු කළ කරුණු පදනම් ප්‍රතිපත්ති සඳහා විද්‍යාව**
ආචාර්ය පී. ආර්. එම්. පී. දිල්රුක්ෂි

42 **සාර්ථක විද්‍යා ගුරුවරයෙකු වීමේ රහස**
රේඛා ගුරුගේ

46 **ගෝලීය විද්‍යා සහ තාක්ෂණවිද්‍යා සාක්ෂරතාව තහවුරුකරන ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය**
මනුජ කරුණාරත්න

50 **විද්‍යාත්මක ලේඛනය සහ ප්‍රකාශනය: දැනුම සන්නිවේදනයට මඟක්**
ආචාර්ය එස්. ඒ. වී. මූර්ති

54 **ලැබූ දැනුම විමසමු**




© ජාතික විද්‍යා පදනම-ශ්‍රී ලංකාව
ISSN 1391-0299

NATIONAL SCIENCE FOUNDATION

මෙම ප්‍රකාශනයෙහි අඩංගු ලිපිවල අන්තර්ගතය එම ලිපි සැකසූ ලේඛකයන්ගේ අදහස් වන අතර ජාතික විද්‍යා පදනම ඒ හා සම්බන්ධව වග කියනු නොලැබේ.

# කතුවැකිය

## ආ මඟ ගැහැට යි
## පෙරමඟ සොඳුරුයි !

වසර 50ක් ! ඉතිහාසය සමස්ත කොට ගත් කළ එය සුළු කාලයකි. එසේම, මෙහිදී වඩා වැදගත්වන්නේ ගතවූ කාලය කොපමණද යන්න නොව එම කාලය තුළ සිදුකළ මෙන්ම අනාගතයේදී සිදුකිරීමට අපේක්ෂිත මෙහෙවරය.

ජාතික විද්‍යා පදනමේ ප්‍රථම පූර්වගාමියා වූ ජාතික විද්‍යා සභාව බිහිවූයේ 1968 මැයි 28 වනදාය. සුදුවැලි අතුල සුමට මාවතක් ඔස්සේ සමන් මල් ඇතිරූ යහනාවකට ගිය ගමනක් නොවූවද මෙය ශ්‍රී ලාංකික විද්‍යා ප්‍රජාව කලක් තිස්සේ වෙහෙසවූ කාර්යයක් ඉටුවීමකි. ශ්‍රී ලාංකීය විද්‍යාඥයන් තමන්ට මඟපෙන්වන, උපදෙස් හා ආධාර සපයන, එසේම තම දැනුම හා කුසලතා දේශයේ පෙරගමන සඳහා යෙදවීමට අවස්ථාව සලසන කේන්ද්‍රීය මධ්‍යස්ථානයක් බිහිකර ගැනීමට වෙර දැරුවේ 1941 සිටමය.

මේ සඳහා 1941 ජනවාරි මාසයේ පිහිටවූ ලංකා රසායන විද්‍යා සංගමය සහ 1942 දෙසැම්බර් මාසයේ පිහිටවූ ලංකා විද්‍යා සංගමය (1944 දී මෙය ලංකා විද්‍යාභිවර්ධන සංගමය ලෙසත් දැන් ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය ලෙසත් හැඳින්වෙයි). මේ සඳහා පෙරමුණ ගෙන කටයුතු කළ බව කිව යුතුය.

ශ්‍රී ලංකාව තුළ විද්‍යාත්මක පර්යේෂණ සභාවක් පිහිටුවිය යුතු බව ලංකා විද්‍යාභිවර්ධන සංගමය 1948 දී යෝජනා කළද, ප්‍රතිපත්ති සම්පාදකයන් සහ තීරණ ගන්නවුන් එම යෝජනාව කෙරෙහි නොඇසෙන දෙසවන් හා නොපෙනෙන දෙනෙතින් යුතුව පසුවූහ. වර්ෂ 1956 දී නව රජයක් බලයට පත්වීමෙන් පසුවද එම යෝජනාව යළි පෙරමුණට ගෙන ඒමට සංගමය යුහුසුළු විය.

විද්‍යාව, තාක්ෂණවිද්‍යාව, පර්යේෂණ, සංවර්ධන, නව නිෂ්පාදන, නවෝත්පාදන ආදී යෙදුම් කන වැටුනද, ඒවායින් ලද හැකි ඵල ප්‍රයෝජන පිළිබඳව බොහෝ ප්‍රතිපත්ති සම්පාදකයන් හා තීරණගන්නවුන් තුළ අදහසක් නොමැතිකම මෙම උදාසීනත්වයට හේතුව වන්නට ඇත.

1968 මැයි මස 28 වනදින මහාචාර්ය නිකොලොස් ආටිගල මහතාගේ සභාපතිත්වයෙන් යුතුව "ජාතික විද්‍යා සභාව" පිහිටවනු ලැබීම මෙම ප්‍රයත්නයන් හී කූටප්‍රාප්තිය සනිටුහන් කළේය. රටට ගැලපෙන ජාතික විද්‍යා ප්‍රතිපත්තියක් සැකසීමට සහ විද්‍යාත්මක පර්යේෂණයන්හී නියැලුනවුන්හට උදව් කිරීම සඳහා ප්‍රදාන යෝජනා ක්‍රමයක් ඇතිකිරීමට ජාතික විද්‍යා සභාවට හැකිවිය.

ජාතික විද්‍යා සභාව ඉටුකරන සේවයෙහි මදි පුංචිකම් අකාමකා දැමීම සඳහා, ජාතික විද්‍යා පදනමේ දෙවන පූර්වගාමියා වන, ස්වභාවික සම්පත්, බලශක්ති සහ විද්‍යා අධිකාරිය (නරේසා) 1982 දී පිහිටුවූයේ, ජාතික විද්‍යා සභාවේ කාර්ය පථය තවත් පුළුල් කරමිනි. මෙරට පැසුණු හා නවක විද්‍යාඥයන්ගේ පර්යේෂණ කටයුතු සඳහා ප්‍රදාන සපයමින් සහ මඟ පෙන්වමින් මෙන්ම තවත් කාර්යයන් රැසක් සිදුකරමින් "නරේසා" ආයතනය විද්‍යා ක්ෂේත්‍රය තුළ පුළුල් සේවයක් ඉටුකිරීමට සමත් විය.

එසේ වුවද මෙම සේවාවන් තුළින්ද ප්‍රමාණවත් කාර්යභාරයක් ඉටුනොවන බව දක්වමින් 1991 දී විද්‍යාව සහ සංවර්ධනය පිළිබඳව ජනාධිපති කාර්ය සාධක බලකායක් පිහිටවනු ලැබීය. එහි ඵලයක් ලෙස පිළිසිඳුන "විද්‍යා සහ තාක්ෂණවිද්‍යා සංවර්ධන පනත" ට 1994 දී පාර්ලිමේන්තුවෙහි අනුමැතිය ලැබිණ. එහි ප්‍රතිඵලයක් වශයෙන් "නරේසා" කාර්යභාරයෙන් වැඩි ප්‍රමාණයක් සඳහාවන වරම ලබමින් ජාතික විද්‍යා පදනම බිහිවිය.

ජාතික විද්‍යා පදනම සහ එහි පූර්වගාමීන් දෙපළ ගෙවීගිය වසර 50 මුළුල්ලේ සිදුකළ මෙහෙය අතිවිශාලය. ඉන් බොහොමයක් ඉතා සවිස්තරාත්මක ලෙස මෙම "විදුරාව" කලාපයෙහි ඇතුළත් ලිපි තුළින් විද්‍යාමාන වෙයි.

ශ්‍රී ලංකාවේ සියළු ක්ෂේත්‍රවලට අයත් විද්‍යාත්මක ප්‍රජාව - පරිපූර්ණ විද්‍යාඥයන් මෙන්ම නවක විද්‍යාඥයන්, විශ්වවිද්‍යාල, තාක්ෂණික හා පර්යේෂණ ආයතනවල සේවා සලසන පර්යේෂකයන්, විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්, රටපුරා විසිර සිටින නවෝත්පාදකයන්, වෛද්‍යවරු, ඉංජිනේරුවරුන්, පර්යේෂකයන්, ස්වාධීන විද්‍යාඥයන් මෙන්ම ගුරු මහත්ම මහත්මීන්, පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්, විද්‍යා සන්නිවේදකයන් සහ ලේකඛයන් ඇතුළුව මෙරට පොදු ජනතාවගේද විද්‍යාත්මක දැනුම හා කුසලතා ඉහළ නංවමින් සහ ඔප්නංවමින් ජාතික විද්‍යා පදනම පසුගිය කාලය තුළ ඉටුකළ කාර්යභාරය ඉමහත්ය.

ජාතික විද්‍යා පදනම ජාත්‍යන්තර සම්මාන හා අභිමාන හිමිකර ගනිමින් මෙම ජයග්‍රහණ භුක්තිවිඳිනුයේ කාලීන විද්‍යාත්මක අවශ්‍යතා හඳුනාගැනීමට සමත් විද්‍යාත්මක හා කළමනාකරණ දැනුමින් පෝෂිත කළමනාකරණ හා පාලක මණ්ඩලයක, උචිත කාර්යයන් ඉටුකිරීමට මඟ හෙළිපෙහෙළි කරන පාර්ශවකරුවන් රාශියක මෙන්ම තම සේවා කාර්යක්ෂමව ඉටුකිරීමට කැපවූ කාර්ය මණ්ඩලයකද ප්‍රාතිහාර්ය තුළිනි.

අඳුරු, අසීරු වූ අතීතයක් තුළින් අතිශය දුෂ්කර ගමනක් සෙමෙන් සෙමෙන් පා නැගූ ජාතික විද්‍යා පදනමට සිය 50 වසරක අභිමානය දෙස සැනසුම් සුසුමින් බැලිය හැකිය.

එහෙත් විද්‍යාත්මක පර්යේෂණ, සංවර්ධන හා නවෝත්පාදන සම්බන්ධයෙන් ගත් කළ ආසියාවේ බොහෝ රටවල් සමග එකට සිට ගැනීමට නම් ශ්‍රී ලංකාව තවතවත් පර්යේෂණ, සංවර්ධන, නවෝත්පාදන දෙසට නැඹුරුවිය යුතුය. එහෙයින්, ප්‍රතිපත්ති සම්පාදකයන් හා තීරණ ගන්නවුන් තවදුරටත් පේවෙමින් නොසිට, ඒ අවශ්‍යතා ඉටුකිරීමට තවත් වසර 50ක් ගත වනතුරු කල් නොමැරිය යුතුය.

**තුසිත මලලසේකර**

# ජාතික විද්‍යා පදනම - අද්විතීය ඉතිහාසයක් සහිත ආයතනයක්

එම්. අසෝක ටී. ද සිල්වා




ජාතික විද්‍යා පදනමෙහි පූර්වගාමියා වූ ජාතික විද්‍යා සභාව ශ්‍රී ලංකාවේ විද්‍යාත්මක ප්‍රජාව වෙත බන්දේසියක තබා පූජා කෙරුණක් නොවේ. අපේක්ෂාව සහ අපේක්ෂා භංගත්වය අතර වාසනාව දෝලනය වූ වසර 20ක පමණ කාලපරිච්ඡේදයක් තුළ වේදනාකාරී අරගලයක නිරතවීමට එයට සිදුවිය.

අතිශය පොහොසත් සහ සමකළ නොහැකි ඉතිහාසයක් ජාතික විද්‍යා පදනම සතුව ඇත. එය, වර්ෂ 1941 දක්වා සලකුණු කරගත හැකි, විද්‍යාව හා සම්බන්ධ සැලසුම් කිරීම් සහ ප්‍රතිපත්ති සකස් කිරීම් පවරන ලද පුරෝගාමී ආයතනය විය. ඉතිහාසය සංකල්පමය ලෙස පැහැදිලි අවධි දෙකකින් සමන්විත විය. වර්ෂ 1941 ජනවාරි සිට, ජාතික විද්‍යා සභාව ස්ථාපිත කරන ලද 1968 මැයි දක්වා වූ අග්‍රේසරයා (පෙරටුවයන්නා) පළමු අවධිය විය. වර්ෂ 1968 මැයි 28න් ආරම්භවී අවසාන වශයෙන් ජාතික විද්‍යා පදනම ලෙස නැවත සකස් කරන ලද, කාලානුක්‍රමිකව විවිධ ව්‍යුහමය සහ කාර්යමය වෙනස්කම්වලට බඳුන් වූ වසර 50ක කාලපරිඡේදය දෙවන අවධිය ලෙස සැලකිය හැකිය.

ලාංකිකයන් ප්‍රමුඛ ලෙස ක්‍රියාත්මක වූ ලංකා රසායන විද්‍යා සංගමය 1941 ජනවාරි මාසයේදී පිහිටුවා ගැනීමත් සමග මූලික සිදුවීම් දිගහැරීම ආරම්භ කෙරුණි. එම යුගයේ සිටි කැපී පෙනෙන විද්‍යාඥයකු වූ එන්. ජී. බැප්ටිස් මහතා විසින් සකසන ලද යෝජනාවලියකට අනුව මෙම වෘත්තීයමය සංවිධානය පිහිටුවීමට යෙදිණි. එවකට සිටි ලංකාවේ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා වූ ශ්‍රීමත් ඇන්ඩෘ කැල්ඩිකොට් ලංකා රසායනික විද්‍යා සංගමයෙහි නිර්දේශයක් මත "විද්‍යාත්මක උපදේශක කමිටුවක්" පත්කරගැනීමට විධිමත් පිළිගැනීමක් යටත්විජිත ආණ්ඩුව වෙත ලබාදී තිබුණි. කාර්මික සංවර්ධනය සහ පර්යේෂණ පිළිබඳව යටත්විජිත ආණ්ඩුවට උපදෙස් ලබාදීම විද්‍යාත්මක උපදේශක කමිටුවෙහි අරමුණ විය.

ඉන්දීය විද්‍යා මහ සභාවේ හිටපු සභාපතිවරයෙකු වූ ඩී.එච්. වාඩියා මහතා විසින් සිදුකරන ලද යෝජනාවකට අනුව රට තුළ වෙසෙන සියළුම විද්‍යාඥයින්, ඉංජිනේරුවරුන්, වෛද්‍ය විද්‍යාඥයින් හා සමාජ විද්‍යාඥයින් එක් ධජයක් යටතට ගෙන ඒම පිණිස ලංකා විද්‍යා සංගමය 1942 දෙසැම්බරයේදී පිහිටුවීමට ලංකා රසායන විද්‍යා සංගමය පෙරමුණ ගෙන ක්‍රියා කළාය.

මෙම ලංකා විද්‍යා සංගමය, 1944 ජූලි මාසයේදී ලංකා විද්‍යාභිවර්ධන සංගමය (CAAS) ලෙස නැවත සංස්ථාපනය කිරීම සිදුවිය. ඓතිහාසික වශයෙන්, ලංකා විශ්වවිද්‍යාලයේ එවකට උපකුලපති වශයෙන් සේවය කළ අයිවර් ජෙනින්ස්ගේ (පසුව, ශ්‍රීමත් අයිවර්) උපකාරය ඇතිව ලංකාව සඳහා ජාතික ව්‍යවස්ථාවක් කෙටුම්පත් කරන ලද වර්ෂයද මෙයම විය. ලංකා රසායන විද්‍යා සංගමය, එහෙයින්, විවිධ වූ සහ විශ්වසනීය වූ විද්‍යාඥයින්, ඉංජිනේරුවරුන්, වෛද්‍ය විද්‍යාඥයින් සහ සමාජ විද්‍යාඥයින් ඒකඡත්‍ර සංවිධානයක් යටතට ගෙනඒමට සමත්විය.

ලෝක බැංකුවේ සහයෝගය ලබාගැනීමට ආණ්ඩුවට බල කෙරුණු සහ ලංකා විද්‍යාත්මක සහ කාර්මික පර්යේෂණ ආයතනය (CISIR) ස්ථාපිත කිරීමට නිර්දේශය ලැබුණු, අග්‍රාමාත්‍ය ඩී. එස්. සේනානායක ඇතුළු කැබිනට් ඇමතිවරුන් වෙත 1948 දී ලංකා විද්‍යාභිවර්ධන සංගමය "විද්‍යාත්මක පර්යේෂණ සභාවක්" පිහිටුවීම සඳහා ආයාචනා කරමින් සංදේශයක් ඉදිරිපත් කළේය. මෙය, එවක විසූ විද්‍යාඥයින්ගේ "ප්‍රධාන දුක්ගැනවිල්ල" විසඳාලීම පිණිස විය. මෙලෙසම, 1956 දී නවරජයක් බලයට පත්වූ විට, ලංකා විද්‍යාභිවර්ධන සංගමය තම අරගලය අඛණ්ඩව කරගෙන යමින් විද්‍යාත්මක පර්යේෂණ සභාවක් සඳහා ඉල්ලීම නවරජය වෙත නැවත යොමු කිරීමට කටයුතු කළේය. එමෙන්ම, අතරමැදි වැඩපිළිවෙළක් ලෙස ලංකා විද්‍යාභිවර්ධන සංගමය

තම සංවිධානය තුළ විද්‍යාත්මක සහ කාර්මික පර්යේෂණවලට උපකාර කිරීම ප්‍රධාන කර්තව්‍යය ලෙස පැවති "ප්‍රධාන පර්යේෂණ කමිටුව" ලෙස හැඳින්වුණු කමිටුවක් ස්ථාපනය කළාය. ඔවුහු ලංකා විද්‍යාභිවර්ධන සංගමයට පනත් කෙටුම්පතක් සැකසීමට උනන්දු කෙරුණු, ඔවුන්ගේ ඉල්ලීමට එකඟතාවයක් දැක්වූ අග්‍රාමාත්‍ය ගරු එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක සහ එවකට ඉඩම් ඇමති හමුවූහ. ආණ්ඩුවේ කාලසීමාවේ අවසානය ළඟාවීමත් සමග මේ පිළිබඳව තිබූ උනන්දුව පහව යෑම ආරම්භ විය.

වර්ෂ 1961දී, "විද්‍යා කොමිසමක්" පත්කිරීම සඳහා රාජ්‍ය තන්ත්‍රයට ආයාචනා කරමින් යෝජනාවක් සම්මත කර ගැනුණි.

"ජාතික විද්‍යා සභාව" පිහිටුවීම සඳහා කැබිනට් පත්‍රිකාවක් සකස් කරන ලදී. කැබිනට් යෝජනාව පිළිබඳව අප්‍රසාදයක් තිබුණු නමුදු, 1963දී, ජාතික විද්‍යා සභාව පිහිටුවීමේ මූලික පියවරක් ලෙස සාමාජිකයන් 5 දෙනෙකුගෙන් සමන්විත "විද්‍යා සභාවක්" පිහිටුවා ගැනීම සඳහා නව කැබිනට් පත්‍රිකාවක් කෙටුම්පත් කිරීම පිණිස තවදුරටත් සාකච්ඡා සිදු කරන ලදී. කෙසේවෙතත්, 1965 දී බලයට පැමිණි නව රජය සමග කතිකා කිරීම නිර්දේශ කෙරුණි. වර්ෂ 1965 දෙසැම්බරයේදී, ලංකා විද්‍යාභිවර්ධන සංගම් වාර්ෂික සැසිවාරයේදී සිදුකළ තම සමාරම්භක කතාවේදී නව අග්‍රාමාත්‍ය, ඩඩ්ලි සේනානායක මැතිතුමා පර්යේෂණ සහ තාක්ෂණික අධ්‍යාපනය සඳහා නව අමාත්‍යාංශයක් පිහිටුවීමට හෙතෙම අදහස් කරගෙන සිටින බව ප්‍රකාශ කළේය.

මෙම අවධියේදී ක්‍රමසම්පාදන සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය මෙම පනතෙහි කෙටුම්පතෙහිවූ ගැටලු සහගත තැන් නිරාකරණය කිරීමට ඉදිරිපත් වූ අතර ලංකා විද්‍යාභිවර්ධන සංගමය වෙත නව යෝජනාවලියක් භාරදීම සිදුකෙරුනි. මෙවැනි හිතකර යෝජනාවලි රාශියක් ලංකා විද්‍යාභිවර්ධන සංගමය වෙත ලැබුණි.

මෙම සාකච්ඡා සිදුවෙමින් පවතින අතර, 1966 අප්‍රේල් මාසයේදී පාර්ලිමේන්තු පනතක් මගින් ලංකා විද්‍යාභිවර්ධන සංගමය පරිවර්තනයට ලක් කරන ලදී.

## ජාතික විද්‍යා සභාවේ උපත සහ මුල් ඉතිහාසය

එවකට පැවති රජය විද්‍යාත්මක පර්යේෂණ සඳහා අමාත්‍යාංශයක් පිහිටුවීමට යෝජනා කරන ලද අතර, 1968 ජනවාරි මාසයේදී විද්‍යාත්මක පර්යේෂණ සහ නිවාස අමාත්‍යාංශය පිහිටුවීම මගින් එම යෝජනාව ක්‍රියාත්මක කළාය. මෙහි ප්‍රතිඵලයක් ලෙස පෙරදී යෝජනා කෙරුණු ජාතික පර්යේෂණ සභාව සඳහා විකල්පයක් ලෙස පසු අවස්ථාවක 1968 අංක 9 දරණ පනත මගින් ජාතික විද්‍යා සභාව ස්ථාපිත කිරීම සිදුවිය. ජාතික විද්‍යා සභාව ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ස්ථාපිත කරන ලද අතර අවාසනාවකට මෙන් එය සාමාන්‍ය පරිපාලනමය සහ මූල්‍යමය බාධකවලින් නිදහස් ස්වාධීන විද්‍යාත්මක සංවිධානයක් පිළිබඳව අපේක්ෂා සහගතව සිටි විද්‍යාත්මක ප්‍රජාවගේ බලාපොරොත්තු කෙටි කාලයකින් බිඳ වැටුණි.

ජාතික විද්‍යා සභාව පිහිටුවීමේ සමාරම්භක උළෙල එවක ගරු අග්‍රාමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ ඩඩ්ලි සේනානායක මහතාගේ ප්‍රධානත්වයෙන් සහ අදාළ අමාත්‍යාංශවල අමාත්‍යවරුන්ගේ සහභාගිත්වයෙන් 1968 මැයි 28වන දින පවත්වන්නට යෙදුණි. විද්‍යා සභාවේ ප්‍රථම සභාපතිවරයාවූ මහාචාර්ය නිකොලස් ආටිගල උත්සවයේ මුලසුන දැරීය.

විද්‍යාත්මක පර්යේෂණ පිළිබඳ සැලකිල්ලක් දක්වන කරුණුවලට අමතරව සියලුම ආරාධිත කථිකයින්, අප රටට අවශ්‍ය කෙරෙන විද්‍යා ප්‍රතිපත්තියක් සැකසීමේ අවශ්‍යතාවය පිළිබඳව නව විද්‍යා සභාවේ අවධානය යොමුකිරීම කැපීපෙනෙන සිදුවීමක් විය. නිදහසින් පසුව ඉන්දියාව විසින් සිදුකරන ලද විද්‍යා හා තාක්ෂණයෙහි ඉදිරි ගමන පිළිබඳව තම කතාවේදී අවධානය යොමු කළ කාර්මාන්ත සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍ය, ඩී. පී. ආර්. ගුණවර්ධන මහතා ඉන්දියාවේ විද්‍යා සභාව පිහිටුවීමට දසවසරකට පෙර එනම් 1958 මාර්තු 4 දින එවකට ඉන්දියාවේ අගමැතිවරයා විසින් ඉන්දීය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද "විද්‍යාත්මක ප්‍රතිපත්ති ප්‍රකාශයෙහි" අඩංගු කරුණු 10 පිළිබඳවද විස්තර කළේය.



**ශ්‍රීමත් නිකොලස් ආටිගල - ජාතික විද්‍යා සභාවේ පළමු සභාපති**

මෙම ප්‍රකාශ මගින් දිරිමත් වූ අලුතින් පත්කරගන්නා ලද සභාව 1968 මැයි 29 දින ප්‍රථම වරට පවත්වන ලද රැස්වීමේදී, ජාතික විද්‍යා සභාව

විසින් සංවිධානය කරන ලද ප්‍රථම සම්මන්ත්‍රණයට පදනම් වූ විද්‍යා ප්‍රතිපත්තිය පිළිබඳව දළ ප්‍රකාශය සකස් කිරීමට උප කමිටුවක් පත් කරන ලදී.

ජාතික විද්‍යා සභාව පිළිබඳ පනතෙහි විද්‍යා සභාවෙහි කාර්යයන් මෙන්ම,
අ) සභාවේ ව්‍යවස්ථාව,
ආ) සභාපතිවරයා පත්කර ගැනීමෙහි ක්‍රියාපිළිවෙත, සහ
ඇ) ප්‍රධාන විධායක නිලධාරිවරයා (මහලේකම්) තෝරාගැනීම සහ පත්කරගැනීම ද අන්තර්ගත කර තිබේ.

විද්‍යා සභාවේ ප්‍රථම රැස්වීම් වාර්තාවලට අනුව, මහලේකම් තනතුර සඳහා ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වීම සඳහා සභාපතිවරයා විසින් සිදුකරන ලද ඉල්ලීමට ලැබී තිබුණේ සෘණාත්මක ප්‍රතිචාරයකි. ඒ අනුව, විධිමත් යෝජනාවකට අනුව, අර්ධකාලීන පදනම මත 1969 සැප්තැම්බර් මාසය දක්වා කටයුතු කිරීමට වැඩබලන මහලේකම්වරයා ලෙස බී.පී.ජේ. අලස් මහතා පත්කර ගන්නා ලද අතර, එවක් පටන් ආචාර්ය සී. ආර්. පානබොක්කේ විද්‍යා සභාවේ ප්‍රථම පූර්ණ කාලීන ප්‍රධාන විධායක නිලධාරියා ලෙස පත්කර ගන්නා ලදී.

විද්‍යාත්මක පර්යේෂණ සහ නිවාස අමාත්‍යවරයා විසින් පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වූ ප්‍රථම සභාව නම් කරන ලදී.
1. ශ්‍රීමත් නිකොලස් ආටිගල - සභාපති
2. ආචාර්ය ජී. පොන්නම්පෙරුම
3. ආචාර්ය ඒ. එන්. එස්. කුලසිංහ
4. එල්. ඩී. ජේ. ප්‍රනාන්දු මයා
5. ආචාර්ය පී. පී. ඩී. සී. සිරිවර්ධන
6. මහාචාර්ය එස්. ඩබ්ලිව්. බිබිලේ
7. ආචාර්ය චාර්ල්ස් ශාන්ත ජෝර්ජ්
8. ආචාර්ය එස්. ඥානලිංගම්
9. මහාචාර්ය ඊ. ඕ. ඊ. පෙරේරා
10. බී. පී. ජේ. අලස් මයා
11. ආචාර්ය ජේ. ඩබ්ලිව්. එල්. පීරිස්
12. ආචාර්ය වී. අප්පාපිල්ලේයි
13. වෛද්‍ය ආර්. පී. ජයවර්ධන
14. මහාචාර්ය බී. ඒ. අබේවික්‍රම
15. මහාචාර්ය එච්. කෘස්
16. ඩී. බී. රම්පාල මයා
17. මහාචාර්ය ඒ. එස්. දසනායක
18. ආචාර්ය ඊ. එෆ්. එල්. අබේරත්න
19. ඩබ්ලිව්. ඩී. වී. මහතන්තිල මයා ( ස්ථිර ලේකම් - විද්‍යාත්මක පර්යේෂණ සහ නිවාස අමාත්‍යාංශය
20. ආචාර්ය ගාමිණී කොරයා ( ස්ථිර ලේකම් - ක්‍රම සම්පාදන සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය)
21. බී. මහාදේව මයා ( ස්ථිර ලේකම් - කෘෂිකර්ම සහ ආහාර අමාත්‍යාංශය)

ශ්‍රීමත් නිකොලස් ආටිගල මාස 18ක කාලයක් තනතුරෙහි රැඳී සිටි අතර අනතුරුව ආචාර්ය ඒ. එන්. එස්. කුලසිංහ සභාපති ධූරයට පත්විය. ස්ථිර කාර්යමණ්ඩලයක් නොසිටි බැවින් විද්‍යා සභාව විශාල ලෙස ක්‍රියාත්මක වූයේ වරින් වර පත් කරන ලද කමිටු හරහා වන අතර, එලෙස පත් කර ගන්නා ලද ප්‍රථම කමිටුව වූයේ රටට අවශ්‍ය විද්‍යා ප්‍රතිපත්ති ප්‍රකාශනයක් කෙටුම්පත් කිරීම සඳහා පත් කරන ලද උප - කමිටුවයි. මහාචාර්ය එෆ්. එස්. සී. පී. කල්පගේ විසින් පර්යේෂණ ප්‍රදානයක් උදෙසා භාරදුන් අයදුම්පත්‍රයකට ප්‍රතිචාර ලෙස විද්‍යා සභාව, පර්යේෂණ ප්‍රදාන ඇගයීමට සහ නිර්දේශ ලබාදීමට පර්යේෂණ ප්‍රදාන කමිටුව යන නමින් යුත් තවත් කමිටුවක් පත් කර ගනු ලැබුණි.

කර්මාන්ත සහ විද්‍යාත්මක කටයුතු ඇමතිතුමා සමග සිදු කරන ලද සාකච්ඡාවලට අනුගාමීව විද්‍යා සභාව එක් වෙනස්කමක් සහිතව, උදා: පර්යේෂණ මණ්ඩලය, ශිෂ්‍යත්ව මණ්ඩලය ලෙස නැවත නම් කිරීම සහිතව, අමාත්‍ය මණ්ඩලය වෙත සංදේශයක් සකස් කර භාර දෙන ලදී.

වර්ෂ 1972දී, විද්‍යා සභාව නැවත සකස්



**ආචාර්ය සී. ආර්. පානබොක්ක - ජාතික විද්‍යා සභාවේ පළමු පූර්ණකාලීන ප්‍රධාන විධායක නිලධාරී**

කිරීමට අනුගාමීව, අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් නිරීක්ෂණ සිදුකරන ලදී.

විද්‍යා සභාවට, මූලික ලෙස රට තුළ ප්‍රධාන විද්‍යාත්මක කටයුතු සිදු කරන ලද අමාත්‍යාංශ සමග සෘජු සම්බන්ධතා නොමැති වීම නිසා එහි ප්‍රධාන ක්‍රියාකාරකම් කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නොලැබුණු බවට අමාත්‍ය මණ්ඩලය එකඟතාවය පළ කළාය. එහෙයින්, ජාතික විද්‍යා සභාව හුදකලාව කටයුතු කිරීමට පෙළඹී ඇත.

විවිධ දෙපාර්තමේන්තු පර්යේෂණ ආයතන සහ විශ්ව විද්‍යාල මගින් එකල ක්‍රියාවට නංවන ලද විවිධ අංශයන්හි පර්යේෂණ කටයුතු අතර ඉහළ මට්ටමේ සම්බන්ධීකරණයක් ඇති කරලීම සඳහා එකිනෙකට සම්බන්ධ ක්‍රියාකාරකම් සහිත අමාත්‍යාංශ එකී අමාත්‍යාංශවලට අයත් පර්යේෂණ සහ සංවර්ධන කටයුතු එක්ව ක්‍රියාත්මක කිරීමට හැකිවන ආකාරයකට කණ්ඩායම්ගත කිරීමට යෝජනා කෙරුණි.

සෑම අමාත්‍යාංශ කණ්ඩායමකටම ස්ථාවර පර්යේෂණ කමිටුවක් බැගින් පත් කළ යුතු බවට යෝජනා කෙරුණි. අදාළ ඇමතිවරයාගේ අනුදැනුම ඇතිව එවැනි කමිටුවක් සඳහා පත්කර ගන්නා සභාපතිවරයා, කර්මාන්ත සහ විද්‍යා

කටයුතු අමාත්‍යවරයා විසින් ජාතික විද්‍යා සභාවේ සාමාජිකයකු ලෙස පත්කරනු ලැබීමට යෝජනා විය.

විවිධ අමාත්‍යාංශවල පර්යේෂණ කටයුතුවල විෂයපථය සහ පරාසය සැලකිල්ලටගත් විද්‍යා සභාව, අදාළ අමාත්‍යවරුන්ගේ උපදෙස්වලට අනුව සභාපතිවරුන් පත් කරන ලද ස්ථාවර පර්යේෂණ කමිටු පත් කිරීමට යෝජනා කළාය.

පත්වීමට වසර පහකට අධික කාලයක් ගතවිය. මෙම නව පනත මගින් විද්‍යාව හා තාක්ෂණය සඳහා සැලසුම් සහ ප්‍රතිපත්ති සකස් කිරීම පිළිබඳව අවධාරණයක් සහිතව විද්‍යා සභාවේ වැඩකටයුතුවල විෂයපථය පුළුල්කිරීම සිදු කළේය. විශේෂයෙන්, මෙම පනත මගින් පහත සඳහන් දෑ අධ්‍යයනය කිරීම සහ වාර්තා කිරීම පිණිස විද්‍යා සභාව බලාත්මක කිරීම සිදු කරනු ලැබුණි.

(අ). ශ්‍රී ලංකාවේ සිටින විද්‍යාත්මක සහ තාක්ෂණික පුද්ගලයින් කාර්යක්ෂම ලෙස උපයෝගී කර ගැනීම;

(ආ). ශ්‍රී ලංකාවේ විද්‍යා ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අනාගත විද්‍යාත්මක සහ තාක්ෂණික මිනිස්බල අවශ්‍යතා විමසීම

(ඇ). අනාගත විද්‍යාත්මක හා තාක්ෂණික මිනිස් බල අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ප්‍රමාණවත් පුහුණු ඇතිකිරීමට පියවර ගැනීම.

## සභාපතිවරුන්ගේ නාමාවලිය

| | |
|---|---|
| ශ්‍රීමත් නිකොලස් ආටිගල | අප්‍රේල් 1968 - ජනවාරි 1970 |
| ආචාර්ය ඒ. එන්. එස්. කුලසිංහ | පෙබරවාරි 1970 - පෙබරවාරි 1972 |
| මහාචාර්ය ඔස්මන්ඩ් ඩබ්ː ජයරත්න | මාර්තු 1972 - පෙබරවාරි 1977 |
| මහාචාර්ය ඊ. ඕ. ඊ. පෙරේරා | ඔක්තෝම්බර් 1977 - මැයි 1982 |
| වෛද්‍ය ආර්. පී. ජයවර්ධන | ජූනි 1982 - අප්‍රේල් 1992 |
| මහාචාර්ය ප්‍රියානි ඊ. සොයිසා | මැයි 1992 - 1998 |
| මහාචාර්ය කේ. දහනායක | 1998 - අගෝස්තු 2001 |
| මහාචාර්ය එරික් කරුණානායක | 15 අගෝස්තු 2001 - ජනවාරි 2002 |
| මහාචාර්ය රන්ජන් රාමස්වාමි | පෙබරවාරි 2002 - අප්‍රේල් 2004 |
| මහාචාර්ය සිරිමලී ප්‍රනාන්දු | අගෝස්තු 2004 - ජූනි 2013 |
| මහාචාර්ය ඩබ්ː සුමතිපාල | ජූලි 2013 - පෙබරවාරි 2015 |
| ඉක්බාල් මොහොමඩ් මයා | පෙබරවාරි 2015 - ජූනි 2015 |
| මහාචාර්ය සිරිමලී ප්‍රනාන්දු | ජූනි 2015 සිට |

ජාතික විද්‍යා සභාව වෙත සම්ප්‍රේෂණය කිරීමට එම සාමාජිකයින්ට හැකියාව ලැබෙනු ඇතැයි විශ්වාස කෙරුණි. මෙය විද්‍යාත්මක පර්යේෂණ සඳහා සමස්ත ප්‍රතිපත්තියක් සකස් කිරීම ජාතික විද්‍යා සභාවට සහයෝගයක් වනු ඇතැයිද විශ්වාස කෙරුණි.

අමාත්‍ය මණ්ඩලයෙහි මෙම නිරීක්ෂණ ශ්‍රී ලංකාවේ ජාතික විද්‍යා සභාව 1975 නීති අංක 36 ලෙස ජාතික රාජ්‍ය සභාව 1975 අගෝස්තු මාසයේදී නව ප්‍රඥප්තිය සඳහා අනුමැතිය ලබාදුනි. කෙසේවෙතත්, ජාතික විද්‍යා සභාව ස්ථාපිත කිරීමේ පළමු පනතෙහි වූ දෝෂ නිවැරදි කිරීමට විද්‍යා සභාව නිසි පියවර ගනු ලැබීමෙන් අනතුරුව මෙම නීතිය ක්‍රියාත්මක තත්වයට

නව පනතට අනුව, සභාවේ සංයුතිය වූයේ, පත්කරන ලද සාමාජිකයන් හත් දෙනෙක් සහ නිලබලයෙන් පත්වෙන සාමාජිකයන් හයදෙනෙක් වශයෙන් සාමාජිකයන් 13 දෙනෙකුගෙන් යුත් සභාවකි. නිලබලයෙන් පත්වෙන සාමාජිකයන්, "විවිධ දෙපාර්තමේන්තු, පර්යේෂණ ආයතන, සහ විශ්වවිද්‍යාල මගින් සිදුකෙරන විවිධ ක්ෂේත්‍රවල

## ප්‍රධාන විධායක නිලධාරීන්ගේ නාමාවලිය

| | |
|---|---|
| බී. ජේ. පී අලස් මයා | මහලේකම්<br>අප්‍රේල් 1968 - අගෝස්තු 1969 |
| ආචාර්ය සී. ආර්. පානබොක්ක | මහලේකම්<br>(අනුයුක්ත) |
| ආචාර්ය. එම්. සී. එන්. ජයසූරිය | මහලේකම්<br>මාර්තු 1971 - සැප්තැම්බර් 1978 |
| ආචාර්ය ආර්. පී. ජයවර්ධන | මහලේකම්<br>නොවැම්බර් 1978 - මැයි 1982 |
| ආචාර්ය ආර්. පී. ජයවර්ධන | අධ්‍යක්‍ෂක ජනරාල්<br>ජූනි 1982 - අප්‍රේල් 1992 |
| මහාචාර්ය ප්‍රියානි ඊ. සොයිසා | අධ්‍යක්‍ෂක ජනරාල්<br>මැයි 1992 - 1998 |
| එම්. වොට්සන් මයා | අධ්‍යක්‍ෂක<br>1999 - දෙසැම්බර් 2004 |
| ආචාර්ය. එම්. සී. එන්. ජයසූරිය | අධ්‍යක්‍ෂක<br>2005 - මාර්තු 2009 |
| ආචාර්ය එස්. ඒ. කේ අභයවර්ධන | අධ්‍යක්‍ෂක<br>මැයි 2009 - දෙසැම්බර් 2011 |
| එච්. ඒ. යූ. අමරසිංහ | අධ්‍යක්‍ෂක ජනරාල්<br>පෙබරවාරි 2012 - 2013 |
| සුනේත්‍රා පෙරේරා | අධ්‍යක්‍ෂක ජනරාල් (වැඩබලන)<br>2014 |
| එච්. ඒ. යූ. අමරසිංහ | අධ්‍යක්‍ෂක ජනරාල්<br>2015 මැයි 14 දක්වා |
| ආචාර්ය තමාරා එෆ්. ඩයස් | අධ්‍යක්‍ෂක ජනරාල් (ආවරණ)<br>ජූනි 2015 - සැප්තැම්බර් 2017 |
| ආචාර්ය ජයන්ත වත්තවිදානගේ | අධ්‍යක්‍ෂක ජනරාල් (වැඩබලන)<br>ඔක්තෝම්බර් 2017 - දෙසැම්බර් 2017 |
| මහාචාර්ය ආනන්ද ජයවර්ධන | අධ්‍යක්‍ෂක ජනරාල්<br>ජනවාරි 2018 සිට |

පර්යේෂණ කටයුතු අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම පිණිස" පහසුකම් සපයන අදාළ අමාත්‍යාංශ නියෝජනය කෙරුණි.

නව සභාවේ සභාපතිවරයා පත්කරගැනීම ඉහත කාණ්ඩ දෙකට අයත් සාමාජිකයන් අතරින් අමාත්‍යවරයා විසින් සිදු කරන ලදී. සභාවේ කටයුතු සිදුකිරීමේදී ඒ සඳහා සහයෝගය ලබාගැනීමට අවශ්‍ය යැයි සැලකෙන ක්‍රියාකාරී කමිටු සභාවේ නිර්දේශය මත පත්කරනු ලැබීමට අමාත්‍යවරයා වෙත පනතින් අවසර දී තිබුණි.

සභාව සඳහා සාමාජිකයින් පත්කිරීමට අදාළ වගන්තිය, අමාත්‍යවරයාට සාමාජිකයන් අටදෙනෙකු පත්කිරීමට හැකියාව ලබාදෙන නව වගන්තියක් මගින් ප්‍රතිස්ථාපනය කෙරුණු, 1975 අංක 36 දරණ පනත 1979 නොවැම්බරයේදී තවදුරටත්

සංශෝධනයට ලක් කෙරුණි. නිලබලයෙන් පත්වෙන සාමාජිකයන්ගේ සංඛ්‍යාව තුනකට සීමා කෙරුණි.

මෙම ප්‍රතිසංස්කරණවල අවසාන ප්‍රතිඵලය වූයේ විද්‍යාත්මක සහ තාක්ෂණික කටයුතුවල සම්බන්ධීකරණය සහ සහයෝගිතාවය සඳහා අර්ථාන්විත ප්‍රතිපාදනයක් මෙන්ම මෙහෙයුම් නම්‍යශීලීතාවයක් සහිත බොහෝදුරට යහපත් ආයතනික සැකැස්මක් ලැබීමය. එහෙත්, රජයේ නව ප්‍රතිපත්ති අපේක්ෂාවන් අඛණ්ඩව ඉදිරියට ගෙනයැමේදී රටට අයත් විද්‍යාත්මක නිපුණතා තවදුරටත් පුළුල්කිරීම සහ උපරිම ලෙස භාවිත කිරීම සඳහා ස්වභාවික සම්පත් සහ බලශක්තිය යන ක්ෂේත්‍රවල උචිත කාර්යයන් උදෙසා රජය දක්වන ලද සැලකිල්ල පදනම් කරගෙන මෙම ආයතනය ප්‍රතිව්‍යුහගතකිරීමේ අවශ්‍යතාවය පැන නැගුණි.

## ජාතික විද්‍යා සභාවෙහි මස්තකප්‍රාප්ත වූ උද්ධාමය - පර්යේෂණ ප්‍රදාන යෝජනාක්‍රමයෙහි ආරම්භය

ජාතික විද්‍යා සභාව විද්‍යාත්මක පර්යේෂණ සඳහා ප්‍රදාන පිරිනැමීම 1970දී ආරම්භ කළාය. පළමු වර්ෂය තුළදී, කර්මාන්ත සහ විද්‍යා කටයුතු පිළිබඳ නව අමාත්‍යාංශය වෙත ප්‍රදාන 23ක් සඳහා මුදල් වෙන්කිරීමට තම නිර්දේශය ලබාදීමට සභාව කටයුතු කළාය. මෙලෙස ශ්‍රී ලංකාව තුළ ප්‍රථම වරට කුතුහලය දනවන දිශානතියකින් යුත් මූලික පර්යේෂණ සඳහා මූල්‍යාධාර ලබාදීම ආරම්භ කෙරුණි.

ජාතික විද්‍යා සභාවෙහි ව්‍යවස්ථාවට 1975දී ප්‍රධාන සංශෝධන ඉදිරිපත් කෙරුණි. මෙම සංශෝධනයත් සමග අභිමත ක්ෂේත්‍ර උදෙසා ව්‍යවස්ථානුකූල ක්‍රියාකාරී කමිටු පත්කිරීම සඳහා ප්‍රතිපාදන සැපයිණි. මෙම සංශෝධනවලට අනුගාමී ලෙස අමාත්‍යාංශයේ අනුමැතිය සහිතව විද්‍යා ප්‍රතිපත්ති පර්යේෂණ සඳහා ක්‍රියාකාරී කමිටුව ඇතුළත්ව ව්‍යවස්ථාපිත කමිටු හයක් පත්කර ගන්නා ලදී.

වර්ෂ 1977 සහ 1978 අතර කාලයේදී ජාතික විද්‍යා සභාවේ විද්‍යා ප්‍රතිපත්ති පර්යේෂණ ව්‍යවස්ථාපිත කමිටුව, විද්‍යා සහ තාක්ෂණය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සකස් කළ අතර, ජාතික විද්‍යා සහ තාක්ෂණ ප්‍රතිපත්ති ප්‍රකාශය ලෙස සාමාන්‍යයෙන් විස්තර කෙරුණු කොටස් හතක ව්‍යාපෘති යෝජනාවක් සකස් කර ඒ පිළිබඳව සලකා බැලීම සඳහා රජය වෙත ඉදිරිපත් කළාය. පසුව, විධායකයේ ප්‍රධානියා වූ ජේ. ආර්. ජයවර්ධන මහතා 1978 සැප්තැම්බර් මාසයේ පැවති ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයෙහි වාර්ෂික සැසියේදී ප්‍රතිපත්ති ප්‍රකාශය ප්‍රසිද්ධ කළේය. පරිසරික සහ බලශක්ති අංශයන්හි විද්‍යාත්මක සහ තාක්ෂණික සංවර්ධනය සම්බන්ධව වගකීම දැරීමේ අමතර කාර්යභාරය සහිතව බලාත්මක කිරීම මගින් ජාතික විද්‍යා සභාව ප්‍රතිව්‍යුහගත කිරීමේ අවශ්‍යතාවය ඔහුද වටහා ගෙන තිබුණි.

ස්වභාවික සම්පත් සහ බලශක්තිය ඇතුළත් කිරීම පිණිස ජාතික විද්‍යා සභාවෙහි විෂය පථය පුළුල් කෙරුණි. මෙම වෙනස්කිරීම සමග 1982 ජූනි මාසයේදී ජාතික විද්‍යා සභා පනත අවලංගු කරන ලදුව, **ස්වභාවික සම්පත්, බලශක්ති සහ විද්‍යා අධිකාරිය (නරේසා)** පිහිටුවන ලදී. අනතුරුව, රජයේ ආයතනික ව්‍යුහය තුළ එයට හිමි ධූරාවලි ස්ථානය, එය ජනාධිපති ලේකම් කාර්යාලය යටතට ගැනීමෙන් වෙනස් කරනු ලැබීය.

විද්‍යා ප්‍රතිපත්ති පර්යේෂණ ස්ථාවර කමිටුව විසුරුවා හැරීමත්, එහි කටයුතු කළමනාකරණ මණ්ඩලය වෙත මාරුකිරීමත් මෙහිලා සිදුවූ කැපීපෙනෙන වෙනස්කම් විය. විද්‍යා හා තාක්ෂණ සැලසුම් කිරීම් සහ ප්‍රතිපත්ති සැකසීම යන කාරණයට අදාළව මෙම පියවර සිතාගත නොහැකි ප්‍රතිගාමී පියවරක් විය. එසේ වුවද, ජාතික විද්‍යා සභාවෙහි එක් ප්‍රධාන කර්තව්‍යයක් වූ විද්‍යාව හා තාක්ෂණයට අදාළ විශේෂිත කරුණු පිළිබඳව රජයට උපදෙස් ලබාදීම නරේසා අඛණ්ඩව සිදු කළාය. කෙසේවෙතත්, එහි ප්‍රධාන ප්‍රක්ෂිප්තයක් වූයේ, තරුණ විද්‍යාඥයින්ගේ පර්යේෂණ හැකියාවන් වැඩිදියුණු කිරීම සහ එමගින් ක්‍රියාකාරී විද්‍යාත්මක ප්‍රජාවක් ඇති කිරීමත්ය.

තරුණ විද්‍යාඥයින්ගේ පර්යේෂණ හැකියාවන් ඔප් නැංවීමට නරේසා දැරූ ප්‍රයත්නයේ සාර්ථකත්වය පශ්චාත් උපාධි සහ ප්‍රකාශනවල ප්‍රතිඵල මගින් පෙන්නුම් කරයි. මෙම පර්යේෂණ ප්‍රදාන පිරිනැමීමේ යෝජනාක්‍රමය මගින් 1970 සිට 1984 දක්වා කාලය තුළ සුදුසුකම් ලත් විද්‍යාපති (M.Sc) උපාධි 70ක් සහ දර්ශනශූරී, (PhD) උපාධි හයක් ලබාදීම සිදුකර තිබුණි. එමෙන්ම, පර්යේෂණ ප්‍රදාන ලබාගත් පර්යේෂකයන් විසින් විද්‍යා ප්‍රකාශන 150කට අධික ප්‍රමාණයක් ප්‍රකාශනය කරනු ලැබ තිබුණි.

## විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතෙහි ආගමනය

වර්ෂ 1989දී රජය පෙරළීමත් සමගම නරේසා, ජනාධිපති ලේකම් කාර්යාලයේ ධූරාවලි ස්ථානයේ සිට කර්මාන්ත, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය වෙත මාරු කරන ලද අතර, පසුව එය කැබිනට් නොවන විද්‍යා හා තාක්ෂණ ව්‍යාපෘති අමාත්‍යාංශය යටතට පත් කරන ලදී.

විද්‍යාව පාදක කරගත් කටයුතුවල යම් ලිහිල්භාවයක් ඇතැයි උපකල්පනය කළ රජය, තත්වය සමාලෝචනය කිරීම පිණිස 1991දී "විද්‍යාව සහ සංවර්ධනය පිළිබඳ ජනාධිපති කාර්යසාධන බලකායක්" පත් කළේය.

විවිධ විෂය ශික්ෂා නියෝජනය කෙරෙමින් ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයින් නව දෙනෙකුගෙන් මෙම කාර්යසාධන බලකාය සමන්විත විය. මෙම කාර්යසාධන බලකායේ කාර්යභාරය වූයේ එකල රටේ පැවති විද්‍යාවේ සහ තාක්ෂණයේ තත්වය විමර්ශනයට ලක් කිරීම සහ කර්මාන්ත, කෘෂිකාර්මික නවීකරණයන් සහ දුගීබව තුරන්

කිරීම සඳහා විද්‍යාව සහ තාක්ෂණය යොදාගැනීම උදෙසා සුදුසු උපායමාර්ග සකස් කිරීමයි. කරුණු දහයක ප්‍රතිපත්ති රාමුවක් 1990 කාලය සඳහා නිර්දේශ කෙරුණු මෙම කාර්යසාධන බලකායේ වාර්තාව 1991 නොවැම්බර් මාසයේදී එවකට සිටි ජනාධිපතිවරයා වෙත භාරදෙන ලදී.

## ජාතික විද්‍යා පදනම බිහිවීම

විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතෙහි ප්‍රතිපාදන විද්‍යාත්මක ප්‍රජාව වෙතින් පමණක් නොව එවකට සිටි පාර්ලිමේන්තු විපක්ෂයෙන් පවා ප්‍රතික්ෂේප විය. එසේ නමුදු, විපක්ෂයේ විරෝධතාවය මත, 1994 අප්‍රේල් මාසයේදී පනත පාර්ලිමේන්තුවේ සම්මත කිරීමට රජය කටයුතු කළේය. කෙසේවෙතත්, එය ජනප්‍රිය නීති සම්පාදනයක් නොවන බව වටහාගත් රජය එම පනත ක්‍රියාවට නැංවීමෙන් ඥානාන්විත ලෙස වැළකී සිටියේය.

අනතුරුව බලයට පැමිණි සමගි රජය කැබිනට් මට්ටමේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයක් නැවත ස්ථාපිත කළේය. නව අමාත්‍යවරයා බලකායේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමෙහිලා ඇති ශක්‍යතාවය පිළිබඳව ප්‍රමුඛ පෙළේ විද්‍යාඥයින්ගේ සහ විද්‍යාත්මක සංවිධානවල උපදේශ බලාපොරොත්තු විය. කෙසේවෙතත්, 1998 අප්‍රේල් මාසයේදී, අනුප්‍රාප්තික විද්‍යා හා තාක්ෂණ අමාත්‍යවරයා කාර්යසාධන බලකායේ ප්‍රධාන නිර්දේශවලින් එකක් ක්‍රියාත්මක කිරීමට තීරණය කළ අතර ප්‍රධාන ආයතනික ප්‍රතිව්‍යුහකරණය අවශ්‍යතාවය පෙන්නුම් කරන ලද පනත ක්‍රියාත්මක කළේය.

මෙම පනතෙහි ප්‍රතිපාදන මගින්, නරේසාහි ඇතැම් මූලික කටයුතු නිර්වචනය කර තිබුණු අතර විද්‍යා ප්‍රතිපත්ති සකස් කිරීමේ කාර්යභාරය ජාතික විද්‍යා සහ ප්‍රතිපත්ති කොමිසම (නස්ටෙක්) නම් වූ වෙනමම ආයතනයකට පවරා තිබුණි. විද්‍යා සහ තාක්ෂණ ප්‍රතිපත්ති පිළිබඳව කටයුතු කිරීමේ කාර්යය අලුතින් පිහිටුවන ලද ජාතික විද්‍යා පදනම වෙත පවරන ලද අතර එමගින් නරේසා තාක්ෂණික ලෙස ප්‍රතිස්ථාපනය විය. සාධ්‍ය සංඛ්‍යාලේඛන සහ දර්ශක උත්පාදනය කිරීමෙහිලා රටෙහි විද්‍යාත්මක සම්පත් විභවය පිළිබඳව සංඛ්‍යාන විද්‍යාත්මක සමීක්ෂණයක් දීපව්‍යාප්තව සිදුකිරීම මෙහි අපේක්ෂාව විය. මෙය, විද්‍යා හා තාක්ෂණයෙහි සියලුම අංශ හා සම්බන්ධව කාර්යක්ෂම අධීක්ෂණයක් සිදුකිරීම සහ තීරණ ගැනීම මෙන්ම ජාතික සංවර්ධනය සැලසුම් කිරීමේදී විද්‍යාත්මක සලකාබැලීම් යොදාගැනීම සඳහාවේ.




**ජාතික විද්‍යා පදනම**



**මහාචාර්ය සිරිමලී ප්‍රනාන්දු**
**ජාතික විද්‍යා පදනමේ වත්මන් සභාපතිනිය**

විද්‍යා හා තාක්ෂණ මිනිස්බල සංවර්ධනය පිළිබඳ ආසියානු සංවර්ධන බැංකු (ADB) ව්‍යාපෘතිය යටතේ විද්‍යා හා තාක්ෂණ මිනිස්බල තොරතුරු පද්ධතියක් (MIS) සකස් කිරීම සඳහා 1999දී ජාතික විද්‍යා පදනම කේන්ද්‍රීය ලක්ෂ්‍යය ලෙස හඳුනාගනු ලැබුණි. ජාතික විද්‍යා පදනම ඉහත ව්‍යාපෘතිය යටතේ 2000 වර්ෂයේදී විද්‍යා හා තාක්ෂණ මිනිස්බල තොරතුරු පද්ධතිය (STMIS) ස්ථාපිත කළාය.

ජාතික විද්‍යා පදනමෙහි පුස්තකාලයෙහි පහසුකම් පුළුල්කිරීමෙන් සත් වසරකට පසුව, 1993දී ජාතික විද්‍යා පදනම් වාර සඟරාවල පූර්ණ පාඨ සඳහා මාර්ගගතව ප්‍රවේශවීමේ අවස්ථාව ලබාදෙන ශ්‍රී ලංකාවේ පළමුවැන්න ලෙස ජාතික විද්‍යා පදනම් ඩිජිටල් පුස්තකාලය දියත් කරනු ලැබීය.

සාමය සහ සංවර්ධනය සඳහා ජගත් විදු දිනය සැමරීමේ කේන්ද්‍රීය ලක්ෂ්‍යය ලෙස 2002 වර්ෂයේදී ජාතික විද්‍යා පදනම යුනෙස්කෝ ජාතික කමිටුව මගින් හඳුනාගනු ලැබුවාය. ඉන් අනතුරුව, ජාතික විද්‍යා පදනම මගින් අඛණ්ඩව ජගත් විදු දිනය වැඩසටහන සංවිධානය කිරීම සිදු කළාය. ජගත් විදු දිනය පාථශාලීය වැඩසටහන ආරම්භ කිරීමෙන් අනතුරුව මෙම සැමරීම්වලදී පාසල් ළමුන්ට ප්‍රධාන කාර්යභාරයක් ඉටුකිරීමේ අවස්ථාව ලැබුණි. එමගින්, ජගත් විදු දිනය පාථශාලීය වැඩසටහන යටතේ සිදු කෙරෙන විවිධ විද්‍යාත්මක ක්‍රියාකාරකම් ඔස්සේ පාසල් ප්‍රජාව අතර විද්‍යාව ප්‍රචලිතකිරීමට ඉඩ සලසා දුනි. ජාතික විද්‍යා පදනමෙහි ඉතිහාසයෙහි සුවිශේෂී අවස්ථාවක් සනිටුහන් කරමින් ජගත් විදු දිනය පාසල් ප්‍රජාව සමග සැමරීමේ පළමු වැඩසටහන 2004 නොවැම්බර් 10වන දින කොළඹ, රාජකීය විද්‍යාලයේ "නවරඟහල" ශාලවේදී පවත්වන්නට යෙදුණි. එයින් අනතුරුව, විවිධ විද්‍යාත්මක තේමා යටතේ 2016 දක්වා මෙම වැඩසටහන උත්කර්ෂවත් ලෙස වාර්ෂිකව සංවිධානය කෙරුණි.

ජාතික විද්‍යා පදනමෙහි අංශ හයක් ස්ථාපිත කිරීම මගින් විද්‍යාත්මක අංශවල ව්‍යුහය 2005 වර්ෂයේදී වෙනසකට බඳුන් කිරීම සිදු කෙරුණි. මෙම අංශ පර්යේෂණ අංශය (RD), විද්‍යාව ප්‍රචලිතකිරීමේ අංශය (SPD), විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ අංශය (STPRD), තාක්ෂණ අංශය (TD), ජාත්‍යන්තර සබඳතා අංශය (ILD), සහ ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය (NSLRC), යන නම්වලින් හඳුන්වන ලද අතර මෙමගින් 1994 අංක 11 දරණ විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතට අනුව පවරන ලද කාර්ය වඩා නිවැරදි සහ කාර්යක්ෂම ආකාරයට සිදු කිරීමට අපේක්ෂා කෙරුණි. ජාතික විද්‍යා පදනමෙහි විෂයපථය පුළුල්කිරීම සිදු කළද, පර්යේෂණ සහ ඊට අදාළ ක්‍රියාකාරකම්වලට ප්‍රමුඛතාවය ලබාදීම අඛණ්ඩවම සිදුකළේය.

ජාතික විද්‍යා පදනම මගින් 2005 වර්ෂයේදී උපකරණ ප්‍රදාන යෝජනාක්‍රමය හඳුන්වාදීම දේශීය විද්‍යාඥයින්ට සපයන උපකාරය පුළුල්කිරීමක් විය. මෙමගින් තම වියදමින් මිලදී ගැනීමට නොහැකි එහෙත් ඔවුන්ගේ පර්යේෂණ සිදු කිරීම සඳහා අත්‍යවශ්‍ය උපකරණ මිලට ගැනීම සඳහා ඔවුනට



**මහාචාර්ය ආනන්ද ජයවර්ධන**
**ජාතික විද්‍යා පදනමේ වත්මන්**
**අධ්‍යක්ෂක ජනරාල්**

උපකාර කෙරුණි. අමතර කොටස් ප්‍රදාන යෝජනාක්‍රමයක් හඳුන්වාදීම පර්යේෂකයින් වෙත සපයන ලද උපකරණ නඩත්තු කිරීමට උපකාර විය.

ජාතික විද්‍යා පදනම 2005 වර්ෂයේදී බහුවිෂයයික සමෝධානිත තේමා මූලික පර්යේෂණ වැඩසටහන (CTRP) ආරම්භ කළාය. පාර්ශවකරුවන්ට කෙටිකාලීන සෘජු ප්‍රතිලාභ ලබා දෙන්නාවූ හඳුනාගත් ප්‍රතිලාභ ලබා දීම පිණිස ජාතික පර්යේෂණ පද්ධතිය නැවත දිශාගත කිරීමට මෙය සිදුකරන ලදී.

වර්ෂ 2004 දෙසැම්බර් මාසයේදී සිදුවුණු සුනාමි විපතින් අනතුරුව, ස්වභාවික විපත් පිළිබඳව ජනතාව දැනුවත් තීරණ ගැනීම සඳහා යොමු කිරීමට ජාතික විද්‍යා පදනම තීරණය කළාය. එමනිසා, ජාතික විද්‍යා පදනම 2005දී, රූපවාහිනී විද්‍යා සඟරාව (මිහිමඬල) පළමු අදියර ලෙස ස්වභාවික විපත් පිළිබඳ කෙටි වීඩියෝ වැඩසටහන් මාලාවක් ඔස්සේ ජීවිත හානිය සහ දේපළවලට සිදුවන හානි අවම කිරීම පිළිබඳව මහජනතාව අතර දැනුවත්භාවයක් ඇති කිරීමට ක්‍රියා කළාය. මෙම වීඩියෝ වැඩසටහන් මාලාවට වෙනත් වර්තමාන විද්‍යාත්මක මාතෘකාද ඇතුලත් කරන ලද අතර සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම වෙන වෙනම වැඩසටහන් නිෂ්පාදනය කිරීම

සිදුකෙරුණි. මෙහි ප්‍රථම වැඩසටහන වූ "සුනාමිය" ස්වාධීන රූපවාහිනී සේවය ඔස්සේ විකාශය කෙරුණි. පළමු අවධිය යටතේ විද්‍යා වීඩියෝ වැඩසටහන් 13ක නිෂ්පාදන කටයුතු 2006 වර්ෂයේදී අවසන් කෙරුණි. මෙම වීඩියෝ වැඩසටහන් මාලාව, තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) ඔස්සේ පිරිනමන ලද "ඉ-ස්වාභිමානී විශේෂ කුසලතා සම්මානය" නමැති ජාතික සම්මානයකින් සහ නවදිල්ලියේ, "ඩිජිටල් එම්පවර්මන්ට් ෆවුන්ඩේෂන්" මගින් පිරිනමන ලද "2011 මන්තන් සම්මානය දකුණු ආසියාව" යන ජාත්‍යන්තර සම්මානයෙන් 2011 වර්ෂයේදී පිදුම් ලැබීය. මෙය, ජාතික විද්‍යා පදනම විසින් සංවිධානය කරන ලද වැඩසටහනක් සඳහා ජාත්‍යන්තර සම්මානයක් ලද ප්‍රථම අවස්ථාව විය. පළමු අදියර ලද සාර්ථකත්වය මත පදනම්ව, කෙටි වීඩියෝ වැඩසටහන් 15කින් සමන්විත තවත් වීඩියෝ වැඩසටහන් මාලාවක් භාෂා ත්‍රිත්වයෙන්ම නිෂ්පාදනය කරන ලදුව 2018 වර්ෂයේදී රූපවාහිනිය ඔස්සේ විකාශය කිරීමට කටයුතු කෙරුණි.

සුනාමිය පිළිබඳව කුඩා ළමුන් අතර දැනුවත්භාවයක් ඇති කිරීම පිණිස, ජාතික විද්‍යා පදනමෙහි ආරාධනාවකට අනුව සුමිත්‍රා රාහුබද්ධ ලේඛිකාව විසින් රචිත "මුහුද කළු වුණා" ළමා කතාව 2005 දී ප්‍රකාශනය කරන ලදී. මෙම ළමා කතාවට 2005 රාජ්‍ය සාහිත්‍ය උත්සවයේදී හොඳම ළමාකතා පොතට අයත් ජාතික සම්මානය හිමිවුණි.

විද්‍යාඥයින් සහ මහජනතාව අතර ඇති පරතරය පියවීම සඳහා රටතුළ විද්‍යා සන්නිවේදන සංචිතයක් ඇති කිරීමේ අරමුණ සහිතව, මහජනතාව වෙත විද්‍යාව සන්නිවේදනය කිරීමේ කුසලතාවය පිළිබඳව පුහුණු කරන්නන් පුහුණු කිරීමේ තෙදින වැඩමුළුවක් 2005 වර්ෂයේ මුල්භාගය තුළදී සංවිධානය කෙරුණි. මේ සඳහා ඉන්දියාවේ අත්දැකීම් බහුල විද්‍යා සන්නිවේදකයින් දෙපළක් සහභාගි වූ අතර විද්‍යා සන්නිවේදනය පුහුණු කරන්නන් ලෙස විද්‍යාඥයින් 30 දෙනෙකු පුහුණු කරන ලදී. මෙයින් අනතුරුව, එවැනි වැඩමුළු මාලාවක් රටපුරා පවත්වන ලදී.

ශ්‍රී ලංකාවේ, ස්වභාවික සම්පත් සංවර්ධනය කිරීම සඳහා 1994 අංක 11 දරණ පනත මගින් ජාතික විද්‍යා පදනමට පවරන ලදී. එනිසා රටේ සවභාවික සම්පත් ආරක්ෂා කිරීම සඳහා විද්‍යා පදනම දැඩි ලෙස කටයුතු කළාය. යුනෙස්කෝ, මිනිසා සහ ජෛවගෝලය වැඩසටහන යටතේ ජෛවගෝල රක්ෂිතයක් ලෙස බුන්දල ජාතික උද්‍යානය සංවර්ධනය කිරීම සඳහා 2005 වර්ෂයේදී ජාත්‍යන්තර සම්බන්ධීකරණ සභාවෙහි (1CC) අනුමැතිය ලබා ගත්තාය. මීට පෙර, 2003 වර්ෂයේදී, කන්තලේ - දැදියගල - නාකියාදෙනිය (KDN) සංකීර්ණයටද ජෛවගෝල රක්ෂිතයක් ලෙස අනුමැතිය ලබාගෙන තිබුණි.

වාරසඟරා නාම 13,500ක් ආවරණය කෙරෙන විද්‍යා හා තාක්ෂණික සාරාංශකිරීම් සහ සුචිගතකිරීම් සිදු කරන ලෝකයේ විශාලතම මාර්ගගත දත්තපාදකය වන ස්කෝපස් (SCOPUS) හි දායකත්වය ශාස්ත්‍රීය සෙවුම් සඳහා පහසුකම් සැපයීම පිණිස ජාතික විද්‍යා පදනම ලබාගත්තාය. සයන්ස් ඩිරෙක්ට් දත්තපාදකයෙහි වාරසඟරාවල පූර්ණ පාඨ සඳහා නිදහස් ප්‍රවේශයන් 2005 වර්ෂයේ සිට මෙමගින් ලබාදීමට කටයුතු කෙරුණි.

විද්‍යාඥයින්ගෙන් ලැබුණු විද්‍යාත්මක ලිපි ප්‍රකාශනය කරන ලද ජාතික විද්‍යා පදනමෙහි වාරසඟරාව, තොම්සන් විද්‍යාත්මක දර්ශකය, සහ BIOSIS පූර්ව දර්ශකය සහ සත්ව විද්‍යාත්මක වාර්තා සහ දත්ත පාදක දෙකෙහි උපුටා දැක්වීම 2006 වර්ෂයේදී සිදු කෙරුණි. ඉහත සඳහන් දත්තපාදක දෙකෙහි උපුටා දක්වන ලද අප රටේ එකම වාරසඟරාව මෙය විය.

ස්වාධීන රූපවාහිනී ජාලයෙහි (ITN) "පහන්දොර" වැඩසටහනෙහි අංගයක් ලෙස "විදුදොර" නමින් අලුත් වැඩසටහනක් ජාතික විද්‍යා පදනම මගින් 2007දී හඳුන්වා දෙන ලදී. දේශීය විද්‍යාඥයින්ගේ ජයග්‍රහණ මතුකොට දක්වන ලද වැඩසටහන් 15ක් ස්වාධීන රූපවාහිනීය මගින් නිෂ්පාදනය කරන ලදුව එම සේවය ඔස්සේම විකාශය කිරීම සිදු කෙරුණි.

ජාතික විද්‍යා පදනමෙහි ගීතය දොරට වඩන ලද ජාතික විද්‍යා පදනම් 40වන සංවත්සරය 2008 වර්ෂයේදී සමරන ලදී. මේ වසරේදී (2018) ජාතික විද්‍යා පදනම තම 50වන සංවත්සරය සමරයි. විද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම සංවිධානයක් ලෙස, ජාතික විද්‍යා පදනම රටේ විද්‍යා හා තාක්ෂණ සංවර්ධනය කෙරෙහි සුවිශාල ලෙස තම දායකත්වය සපයා ඇත. එහි අනාගත දිශානතීන්වන ශ්‍රී ලංකා ජෛව - තාක්ෂණ ආයතනය සහ ජාතික විද්‍යා මධ්‍යස්ථානය පිහිටුවීමට කටයුතු කිරීම ශ්‍රී ලංකාවේ ජනතාවට තවදුරටත් විද්‍යාව සහ තාක්ෂණයෙහි අත්දැකීම් ලබා දීමට ප්‍රවේශයක් සපයනු ඇත.



දෙහිවල
කළුබෝවිල
6/9, ද සිල්වා පාර
**එම්. අසෝක ටී. ද සිල්වා**
0775097517



# විද්‍යාව ප්‍රචලිතකිරීමේ අවශ්‍යතාවය

කේ. ජී. ජනක කරුණාසේන




"ඇරිස්ටෝටල් වැරදියි" එක් අතකින් තනි ගඩොල් කැටයක් ද අනෙක් අතින් සිමෙන්තියෙන් එකට එක් කර බඳින ලද ගඩොල් කැට ද්විත්වයක්ද ඔසවාගෙන, ඉතාලියෙහි පීසා විශ්වවිද්‍යාලයෙහි තම පන්තියේ සිසුන් ඉදිරියෙහි සිටගෙන සිටි 24 වියැති තරුණ මහාචාර්යවරයා මහ හඬින් කෑ ගැසුවේය. අනතුරුව, තම මේසය මත නැගුණු හෙතෙම තම දෑතෙහි වූ ගඩොල් කැට තමාගේ ඇස්මට්ටමට ගෙන එකවර මුදාහළේය. තනි ගඩොල සහ එකට බඳින ලද ගඩොල් ද්විත්වය එකම මොහොතක බිම පතිත විය. මෙම ව්‍යායාමය හෙතෙම කිහිප වරක් සිදු කරන ලද අතර ප්‍රතිඵලය එකම විය.



01 වන රූපයඃ වස්තූන් පොළවට පතිත වීම හා සම්බන්ධව නියමයක් ඉදිරිපත් කරන ලද ගැලීලියෝ ගැලීලි

ඇරිස්ටෝටල්ගේ ප්‍රධාන සිද්ධාන්ත අතරින් එකක් වූ "වඩා බරැති වස්තූන් ඒවායේ බර වැඩිකම හේතු කරගෙන වේගයෙන් ඇද වැටෙන බවට" ප්‍රකාශ කෙරුණු සිද්ධාන්තය නිවැරදි නොවන බව, ඉතාලියේ පීසා විශ්වවිද්‍යාලයේ ගණිතය පිළිබඳ මහාචාර්ය පදවිය හෙබවූ මෙම තරුණ මහාචාර්යවරයා, එනම්, ගැලීලියෝ ගැලීලි විසින් තහවුරු කරන ලදී. "වඩා බරැති ගඩොල් වඩා වේගයෙන් ඇද වැටුණාද?" ගැලීලියෝ තමා ඉදිරියේ තුෂ්ණිම්භූතව බලා සිටි සිසුන්ගෙන් ප්‍රශ්න කළේය. පිළිතුර "නැත" යන්න විය.



02 වන රූපයඃ ඇරිස්ටෝටල් - ග්‍රීක දාර්ශනිකවරයා

තම සිතට වදදෙන ගැටලු පිළිබඳ සිතිවිල්ලේ යෙදීමට ගැලීලියෝ එම ප්‍රදේශයේ වූ පල්ලියට යෑමට පුරුදු වී සිටියේය. පල්ලිය ආලෝකමත් කිරීම පිණිස දිගු දම්වැල්වලින් එල්ලුනු කුඩා සහ විශාල ලාම්පු එහිදී ඔහුගේ නෙත ගැටුණි. හමන සුළඟේ බලපෑම කරණ කොටගෙන එම ලාම්පු එහා මෙහා පැද්දෙමින් තිබුණි. ඒ දෙස නිහඬව බලා සිටි ගැලීලියෝ එකී පැද්දීම් පිළිබඳව තම අවධානය යොමු කළේය. ලාම්පුව කුඩා වුවද විශාල වුවද මෙම සෑම පැද්දීමකටම ගතවන කාලය කොපමණ වේදැයි දින කිහිපයක් තිස්සේ මැන බැලූ ගැලීලියෝ එක් සම්පූර්ණ චාපයක ගමන් කිරීම සඳහා සෑම විටම මෙම ලාම්පු එකම කාලයක් වැය කළ බව වටහා ගත්තේය. ගැලීලියෝ මෙම නිරීක්ෂණය, ලෝකය පිළිබඳව වසර 2000ක් පමණ පැරණි සහ ස්ථිතිකව තැබූ විශ්වාසය බිඳ දැමීය. මෙය, "පතිතවන වස්තූන් පිළිබඳ නියමය" ලෙස 1958දී ගැලීලියෝ විසින් එය ප්‍රකාශයට පත් කරන ලදී.

ගැලීලියෝගේ මෙම සොයාගැනීම, ජනතාව හා සම්බන්ධයෙන් සුසමාදර්ශ වෙනස් කිරීමක් (යම් දෙයක් පිළිබඳ



**03 වන රූපය: ලෝකය ගෝලාකාර බවට පළමුවරට ඉදිරිපත් කරන ලද පයිතගරස්**

ක්‍රියා කරන, සිතන සහ පිළිගත් ආකාරය සම්පූර්ණයෙන්ම වෙනසකට ලක්කිරීමක්) සිදු වූ බව නිරීක්ෂණය කළ හැකි විය.

## ලෝකය පිළිබඳ මිනිසුන්ගේ අදහස් වෙනස් කිරීම - සුසමාදර්ශය වෙනස් කිරීම

දාහත්වන සියවසෙහි මුල් භාගයේදී උගත්තු සියළු දෙනාම පාහේ ස්වභාවික විද්‍යාව කෙරෙහි උනන්දුවක් දැක්වූහ. නිකලස් කොපර්නිකස්, ගැලීලියෝ ගැලීලි, ජොහැන්නස් කෙප්ලර් සහ අයිසැක් නිව්ටන් 16වන සහ 17වන සියවස්වල විසූ ශ්‍රේෂ්ඨ විද්‍යාඥයන් වූ අතර සොක්‍රටීස්, ප්ලේටෝ, ඇරිස්ටෝටල් වැනි සමහර විශිෂ්ට දාර්ශනිකයන් විසින් ප්‍රකාශකර තිබූ සමහර නිරවද්‍ය නොවූ, දිගු කාලයක් තිස්සේ ස්ථාපිතව තිබූ විවිධ විශ්වාසයන් බිඳ දැමීමට ඔවුහු සමත් වූහ. එකල මිනිස්සු දාර්ශනිකයන්ගේ කියමන් විශ්ව සත්‍ය ලෙස සලකන්නට පුරුදු වී සිටියහ. පුරාණ ග්‍රීක දාර්ශනිකයකු වූ ඇරිස්ටෝටල්ගේ ලියවිලි විද්‍යාවේ පදනම ලෙස එකල විද්‍යාව ඉගෙන ගන්නා සෑම පාසල් සිසුවෙකුටම ඉගෙනීමට සිදුවිය. එනිසා, විද්‍යාඥයන් විසින් උත්පාදනය කරන ලද නව දැනුම උපකාරයෙන් ලෝකය පිළිබඳව වූ සදොස් විශ්වාසයන් තවදුරටත් ස්ථාපිත වීම වළකාලූ විද්‍යාත්මක විප්ලව වරින්වර දක්නට ලැබුණි.

ලෝකය පිළිබඳව මිනිසුන් දරන අදහස් වෙනස් කිරීමට විද්‍යාඥයන්ගේ සොයාගැනීම් උපකාර විය. ඉහත සඳහන් කරන ලද ආකාරයේ ලෝකය පිළිබඳව වටහා ගැනීම් වෙනස් කළ සුසමාදර්ශ වෙනස් කිරීම් පිළිබඳ අපි කෙටියෙන් සලකා බලමු.

- ❖ අතීතයේ ජීවත් වූ මිනිසුන් පොළොව පැතලි යයිද, පෘථිවිය වටා සූර්යයා භ්‍රමණය වන බවද (භූ කේන්ද්‍රික) සිතීමට පුරුදුවී සිටියහ.
- ❖ සමහරු සොබාදහමේ බලය භෞතික ස්පර්ශයන් මගින් පමණක් සිදුවන බව විශ්වාස කළහ.
- ❖ එකම ජීවියා විවිධ නම්වලින් හඳුන්වනු ලැබීය.
- ❖ දහනය විය හැකි ද්‍රව්‍යවල 'ෆ්ලොජිස්ටන්' නම් වූ වර්ණයක්, ගන්ධයක්, රසයක් හෝ බරක් නොමැති ද්‍රව්‍යයක් අන්තර්ගතවන බවට තවත් විශ්වාසයක් විය.
- ❖ සමහර ආගමික විශ්වාසයන් මත පදනම්ව, පෘථිවියේ වයස අවුරුදු 6000ක් වන බව විශ්වාස කළහ.
- ❖ එවැනිම වූ තවත් විශ්වාසයකට අනුව, පියවි ඇසට නොපෙනෙන යමෙකු විසින් මානවයා මවන ලද බව ජනතාවට උගන්වනු ලැබීය.



**04 වන රූපය: පෘථිවිය ඉර වටා පරිභ්‍රමණය වන බව උපකල්පනය කරන ලද නිකොලස් කොපර්නිකස්**

විද්‍යාඥයින්ගේ විශිෂ්ට වැඩකටයුතු කරණ කොටගෙන මෙම විශ්වාසයන් වෙනසකට ලක් කෙරුණි.

ක්‍රි.පූ. 500දී පමණ පෘථිවිය ගෝලාකාර බව පයිතගරස් ප්‍රකාශ කළේය. තම කක්ෂීය චක්‍රයේ ගමන් කරන විට චන්ද්‍රයාගේ ටර්මිනේටරයේ (චන්ද්‍රයාගේ ආලෝකමත් කොටස සහ අඳුරු කොටස අතර රේඛාව) හැඩය නිරීක්ෂණය කිරීම මගින් චන්ද්‍රයා ගෝලාකාර විය යුතුය යන සාධකය මත ඔහුගේ අදහස විය. චන්ද්‍රයා ගෝලාකාර නම් පෘථිවියද ගෝලාකාර විය යුතු බවට හෙතෙම හේතු ඉදිරිපත් කළේය. ඉන් පසුව, ක්‍රි.පූ.500ත් - 430ත් අතර කාලයේදී ඇනැක්සගෝරස් නම් පුද්ගලයකු සූර්යග්‍රහණ සහ චන්ද්‍රග්‍රහණවලට සත්‍ය හේතුව තීරණය කරන ලදී. එමෙන්ම, චන්ද්‍රග්‍රහණයක් සිදුවනනවිට්දී පෘථිවියේ ඡායාවේ හැඩයද පෘථිවිය ගෝලාකාර බවට සාක්ෂියක් ලෙස භාවිත කෙරුණි.

කාලාන්තරයක් තිස්සේ විද්‍යාවේ ප්‍රගතියත් සමග සුසමාදර්ශ වෙනස්කිරීම් මාලාවක් සිදුවිය. විද්‍යාත්මක අවබෝධය කාර්යක්ෂම ආකාරයට සමාජය වෙත සන්නිවේදනය කිරීම සිදුවීම මෙම වෙනස්කමට හේතු විය හැකිය. වර්ෂ 1500 සහ 1550 අතර කාලපරිච්ඡේදය තුළ පළමු සුසමාදර්ශ වෙනස් කිරීම තාරකා විද්‍යා ක්ෂේත්‍රයේ සිදුවිය. පෘථිවිය සූර්යයා වටා පරිභ්‍රමණය වන බව (සූර්ය කේන්ද්‍රීය බව)



**05 වන රූපය: ග්‍රහ චලිතය පිළිබඳව නියම 03ක් ඉදිරිපත් කරන ලද ජොහැනස් කෙප්ලර්**

සහ පෘථිවිය සූර්යග්‍රහ මණ්ඩලයේ මධ්‍යය නොවන බව (පෘථිවි කේන්ද්‍රික හෝ භූ කේන්ද්‍රික හෝ බව) නිකලස් කොපර්නිකස් උපකල්පනය කළේය.



**06 වන රූපය: සොබාදහමේ බලය භෞතික දේවල් මත පමණක්ම රඳා පවතී යන නියමය බිඳ හෙලන ලද අයිසැක් නිව්ටන්**

කොපර්නිකස් නිවැරදි බව 1550 - 1600

අතර කාලපරිච්ඡේදය තුළ ගැලීලියෝ ගැලීලි සනාථ කළේය. එමෙන්ම මෙම කාලය තුළදී හෙතෙම වසර 2000 පැරණි, පතිත වන වස්තූන් පිළිබඳ මතය බිඳ දමා 'පතිත වන වස්තූන් පිළිබඳ නියමය' ප්‍රකාශයට පත්කළේය.

වසර 1600 - 1650 අතර කාලපරිච්ඡේදය තුළදී ජොහැනස් කෙප්ලර් ග්‍රහයන්ගේ චලනය පිළිබඳ නියමයන් තුනක් සූත්‍රණය කළ අතර ග්‍රහයන් වෘත්තාකාර කක්ෂවල නොව ඉලිප්සාකාර කක්ෂවල ගමන් කරන බව ප්‍රකාශ කළේය.

අයිසැක් නිව්ටන්, "ප්‍රින්සිපල්ස් ඔෆ් මැතමැටික්ස්" නම් වූ තම ග්‍රන්ථය තුළ, සොබාදහමේ බලවේග භෞතික සට්ටනය තුළින් පමණක් ක්‍රියාත්මක වූ බවට තිබුණු විශ්වාසය බිඳ දමන ලද විශ්ව භෞතික නියමයන් ත්‍රිත්වයක් තිබුණු බව විස්තර කළේය. මෙය, ක්‍රි.ව. 1600 - 1700 අතර කාලය තුළ සිදුවූ සුසමාදර්ශ වෙනස්කමක් විය.

බාහිර ස්වරූපයෙන්, අභ්‍යන්තර ව්‍යුහයෙන්, පෝෂණ ක්‍රමයෙන්, වාසස්ථානවලින් යනාදී ලෙස එකක් තව එකකින් වෙනස්වන ශාක සහ සත්වයින් මිලියන හතරක් පහක් දක්වා ප්‍රමාණයක් පෘථිවියෙහි වසන බව ඇස්තමේන්තු කර තිබේ. එහෙයින්, වර්ගීකරණ විද්‍යාව; ජීවීන් හඳුනාගැනීම, නාමකරණය සහ වර්ගීකරණය සමග ගනුදෙනු කරන ජීව විද්‍යාවේ ශාඛාවක් ජීවයේ විවිධත්වය පිළිබඳ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. කැරොලස් ලිනේයස් සහ ඔහුගේ ශිෂ්‍යයෝ පෙර පැවති, එකම ජීවියා හඳුන්වනු ලබන බහුවිධ නාම ප්‍රතිස්ථාපනය කරමින්, අද පවා භාවිතයට ගැනෙන ජීවීන් නාමකරණය කෙරෙන ඒකාකාර ක්‍රමයක් සකස් කළහ. තවත් සුසමාදර්ශ වෙනස්කමකට මග පාදමින් වර්ෂ 1700 -1750 කාලපරිච්ඡේදය තුළදී මෙය සිදුවිය.



**07 වන රූපය: ජීවීන් නාමකරණ ධූරාවලිය හඳුන්වා දෙන ලද චාල්ස් ලිනේයස්**



**08 වන රූපය: 'ෆ්ලොජිස්ටන්' සංකල්පය බිඳ හෙලන ලද ඇන්තනී ලැවෝෂියර්**

ප්‍රංශ ජාතික රසායනඥයකු වූ ඇන්ටනි ලැවෝසියර් 1750 - 1800 කාලපරිච්ඡේදය තුළදී දහනය පිළිබඳව එවකට පැවති 'ෆ්ලොජිස්ටන් වාදය' විඛණ්ඩනය කළේය. දහනය සඳහා ඔක්සිජන් අවශ්‍ය බවත්, ද්‍රව්‍ය තුළ 'ෆ්ලොජිස්ටන්' නැමති ද්‍රව්‍යයක් නොමැති බවත් හෙතෙම පෙන්වා දුන්නේය. ෆ්ලොජිස්ටන් වාදයට අනුව දැවෙන සුළු ද්‍රව්‍ය තුළ ෆ්ලොජිස්ටන් සහ අළු අන්තර්ගතවන බවත් දක්වේ. එහෙත්, ඔක්සිජන් වාතයේ සිට පැමිණෙන අතර ද්‍රව්‍ය දහනයවනවිට එයට එකතුවන බව ලැවෝසියර්ගේ නව වාදය තුළින් කරුණු ගෙනහැර දැක්වීය.



**09 වන රූපය: ජීවීන්ගේ සම්භවය පිළිබඳව නව මතයක් ඉදිරිපත් කරන ලද චාල්ස් ඩාවින්**

එවකට පිළිගන්නා ලද පෘථිවියේ වයස වසර 6000කට වඩා වැඩි වන බව ප්‍රකාශ කරමින් හට්න්ගේ සිද්ධාන්තය 1800 - 1850 අතර කාලපරිච්ඡේදයේදී සමාජය සිතන ක්‍රමයෙහි තවත් වෙනසක් ඇති කිරීමට මග පෑදීය.

ස්වභාවික වරණය සහ පරිණාමය හා සම්බන්ධව චාර්ල්ස් ඩාවින්ගේ පර්යේෂණ (1850 - 1990) සහ ඒවා පාදක කරගෙන රචිත ඔහුගේ ග්‍රන්ථය මානව විශේෂයේ සම්භවය පිළිබඳ මිනිසුන් සිතා සිටි ආකාරයෙහි විප්ලවීය වෙනසක් සිදු කරන ලදී.

වර්ෂ 1990 - 1950 අතර යුගය, භෞතික විද්‍යාව, විශේෂයෙන් ද්‍රව්‍යවල ස්වභාවය පිළිබඳව වඩාත් අවධානය යොමුකරන ලද සමයක් විය. ද්‍රව්‍ය සහ ශක්තිය පිළිබඳව, විශේෂයෙන් ඒවා එකිනෙක බවට හුවමාරු විය හැකි බව යන අදහස් මගින් සුසමාදර්ශ වෙනස් කිරීමක් සපයන ලද සාපේක්ෂතා වාදය හේතු කොට ගෙන මෙම යුගය තුළ ඇල්බර්ට් අයින්ස්ටයින් කැපී පෙනෙන චරිතය බවට පත්විය. ද්‍රව්‍ය පිළිබඳව මෙකී වැඩිදියුණු කරන ලද දැනුම, න්‍යෂ්ටික භෞතික විද්‍යාවට පදනම සැපයූ අතර එය, පරමාණු බලශක්තිය යොදා ගැනීමට සහ න්‍යෂ්ටික බෝම්බය නිපදවීමට මග පෑදීය.



**10 වන රූපය: සාපේක්ෂතාවාදය ඉදිරිපත් කිරීම තුළින් 1900 - 1950 යුගයේ ශ්‍රේෂ්ඨතම විද්‍යාඥයා ලෙස කීර්තියට පත්වූ ඇල්බර්ට් අයින්ස්ටයින්**

ජේම්ස් වොට්සන් සහ ෆ්‍රැන්සිස් ක්‍රික් විසින් ඩී.එන්.ඒ (ඩිඔක්ස්රයිබො නියුක්ලෙයික් අම්ලය) ව්‍යුහය පහදා දීම 1950 - 2000 අතර කාලපරිච්ඡේදය තුළ සුසමාදර්ශ වෙනස් කිරීමකට හේතුවිය. අණුක ජීවවිද්‍යාවේ වැඩි දියුණුව, ජෛවතාක්ෂණයට, මානව ජීනෝම ව්‍යාපෘතියට සහ ජීවීන්ගේ පරිණාමවාදී බන්ධුතාවයකට හේතු වූ නව දර්ශනයන්ට මග පෑදීය.

ක්‍රි.පූ. 1500න් ආරම්භවී පසුගිය වසර 500ක කාලය තුළදී ඉහතින් විස්තර කර ඇති පරිදි ප්‍රධාන සුසමාදර්ශ වෙනස්කිරීම් දහයක් (10ක්) පමණ සිදුවී තිබේ. මෙම විශිෂ්ට විද්‍යාඥයින්ගේ සොයාගැනීම් මහජනතාව අතර, විශේෂයෙන් උගත් පිරිස අතර ව්‍යාප්ත කරන ලද අතර එමගින්, බොහෝ දෑ පිළිබඳව ඔවුන්ගේ සාමාන්‍ය සහ පිළිගත් චින්තන රටාව සම්පූර්ණයෙන්ම වෙනස් කිරීමට හේතු පාදක විය. මෙම දැනුම, වර්තමානයේදී, එය උත්පාදනය කෙරුණු රටට පමණක් සීමා නොවන අතර, ලොව පුරා සිටින බොහෝ උගත් පිරිස ඒ පිළිබඳව දැන සිටිති. එහෙයින්, මෙම සුසමාදර්ශ වෙනස් කිරීම් ලෝකය පිළිබඳව වඩා යහපත් අවබෝධයක් ලබාගැනීමට විද්‍යාව ප්‍රචලිතකිරීමේ අවශ්‍යතාවය පෙන්වා දෙයි.

## විද්‍යාව ප්‍රචලිතකිරීම - යුගයේ අවශ්‍යතාව

විද්‍යාව යනු ස්වභාවධර්මය හැදෑරීම, ස්වභාවිකදේවල හැසිරීම සහ ඒ පිළිබඳ අප ලබා ගන්නා දැනුමයි. වෙනත් ආකාරයකට පවසන්නේ නම්, විද්‍යාව යනු විද්‍යාත්මක ක්‍රමය භාවිතයෙන් හඳුනාගත් ගැටලු විසඳීම පිණිස සිදු කරනු ලබන ක්‍රමානුකූල අධ්‍යයනයයි. විද්‍යාඥයින් දැනුම නිර්මාණය කරන අතර එම දැනුම ජනතාව අතරට ගෙන යායුතුවේ.

විද්‍යාඥයෝ සහ පර්යේෂකයෝ විද්‍යාත්මක ක්‍රමය උපයෝගී කරගනිමින් ගැටලු විසඳීමට පර්යේෂණ සහ පරීක්ෂණ සිදු කිරීම මගින් දැනුම උත්පාදනය කරති. ඉංජිනේරුවෝ ජීවිතය පහසු කරලීම පිණිස වැඩි පහසුකම් සම්පාදනය කිරීමට ව්‍යුහමය සංවර්ධන සිදු කරති. නූතන විද්‍යාව 16වන සියවසේදී ආරම්භ වූ අතර ඉන් අනතුරුව විද්‍යා පර්යේෂණ ක්ෂේත්‍රයේ ශීඝ්‍ර වර්ධනයක් සිදුවිය. සෞඛ්‍ය තත්වය වැඩිදියුණු කිරීම මගින් ජීවිත අපේක්ෂාව ඉහළ නැංවීම, ශීඝ්‍රයෙන් ඉහළ යන ලෝක ජනගහනය පෝෂණය කිරීමට ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීම පිණිස බෝග නිෂ්පාදනය වැඩි දියුණු කිරීම, බොහොමයක් රෝග ව්‍යාධීන් පාලනය කිරීම, සහ මානව වර්ගයාට එල ප්‍රයෝජන ලබා දෙන වෙනත් බොහොමයක් විද්‍යාත්මක සොයා ගැනීම් වැනි වූ ප්‍රතිලාභ සහ ජයග්‍රහණ, විද්‍යාව මහජනතාවට දායක කර තිබේ.

නිරපේක්ෂ දරිද්‍රතාවය අඩුකර රටේ ආර්ථිකය දියුණු කිරීම උදෙසා විද්‍යාව සහ තාක්ෂණය භාවිතයට ගැනීම සිදුකිරීම අත්‍යවශ්‍යවේ. දියුණු රටවල් එම තත්වයට පත්ව ඇත්තේ ප්‍රධාන වශයෙන් එකී රටවල සංවර්ධනය සඳහා විද්‍යාව සහ තාක්ෂණය භාවිත කිරීම හේතු කොට ගෙනය. මෙම තත්වයට ළඟාවිය හැක්කේ සමස්ත ජනගහනයට විද්‍යාව සහ තාක්ෂණයෙහි නූතන සංවර්ධනය පිළිබඳ දැනුවත්භාවය ලබාදීම සහ ඒවායේ මූලික මූලධර්ම තම එදිනෙදා ජීවිතයේදී යොදා ගැනීමට මගපාදන්නේනම් පමණි. ඉහළ නංවන ලද ආහාර නිෂ්පාදනය, කාර්යක්ෂම පවුල් සංවිධානය, වැඩි දියුණු කරන ලද සනීපාරක්ෂාව සහ ස්වස්ථතාව, වඩා යහපත් පරිසරය, ජලය සහ ශක්ති සම්පත් කාර්යක්ෂම ලෙස භාවිත කිරීම, යන මේ සියල්ල සඳහා විද්‍යාත්මක දැනුම අවම වශයෙන් බිඳක් හෝ අවශ්‍යවේ. එහෙත්, මහජනතාවගෙන් විශාල කොටසක් සාක්ෂරතාවයෙන් තොර නම්, මුද්‍රිත මාධ්‍ය ඔස්සේ විද්‍යාවේ පණිවුඩය ගෙන යෑම අපහසු කාර්යයක්වේ. එවන් අවස්ථාවකදී ගුවන්විදුලිය සහ රූපවාහිනිය වැනි ඉලෙක්ට්‍රොනික මාධ්‍ය විශාල වැදගත්කමක් දරයි. හැකිතරම් ප්‍රේක්ෂක ජනතාවකට ළඟාවීම උදෙසා නිරන්තර නවෝත්පාදනමය ප්‍රවේශ මෙහිලා අවශ්‍යවේ. එහෙයින්, මහජනතාව, පාසල් ප්‍රජාව, මුද්‍රිත මාධ්‍ය සංස්කාරකවරුන්, ඉලෙක්ට්‍රොනික මාධ්‍යවල ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරු, ප්‍රතිපත්ති සකස්කරන්නන් සහ දේශපාලන නායකයින් අතර විද්‍යාව ප්‍රචලිතකිරීම ඉතාමත් වැදගත්වේ.

විද්‍යාව ප්‍රචලිතකිරීම යනු ලෝකය පිළිබඳ ජනතාවගේ අවබෝධය පුළුල්කිරීමේ අරමුණු සහිතව මහජනයා අතර විද්‍යාව සහ තාක්ෂණය ව්‍යාප්ත කිරීමයි. මෙය, 16වන ශතවර්ෂයේ මුල්භාගයේදී ඉතා අපහසුවෙන් ආරම්භ කරන ලද අතර, වර්තමානයේ එය මැනවින් ක්‍රියාවෙහි යොදවා ඇති ආකාරයක් පෙනෙන්ට තිබේ. එහෙයින්, ලෝකය යහපත් ස්ථානයක් බවට පත් කිරීමෙහිලා විද්‍යාව ප්‍රචලිතකිරීම ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරයි. විද්‍යාව ජනතාව අතර ප්‍රචලිතකිරීම සඳහා විවිධ ක්‍රම උපයෝගී කරගත හැකිය.

## ප්‍රකාශන ඔස්සේ විද්‍යාව ප්‍රචලිතකිරීම

අතීතයේදී, විද්‍යාඥයින් විසින් සිදු කරන ලද කටයුතු ග්‍රන්ථ මගින් ප්‍රකාශනය කිරීම මගින් මූලික වශයෙන් විද්‍යාව ප්‍රචලිතකිරීම ක්‍රියාවට නංවන ලදී. නිකොලස් කොපර්නිකස්ගේ (1543) "ඔන් ද රිවොලුෂන් ඔෆ් හෙවන්ලි ස්පියර්ස්"; ගැලීලියෝ ගැලීලිගේ (1632) " ඩයලොග් කන්සර්න්ස් ද ටූ චීෆ් වර්ල්ඩ් සිස්ටම්ස්"; අයිසැක් නිව්ටන්ගේ (1687) "මැතමැටිකල් ප්‍රින්සිපල්ස් ඔෆ් නැචුරල් ෆිලෝසොෆීස්"; චාර්ල්ස් ඩාවින්ගේ "ද වොයේජ් ඔෆ් ද බීගල්" (1845) සහ "ද ඔරිජින් ඔෆ් ස්පෙසීස්" (1859); මාරි කියුරිගේ (1904) "රේඩියෝ ඇක්ටිව් සබ්ස්ටන්සස්"; ඇල්බර්ට් අයින්ස්ටයින්ගේ "රිලටිවිටි: ද ස්පෙෂල් ඇන්ඩ් ජෙනරල් තියරි" (1919) සහ "අයිඩියාස් ඇන්ඩ් ඔපීනියන්ස්" (1954); ජේම්ස් ඩී. වොට්සන්ගේ "ද ඩබල් හෙලික්ස්" (1968); සහ ස්ටීවන් හොප්කින්ස්ගේ "අ බ්‍රීෆ් හිස්ටරි ඔෆ්

ටයිම්" (1988) යන ග්‍රන්ථ නව විද්‍යාත්මක දැනුම මහජනතාව අතර ව්‍යාප්ත කිරීම පිණිස විද්‍යාඥයන් විසින් රචිත ග්‍රන්ථ කිහිපයක් සඳහා නිදසුන් ලෙස පෙන්වා දිය හැකිය.




**11 වන රූපය: මුහුදු කළු වුණා - සුනාමි ව්‍යසනය අලලා රචනා වූ ළමා කෘතිය**

## ශ්‍රී ලංකාවෙහි තත්වය

මූල්‍ය සම්පාදනය කිරීම මගින් මහජනතාව අතර විද්‍යාව ප්‍රචලිතකිරීම සඳහා 1994 අංක 11 දරණ විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත මගින් බලාත්මක කරන ලද ජාතික විද්‍යා පදනම විද්‍යා ප්‍රචලිතකිරීම සඳහා පුහුණු කරන ලද කාර්යමණ්ඩලයක් සහ වෙනම අංශයක් සහිත එකම ආයතනය ලෙස මෙහිලා සඳහන් කළ යුතුය. මෙම අංශය මහජනතාව අතර විද්‍යාව ප්‍රචලිතකිරීම සඳහා මාර්ග කිහිපයක් විවර කර තිබේ.

ප්‍රකාශන ඔස්සේ විද්‍යාව ප්‍රචලිතකිරීම එවැනි එක් මාර්ග යකි. විද්‍යාත්මක තොරතුරු සහිත ළමා කතාන්දර මාලාවක්, විද්‍යාත්මක මාතෘකා සහ සංකල්ප පිළිබඳ රචිත ග්‍රන්ථක සහ ග්‍රන්ථ, භාෂා ත්‍රිත්වයෙන්ම ප්‍රකාශන කර බෙදා හැරෙන ජාතික විද්‍යා පදනම් විද්‍යා සඟරාව "විදුරාව" එවැනි ප්‍රකාශන සඳහා නිදසුන්වේ.

ජාතික විද්‍යා පදනම විසින් සිදුකරන ලද ඉල්ලීමකට අනුව 2004 වර්ෂයේදී සිදුවූ සුනාමි ව්‍යසනය පිළිබඳව සහ එවැනි ව්‍යසනවලින් මහජනතාවට මෙන්ම ඔවුන්ගේ දේපළවලට අතිවිශාල ලෙස හානි සිදුවන ආකාරය පිළිබඳව ළමුන් දැනුවත් කිරීම පිණිස ජාතික විද්‍යා පදනමේ විද්‍යාව ප්‍රචලිතකිරීමේ අංශයේ මෙහෙයවීමෙන් සුමිත්‍රා රාහුබද්ධ මහත්මිය විසින් "මුහුදු කළු වුණා" ළමා කතාව රචනා කරන ලදී. සිබිල් වෙත්තසිංහ මහත්මියගේ චිත්‍රයෙන් මෙම ළමා කතා පොත අලංකාර වූ අතර ජාතික විද්‍යා පදනම මගින් භාෂා ත්‍රිත්වයෙන්ම ප්‍රකාශනය කරන ලදී.

මෙම ළමා කතාවට 2005 වර්ෂයේ මුද්‍රිත ළමා කතා සඳහා හිමිවන රාජ්‍ය සාහිත්‍ය සම්මානය 2006දී හිමිවිය. "මුහුදු කළු වුණා" ළමා කතාන්දර පොත ජාතික විද්‍යා පදනමෙහි ලියාපදිංචි පාසල් සහ සුනාමියෙන් හානියට ලක්වූ ප්‍රදේශවල පාසල් අතර නොමිලේ බෙදා හැර තිබේ.

මේ හා සමානව, සරල භාෂාවෙන් ලියැවුණු විද්‍යා ග්‍රන්ථ සහ ග්‍රන්ථක මුද්‍රණය කර පාසැල් අතර නොමිලේ බෙදාහැරීම සිදුකරයි. ප්‍රසිද්ධ ග්‍රන්ථයක් වූ වයි. පෙරල්මාන් විසින් රචිත "මැතමැටික්ස් කැන් බී ෆන්" නැමති ග්‍රන්ථයෙහි සිංහල පරිවර්තනය වූ "ගණිත විනෝදය" පිටපත් 5000ක් මුද්‍රණය කර පාසල් අතර නොමිලේ බෙදා හැරීම එක් නිදසුනකි. එමෙන්ම, දේශීය විද්‍යාඥයින් විසින් රචිත විද්‍යා ග්‍රන්ථක මාලාවක් අඩු පහසුකම් සහිත පාසල් වෙත බෙදා හරිනු ලැබිණ.

විද්‍යාව ප්‍රචලිතකිරීම සඳහා විද්‍යා හා තාක්ෂණයට අදාළ ග්‍රන්ථ රචනා කරන කතුවරුන්ට මූල්‍යාධාර සැපයීමට මූල්‍ය ප්‍රදාන වැඩසටහනක් ජාතික විද්‍යා පදනම මගින් ආරම්භ කර තිබේ. මෙහි අරමුණ වන්නේ විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රයෝජනවත් තොරතුරු සම්පාදනයෙහිලා ග්‍රන්ථ රචනා කිරීමේ




**12 වන රූපය: ජාතික විද්‍යා පදනම මගින් විද්‍යාව ප්‍රචලිත කිරීම උදෙසා ප්‍රකාශනය වූ ග්‍රන්ථ මාලාව**

විභවයක් සහිත කතුවරුන් දිරිමත් කිරීමය. මෙහිදී, අකුරු ඇමිණීම, පිටු සැලසුම් කිරීම, පිටු සකස් කිරීම, සංස්කරණය, සෝදුපත් කියවීම, මුද්‍රණයට සුදානම් අවසන් පිටපත සැකසීම සහ මුද්‍රණය යන කටයුතු සඳහා යම් කොන්දේසිවලට යටත්ව (රු. 500,000/-ක උපරිමයක් සහ අවම මුද්‍රිත පිටපත් 200ක් සඳහා) පිරිවැය ආවරණය කිරීම සඳහා මූල්‍යාධාර සපයයි.

විද්‍යා සඟරා ප්‍රකාශනය කිරීම මුලින්ම ආරම්භ වූයේ 19වන ශතවර්ෂය තුළදීය. එම ශතවර්ෂයේ අවසාන භාගය තුළ ජනප්‍රිය විද්‍යා සඟරා සංඛ්‍යාව පුළුල් ලෙස ඉහළ ගිය බැවින් විද්‍යාව ප්‍රචලිතකිරීමෙහිලා මුද්‍රිත මාධ්‍යයෙහි බලපෑම ඉතා ඉහළ මට්ටමක් විය. විද්‍යා සඟරාවක් යනු විද්‍යාව පිළිබඳ ප්‍රතිපත්ති, තොරතුරු සහ වාර්තා අන්තර්ගත, සාමාන්‍යයෙන් විශේෂඥයින් නොවන පාඨක සමූහයක් සඳහා ලියැවුණු වාර සංග්‍රහයකි.




13 වන රූපයඃ විදුරාව (විද්‍යා සඟරාව) - මංගල කලාපය

(මේ හා සසඳන විට, මූලික පර්යේෂණ සහ / හෝ විමර්ශන සාමාන්‍යයෙන් අන්තර්ගතවන විද්‍යාත්මක ක්ෂේත්‍රයේ විශේෂඥයින් විසින් ලියන ලද ප්‍රකාශකයන් අනතර්ගත ප්‍රකාශනයක් "විද්‍යා වාරසඟරාවක්" හෙවත් ජර්නලයක් ලෙස හැඳින්වේ). විද්‍යා සඟරා පරිශීලනය කිරීම විද්‍යාඥයින් නොවන පිරිසක් මෙන්ම තම විශේෂඥ ක්ෂේත්‍රයට පරිබාහිර වෙනත් ක්ෂේත්‍රයක තොරතුරු ලබා ගැනීම සඳහා විද්‍යාඥයින් විසින් සිදු කරනු ලැබේ. විද්‍යාව සහ පොදුජනතාව අතර ඇති හිදැස පියවීම සඳහා ප්‍රකාශනය කරනු ලබන "සයන්ස්", "සයන්ටිෆික් ඇමරිකන්", "නිව් සයන්ටිස්ට්ස්" යන සඟරා ලෝ පතළ විද්‍යා සඟරාවලට නිදසුන් ලෙස පෙන්වා දිය හැකිය. ශ්‍රී ලාංකීය ජනතාවගේ විද්‍යාත්මක තොරතුරු අවශ්‍යතාවය සපුරාලමින් ජාතික විද්‍යා පදනම (එවකට ජාතික විද්‍යා සභාව) "විදුරාව විද්‍යා බුලටිනය" ප්‍රකාශනය කිරීම 1976 වර්ෂයේදී ආරම්භ කරන ලදී. පසු අවධියක දී එය "විදුරාව විද්‍යා සඟරාව" ලෙස නැවත නම් කරන ලද අතර ස්වභාෂාවෙන් විද්‍යාව ප්‍රචලිතකිරීමේ අවශ්‍යතාවයද සපුරාලමින් භාෂා ත්‍රිත්වයෙන්ම (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි) මුද්‍රණය කිරීමට පියවර ගෙන ඇත. වර්ෂ 2017 වනතෙක් මෙම විද්‍යා සඟරාව වසරකට තෙවරක් (ජනවාරි, ජූනි සහ නොවැම්බර්) ප්‍රකාශනය කරන ලද අතර 2018 වර්ෂයේ සිට ත්‍රෛමාසික සඟරාවක් ලෙස මුද්‍රණය කිරීම ආරම්භ කෙරුණි.

ජාතික විද්‍යා පදනමෙහි විද්‍යාව ප්‍රචලිතකිරීම පිළිබඳ ක්‍රියාකාරී කමිටුව මගින් හඳුනා ගන්නා ලද වර්තමානයට ගැලපෙන විද්‍යාත්මක තේමාවක් යටතේ විදුරාව ප්‍රකාශනය කෙරෙන අතර, එකී තේමාව යටතේ විද්‍යාඥයින්ට, පර්යේෂකයින්ට, සහ අදාළ ක්ෂේත්‍රවල විශේෂඥයින්ට ජාතික විද්‍යා පදනම විසින් සපයන ලද මාතෘකා යටතේ ලිපි සැපයීමට මෙහිදී ආරාධනය කෙරේ.

මෙම සඟරාවේ සෑම කලාපයක්ම ජාතික විද්‍යා පදනමෙහි පාර්ශවකරුවන් අතර නොමිලයේ බෙදා හරිනු ලැබේ. ජාතික විද්‍යා පදනමෙහි ලියාපදිංචි පාඨශාලීය විද්‍යා සමාජ (903ක්), විද්‍යාතා මධ්‍යස්ථාන (240ක්), විශ්වවිද්‍යාලයීය විද්‍යා සමාජ (49ක්), විශ්ව විද්‍යාලයීය විද්‍යා පීඨ පුස්තකාල (29ක්), පළාත් විද්‍යා සම්බන්ධීකාරවරුන් (09ක්) සහ කලාප විද්‍යා අධ්‍යක්ෂවරුන් (98ක්) අතර මෙලෙස විදුරාව සඟරාව බෙදා හරිනු ලැබේ. මේ අනුව, පාර්ශ්වකරුවන් 1328ක් සඳහා මෙම ප්‍රතිලාභය වාර්ෂිකව ලැබෙන අතර (14 වන රූපය), ජාතික විද්‍යා පදනම සමග ලියාපදිංචි වන විද්‍යා සමාජ සංඛ්‍යාව මත මෙම ප්‍රමාණය ඉහළ යනු ඇත.

## ඵලදායක විද්‍යා සන්නිවේදනයක් සඳහා විද්‍යා ප්‍රචාරකයින්

පෙර කාලයේ, විද්‍යාඥයන් තමන් විසින්ම තම විද්‍යාත්මක කටයුතු මහජනතාව අතර ප්‍රසිද්ධියට පත් කිරීම සහ සන්නිවේදනය කිරීම සිදුකරන ලදී. අනතුරුව, විශේෂයෙන් දෙවන ලෝක යුද්ධයට පසුව, විද්‍යා ප්‍රචාරකයින් ලෙස විද්‍යාඥයන් සිදු කළ කාර්යභාරය වෘත්තීය විද්‍යා සන්නිවේචකයින් මගින් ප්‍රතිස්ථාපනය කිරීම සිදුවිය. කෙසේවෙතත්, විද්‍යාව සහ මහජනතාව අතර දැනුම් පරතරය පියවීම සඳහා ප්‍රමාණවත් පුහුණු විද්‍යා සන්නිවේදකයින් සංඛ්‍යාවේ හිඟයක් තවමත් පවතින බවක් පෙනෙන්නට තිබේ. (අප රටේ මෙන්ම ලෝකයේ වෙනත් රටවලද ප්‍රවීණ විද්‍යා සන්නිවේදකයින් සිටින්නේ අල්ප සංඛ්‍යාවකි). මෙම අවශ්‍යතාවය හඳුනා ගත් ජාතික විද්‍යා පදනම, පුහුණු විද්‍යා සන්නිවේදක කිටුවක් සඳහා

දේශීය විද්‍යාඥයන් පුහුණු කිරීමේ අරමුණ සහිතව තෙදින වැඩමුළුවක්, සංවිධානය කරන්නට යෙදිනි. මෙම වැඩමුළුවෙහි සම්පත්දායකයින් ලෙස කටයුතු කිරීමට ඉන්දියාවේ විශිෂ්ට ගණයේ විද්‍යා සන්නිවේදකයින් දෙදෙනෙකු වන මහාචාර්ය බාලසුබ්‍රමනියම් සහ ආචාර්ය බාල් ෆොන්ඩ්කේ සහභාගි වූහ. වර්ෂ 2005දී මෙම වැඩමුළුව පවත්වන ලද අතර, එහිදී විද්‍යා සන්නිවේදකයින් පුහුණු කරන්නන් ලෙස දේශීය විද්‍යාඥයින් 30 දෙනෙකුට පුහුණුව ලබාදෙන ලදී. ඉන්පසුව, ලුණුවිල (පොල් පර්යේෂණ ආයතනය), මහනුවර (ජාතික මූලික අධ්‍යයන ආයතනය), අනුරාධපුරය (රජරට විශ්වවිද්‍යාලය) සහ කුලියාපිටිය (වයඹ විශ්වවිද්‍යාලය) යන ස්ථානවල පුහුණු වැඩමුළු මාලාවක් සංවිධානය කරන ලද අතර එමගින් අපේක්ෂිත ඉලක්කය සපුරා ගන්නා ලදී. විද්‍යාත්මක ප්‍රජාව සඳහා විද්‍යාත්මක සන්නිවේදනය පිළිබඳව වැඩමුළු සංවිධානය කිරීම ජාතික විද්‍යා පදනම අඛණ්ඩව සිදු කරනු ඇත.

## විද්‍යාව ප්‍රචලිතකිරීම සඳහා මාර්ගයක් ලෙස විශ්වවිද්‍යාලයීය විද්‍යා සමාජ යොදාගැනීම

විද්‍යාව උගන්වනු ලබන විශිෂ්ට මධ්‍යස්ථාන ලෙස විශ්වවිද්‍යාලවල විද්‍යා පීඨ හඳුන්වා දිය හැකිය. මෙහිදී විද්‍යාවේ විවිධ විෂයපථ යටතේ උපාධි අපේක්ෂකයෝ දැනුම ලබති. ඔවුන් විසින් "තාරකා විද්‍යා සමාජය", "සත්ව විද්‍යා සමාජය", "බොට්-සොක්" වැනි විවිධ විද්‍යා සමාජ පිහිටුවනු ලැබ ඇත. මෙම විද්‍යා සමාජ ඔස්සේ විද්‍යාව ප්‍රචලිතකිරීම අරමුණු කරගෙන ජාතික විද්‍යා සමාජ ලෙස ඒවා ලියාපදිංචි කර තිබේ. වර්තමානයේ මෙවැනි සමාජ 49ක් ජාතික විද්‍යා පදනම සමග ලියාපදිංචි වී තිබේ. මෙම විද්‍යා සමාජ සඳහා පදනම මගින් විවිධ වැඩමුළු සහ තරඟ සංවිධානය කර තිබේ.

## විද්‍යාව ප්‍රචලිතකිරීම සඳහා පාසල් ප්‍රජාව භාවිත කිරීම

සංවර්ධනය වෙමින් පවතින රටවල, විද්‍යා සංගම් / විද්‍යා සමාජ පාසල් ප්‍රජාව අතර සහ මහජනතාව වෙත විද්‍යාව ප්‍රචලිතකිරීමේ ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරයි. විද්‍යාත්මක කටයුතුවල නියැලීම සඳහා පාසැල් වෙත උපකාර කිරීම පිණිස, ජාතික විද්‍යා පදනම 2005 වර්ෂයේ දී විශේෂ වැඩසටහනක් (පාඨශාලීය විද්‍යා සමාජ වැඩසටහන) ආරම්භ කළාය. පාඨශාලීය විද්‍යා සමාජ ජාතික විද්‍යා පදනමෙහි ලියාපදිංචි කිරීමට, එමගින් විද්‍යා හා තාක්ෂණයෙහි විවිධ ක්ෂේත්‍රවල සිදුවන නවීනතම සංවර්ධනයන් පිළිබඳ දැනුම ලබාගැනීමට පහසුකම් සැපයීමට සහ එම විද්‍යාත්මක දැනුම එදිනෙදා කටයුතුවලදී යොදාගැනීම පිළිබඳව දැනුවත් කිරීම මෙම වැඩසටහනෙහි ප්‍රධාන අරමුණු වේ. පළමුවෙන්ම, 1AB වර්ගයේ පාසල් (අපොස උ/පෙළ සඳහා විද්‍යා විෂය මාලාව උගන්වනු ලබන පාසල්) 2005 වර්ෂය තුළ ලියාපදිංචි කරන ලද අතර (එකල තිබූ 1AB පාසල් 625ක් අතරින් 134ක් ලියාපදිංචි විය), අනතුරුව II වර්ගයට (Type II) අයත් පාසල් (අපොස උ/පෙළ සඳහා විද්‍යාව හැර කලා සහ වාණිජ විෂයයන් උගන්වන පාසල්) සහ 1C වර්ගයේ පාසල් (අපොස සා/පෙළ දක්වා පන්ති සහිත පාසල්) සඳහාද ලියාපදිංචි වීමට පසුකම් සලසන ලදී. මේ වර්ෂයේ ජූනි 30 වනවිට ජාතික විද්‍යා පදනම සමග ලියාපදිංචි වී තිබුණු පාඨශාලීය විද්‍යා සමාජ සම්පූර්ණ සංඛ්‍යාව 903ක් විය. මෙලෙස ලියාපදිංචි වූ පාසල් 903 අතරින් 51.3%ක් (463ක්) 1AB වර්ගයේ පාසල් විය.

පාසල තුළ සහ ඉන් පිටත විද්‍යාව ප්‍රචලිතකිරීමට සහ විද්‍යාව ප්‍රවර්ධනය කිරීමට මෙම විද්‍යා සමාජවලට උපකාර කිරීම ජාතික විද්‍යා පදනම මගින් සිදු කෙරේ. පාසල් විද්‍යා දින සහ අනෙකුත් විද්‍යාත්මක කටයුතු සඳහා දේශීය විද්‍යාඥයින්ගේ සේවය ලබා ගැනීමට හැකිවීම (මේ සඳහා ජාතික විද්‍යා පදනම වියදම් දරයි), විදුරාව විද්‍යා සඟරාව නොමිලයේ ලබා ගැනීමට හැකිවීම, මෙම විද්‍යා සමාජවලට ලැබෙන ප්‍රධාන ප්‍රතිලාභවේ. එමෙන්ම, ජාතික විද්‍යා පදනම මගින් සංවිධානය කරනු ලබන තරඟ අන්තර් පාඨශාලීය විද්‍යා සමාජ තරඟාවලිය, විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරඟය, ශ්‍රී ලංකා විද්‍යා හා ඉංජිනේරු සංදර්ශනය, සහ ඉන්ටෙල් ජාත්‍යන්තර




**14 වන රූපය: 2017 වර්ෂයේ විදුරාව සඟරාව විවිධ ආයතන සඳහා බෙදාහැරීම**

විද්‍යා හා ඉංජිනේරු සංදර්ශනය) සහ විද්‍යා වැඩසටහන් (ජාතික විද්‍යා පදනම් පාඨශාලීය විද්‍යා දිනය, වැඩමුළු යනාදිය) සඳහා සහභාගිවීමේ අවස්ථාව මෙම විද්‍යා සමාජවලට හිමිවේ. තවදුරටත්, මෙම පාසල්වල විද්‍යාව ප්‍රචලිතකිරීමේ සහ විද්‍යාව ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් සඳහා මූල්‍යමය සහයෝගය ලබා ගැනීමට ඉඩ ප්‍රස්ථාව සපයා ඇත. මෙම පහසුකම විද්‍යා අධ්‍යාපන සහ විද්‍යාව ප්‍රචලිතකිරීමේ වැඩසටහන් සඳහා වූ ප්‍රදාන යෝජනා ක්‍රමය යටතේ ලබාදේ. විදේශීය විද්‍යා අධ්‍යාපන වැඩසටහන් ප්‍රදාන යෝජනා ක්‍රමය යටතේ ජාත්‍යන්තර විද්‍යා වැඩසටහන් සහ ජාත්‍යන්තර තරඟ සඳහා සහභාගි වීමේ අවස්ථාව ඔවුනට හිමිවේ. ජාතික විද්‍යා පදනමෙහි ලියාපදිංචි වීම සඳහා උනන්දුවක් දක්වන පාසල්වලට ඒ සඳහා ආරාධනා කෙරෙන අතර විද්‍යා පදනමෙහි අධ්‍යක්ෂ ජනරාල් වෙත නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයක් (ජාතික විද්‍යා පදනමේ වෙබ් අඩවියෙන් බාගත කර ගත හැකිය) එවීමෙන් ලියාපදිංචිය නොමිලයේ ලබා ගත හැකිය.

මෙලෙස ජාතික විද්‍යා සමග ලියාපදිංචි වී තිබෙන පාසල් අතරින් ඉහළම කාර්යසාධනය පෙන්නුම් කරන පාඨශාලීය විද්‍යා සමාජ සඳහා වාර්ෂිකව "තරු සම්මාන"ප්‍රධානය කරන අතර එම පාසල් ජාතික විද්‍යා පදනමේ පාඨශාලීය විද්‍යා දින වැඩසටහනේදී සම්මාන, සහතික පත්‍ර සහ මුදල් ත්‍යාග ලබා දීම මගින් ඇගයීමට ලක් කෙරේ.

## විද්‍යා අධ්‍යාපන සහ ප්‍රචලිතකිරීමේ වැඩසටහන් (SEPP) ප්‍රදාන යෝජනා ක්‍රමය

වර්ෂ 2016දී ආරම්භ කරන ලද මෙම යෝජනා ක්‍රමය විද්‍යාව ප්‍රචලිතකිරීම සහ විද්‍යා අධ්‍යාපන වැඩසටහන් සංවිධානය කිරීම සඳහා පාසල්වලට සහ විශ්වවිද්‍යාල විද්‍යා සමාජවලට මූල්‍යාධාර ලබා දෙන අතර එය කාණ්ඩ දෙකක් යටතේ ක්‍රියාත්මක කරයි. විද්‍යාව ප්‍රචලිතකිරීමේ වැඩසටහන් උදෙසා රු. 200,000/-ක උපරිමයක් දක්වාද විද්‍යා අධ්‍යාපන කටයුතු සඳහා රු. 1,000,000/-ක උපරිමයක් දක්වාද මූල්‍යාධාර සපයයි.

## විදේශීය විද්‍යා අධ්‍යාපන වැඩසටහන් (OSEP) ප්‍රදාන යෝජනා ක්‍රමය

නූතන ලෝකයේ අභියෝගවලට මුහුණ දීම සඳහා නූතන විද්‍යාව, තාක්ෂණය, පර්යේෂණ සහ නවෝත්පාදනවල නව ප්‍රවණතා පිළිබඳ ජාත්‍යන්තර නිරාවරණයක් ශ්‍රී ලාංකීය පාසල් දරුවන්, ගුරුවරුන් සහ උපාධි අපේක්ෂකයින්ට ලබාදීම මගින් ඉහත සඳහන් ක්ෂේත්‍ර හා සම්බන්ධ ඔවුන්ගේ දැනුම් සම්භාරය වැඩිදියුණු කිරීම මෙම වැඩසටහනෙහි අරමුණුවේ. මෙම යෝජනා ක්‍රමය යටතේ එක් අයෙකුට රු. 200,000/-ක උපරිමයකට යටත්ව මූල්‍යාධාර සපයයි.

## විද්‍යාව ප්‍රචලිතකිරීම උදෙසා වඩා ඵලදායී ක්‍රම

තොරතුරු තාක්ෂණය, අන්තර්ජාලිතාංග, ජංගම දුරකථන යනාදී නූතන තාක්ෂණය භාවිතය විද්‍යාව ප්‍රචලිතකිරීමේ වර්තමාන ප්‍රවණතාවයයි. විද්‍යා ප්‍රබන්ධ, විද්‍යා චිත්‍රපටි, රූපවාහිනී වැඩසටහන් යනාදියද මෙහිදී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

වර්ෂ 2004දී සුනාමිය මගින් ඇති කරන ලද මහා ව්‍යසනයට අනුගාමී ලෙස ජාතික විද්‍යා පදනම මහජනතාවට තම එදිනෙදා ජීවිතයේදී දැන උගත් තීරණ ගැනීමේ හැකියාව ලබාදීම පිණිස ස්වභාවික විපත් සහ වෙනත් විද්‍යාත්මක ගැටලු පිළිබඳව දැනුවත්භාවය ලබාදීමට සැලසුම් සකස් කළාය. ඒ අනුව, විද්‍යාත්මක මාතෘකා පිළිබඳව කෙටි වීඩියෝ වැඩසටහන් මාලාවක් අවධි දෙකක් යටතේ නිෂ්පාදනය කර ඒවායේ විද්‍යාත්මක පණිවුඩය ජනතාව වෙත ගෙන යෑමට තෝරාගත් ජාතික රූපවාහිනී නාලිකා (ස්වාධීන රූපවාහිනී සේවය, රූපවාහිනිය/ අයි නාලිකාව) ඔස්සේ ප්‍රචාරය කිරීමට කටයුතු යෙදිණි.

මෙම වීඩියෝ වැඩසටහන් මාලාව "මිහිමඬල" ලෙස නම් කරන ලද අතර පළමු අවධිය යටතේ භාෂා ත්‍රිත්වයෙන්ම වැඩසටහන් 13ක්ද දෙවන අවධිය යටතේ භාෂා ත්‍රිත්වයෙන්ම වැඩසටහන් 15ක්ද නිෂ්පාදනය කරන ලදී. දෙවන අවධිය යටතේ නිෂ්පාදිත වැඩසටහන් රූපවාහිනී නාලිකාව (සිංහල සංස්කරණය), නේත්‍රා නාලිකාව (දෙමළ සංස්කරණය) සහ අයි නාලිකාව (ඉංග්‍රීසි සංස්කරණය) ඔස්සේ විකාශනය කෙරිණ.

පළමු අවධිය යටතේ නිෂ්පාදිත මිහිමඬල වැඩසටහන් මාලාව අතිශය සාර්ථක වූ අතර එයට, තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය; ICTA මගින් පිරිනැමෙන 'ඉ - ස්වාභිමාන' විශේෂ කුසලතා සම්මානය සහ ඉන්දියාවේ නවදිල්ලි නගරයේ ඩිජිටල් එම්පවර්මන්ට් ෆවුන්ඩේෂන් මගින් පිරිනැමෙන "මන්තන්" දකුණු ආසියානු අන්තර්ජාතික සම්මානය ද 2011 වර්ෂයේදී හිමිවිය.

මෙහිදී සඳහන් කළ යුතු විශේෂ කරුණක් වන්නේ ජාතික විද්‍යා පදනමෙහි ඉතිහාසය තුළ ජාත්‍යන්තර සම්මානයකින් පිදුම් ලද පළමු වැඩසටහන ලෙස 'මිහිමඬල' එහි ඉතිහාසයට එක් වන බවයි.

තරඟ ඔස්සේ මහජනතාව වෙතට විද්‍යාව ගෙන යෑම බොහෝ රටවල් විවිධ ආකාරයේ විද්‍යා තරඟ පවත්වයි. නිදසුන් ලෙස, ඉන්ටෙල් ජාත්‍යන්තර විද්‍යා හා ඉංජිනේරු සංදර්ශනය, ගූගල් විද්‍යා සංදර්ශනය, ජාත්‍යන්තර බයෝජිනියස් අභියෝගය, MIT THINK විද්‍යාඥයන්ගේ වැඩසටහන යනාදී ලෝකයේ වඩාත් ගෞරවාන්විත විද්‍යා තරඟ මෙහිලා දැක්විය හැකිය. ජාතික විද්‍යා පදනමද තවත් පාර්ශවකරුවන් තිදෙනෙකු සමග එක්ව ශ්‍රී ලංකා විද්‍යා හා ඉංජිනේරු සංදර්ශනය (SLSEF) 2008 වර්ෂයේදී ආරම්භ කරන්නට යෙදුණු අතර එය ඉන්ටෙල් ජාත්‍යන්තර විද්‍යා හා ඉංජිනේරු සංදර්ශනයෙහි අනුබද්ධ ජාතික තරඟය ලෙස ක්‍රියාත්මකවේ.

මෙහිදී, ජාතික විද්‍යා පදනම මගින් සංවිධානය කරනු ලබන විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරඟයෙන් තොරාගනු ලබන ප්‍රමුඛතම ව්‍යාපෘති දහය සමග ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය සංවිධානය කරන වසරේ කනිෂ්ඨ නවනිර්මාණකරු තරඟයේ ප්‍රමුඛතම නවෝත්පාදකයින් දසදෙනා තරඟ වැදීමට වේදිකාවක් සපයයි. මෙම තරඟයෙන් ජය ගන්නා ව්‍යාපෘති තුන ඇමරිකාවේ පැවැත්වෙන (විශේෂ සම්මානය, ඇ.එ.ජ. ඩොලර් 1000/-, ඇරිසෝනා, 2016), දෙහිවල, එස් ද එස් ජයසිංහ මහා විද්‍යාලයේ ෂෙහාන් කවිශ්ක සහ සංකල්ප පෙරේරා (විශේෂ සම්මානය - ඇ.එ.ජ. ඩොලර් 1000/- සහ විශිෂ්ට සම්මාන - සිව්වැනි ස්ථානය - ඇ.එ.ජ. ඩොලර් 500/-, ලොස් ඇන්ජලීස්, 2017) සහ හලාවත, ආනන්ද ජාතික පාසලේ කේ.කේ.ආර් ඉඳුවර (විශිෂ්ට සම්මානය - තුන්වන ස්ථානය, ඇ.එ.ජ. ඩොලර් කිරීම සිදු කරයි. කෙටි විද්‍යා නාට්‍ය, විද්‍යාඥයකුගේ චරිතය ප්‍රකාශ කරන භූමිකා රංගනය, විරිඳු, හස්තමය පෝස්ටර්, ඩිජිටල් කතාන්දරකරණය, විද්‍යා රචනා මෙම තරඟාවලියේ තරඟ අංශවේ. මෙම සෑම අංගයක් සඳහාම සූදානම් වීම උදෙසා සිසුහු අදාළ තේමාව යටතේ තොරතුරු රැස් කිරීම පිණිස විද්‍යා පොත පත පරිශීලනය කිරීම, අන්තර්ජාලය ඔස්සේ සෙවුම් කිරීම, ගුරුවරුන් සමග සාකච්ඡා කිරීම







**15 වන රූපය: මිහිමඬල පළමු අදියර (2011), 'ඉ' - ස්වාභිමානී' විශේෂ කුසලතා සම්මානය සහ දකුණු ආසියාවේ "මන්තන්" සම්මානය යන ජයග්‍රහණය හිමිකර ගැනින.**

ඉන්ටෙල් ජාත්‍යන්තර විද්‍යා හා ඉංජිනේරු සංදර්ශනයට සහභාගි වීමේ වරම් ලබයි.

මෙලෙස ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ජාත්‍යන්තරය ජයගත් ජයග්‍රාහකයන් අතර ජාතික විද්‍යා පදනමෙහි විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරඟය ඔස්සේ පුහුණු කරන ලද මාදම්පේ, සේනානායක ජාතික පාසලේ ලෝචන පියුමන්ත ප්‍රනාන්දු 1000/-, පිට්ස්බර්ග්, 2018) යන සිසුන් ශ්‍රී ලංකාවට කීර්තිය ගෙන ඒමට සමත් විය.

ජාතික විද්‍යා පදනම සමග සම්බන්ධ පාඨශාලීය විද්‍යා සමාජ සක්‍රීයව තබා ගැනීමේ අරමුණු ඇතිව එම විද්‍යා සමාජ අතර 2006 වර්ෂයේ සිට වාර්ෂිකව, ජාතික විද්‍යා පදනම් පාඨශාලීය විද්‍යා දිනයේ තේමාව යටතේ තරඟාවලියක් සංවිධානය සිදු කරති. සෑම පාසැලක්ම පාහේ මෙම තරඟ ජයග්‍රහණය කිරීම සඳහා විද්‍යා ගුරුවරයා, නාට්‍ය ගුරුවරයා සහ සංගීත ගුරුවරයා සමග එක්ව සාමූහික උත්සාහයක යෙදෙයි. මෙම සෑම තරඟ කාණ්ඩයක්ම තේමාව අදාළ විද්‍යාත්මක පණිවුඩයක් සමාජය වෙත යවයි. මෙය, විද්‍යාව සහ කලාව එකට මිශ්‍ර කිරීමක් ලෙසද දැක්විය හැකිය. දශකයකට මදක් වැඩි කාලයක් තිස්සේ මෙම තරඟාවලිය ජාතික



ලෝචන



ශෙහාන් සහ සංකල්ප



ඉදුවර

**16 වන රූපයඃ විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරඟාවලිය යටතේ ජාත්‍යන්තර ජයග්‍රහණ ලබාගනිමින් ලංකාවට කීර්තියට පත්කළ සිසුන්**

විද්‍යා පදනම මගින් සංවිධානය කරන්නට යෙදුණු අතර එමගින් පාසල් සිසුන්ට සහ ගුරුවරුන්ට පොත් මතම කල්ගතකිරීමේ මානසිකත්වයෙන් දුරස්ව කටයුතු කිරීමේ අවස්ථා සැපයීමක්ද සිදු කෙරේ.

කාර්යසාධනයෙන් ඉහළ පාඨශාලීය විද්‍යා සමාජවල කොඳුනාරටිය වූයේ එම සමාජ භාරව කටයුතු කරන ගුරුවරුන්ය. විද්‍යාත්මක කටයුතු සඳහා ඔවුන්ගේ අඛණ්ඩ සහභාගිත්වය දිරිමත් කිරීම පිණිස "විද්‍යාව ප්‍රවර්ධනය සඳහා වූ ජාතික විද්‍යා පදනම් සම්මානය", විද්‍යා පදනම මගින් හඳුන්වා දෙනු ලැබූ අතර මෙම සම්මානය සඳහා තරඟයක්, අන්තර් පාඨශාලීය විද්‍යා සමාජ තරඟාවලියට සමාන්තරව සංවිධානය කෙරේ. අදාළ කාලයේදී මෙම තරඟය පිළිබඳව පාසල්වල විදුහල්පතිවරුන් දැනුවත් කිරීම සිදු කෙරේ. ජයග්‍රාහී ගුරුවරුන් ජාතික විද්‍යා පදනම් පාඨශාලීය විද්‍යා දිනයේදී සම්මාන, සහතිකපත්‍ර සහ මුදල් ත්‍යාග පිරිනැමීම මගින් ඇගයීමට ලක් කෙරේ.

මහජනතාව අතර විද්‍යාව ප්‍රචලිතකිරීම උදෙසා පිදෙන තවත් ගෞරවනීය සම්මානයක් ජාතික විද්‍යා පදනම මගින් සංවිධානය කරනු ලබයි. එය "මහජනතාව අතර විද්‍යාව ප්‍රචලිතකිරීම උදෙසා වූ මහාචාර්ය එම්.ටී.එම් ජිෆ්රි අනුස්මරණ සම්මානය" ලෙස නම් කර ඇත (ජාතික විද්‍යා පදනමේ විද්‍යාව ප්‍රචලිතකිරීමේ කමිටුවේ සභාපතිවරයෙකු ලෙස කටයුතු කරමින්, මෙම විද්‍යා දින තරඟ ආරම්භය සඳහා පුරෝගිමීවූ අභාවප්‍රාප්ත මහාචාර්ය එ. ටී. එම්. ජිෆ්රි මහතාට ගරුකිරීමක් ලෙස මෙම විද්‍යා ව්‍යාපෘති සම්මානය එතුමා නමින් නම් කර ඇත). කාල් සේගන් සම්මානය (විද්‍යාඥයින් සඳහා), යුනෙස්කෝ කාලිංග සම්මානය (විද්‍යාව ප්‍රචලිතකිරීම සිදු කරන ඕනෑම අයෙකුට) වැනි වූ (විද්‍යාව ප්‍රචලිතකිරීම සඳහා පිරිනැමෙන ගෞරවනීය ජාත්‍යන්තර සම්මාන ලොව තිබේ. විද්‍යාව ප්‍රචලිතකිරීමට දායක වන ඕනෑම ශ්‍රී ලාංකික පුරවැසියකු සඳහා මෙම මහචාර්ය ජිෆ්රි සම්මානය විවෘතවන අතර වාර්ෂිකව එක් පුද්ගලයකුට එක් වරක් පමණක් පිරිනමනු ලබන රු. 100,000/-ක මූල්‍ය ත්‍යාගයකින් මෙය සමන්විතවේ.

ශ්‍රී ලාංකීය පුරවැසියන් වෙත විද්‍යාව ප්‍රචලිතකිරීමේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ජාතික විද්‍යා පදනම කේන්ද්‍රීය ලක්ෂ්‍යයක් ලෙස කටයුතු කරමින් එකී අරමුණු සඳහා දායකවන වැඩසටහන්වලට මූල්‍යමය දායකත්වයක් සපයමින් ඉතා විශාල කාර්යභාරයක් ඉටු කරයි.



ජාතික විද්‍යා පදනම
විද්‍යාව ප්‍රචලිතකිරීමේ අංශය
අංශ ප්‍රධානි
**කේ. ජී. ජනක කරුණාසේන**
janak@nsf.gov.lk
0714491582



# ලොව ජය ගැනීමට තාක්ෂණවිද්‍යාත්මක කුසලතා

ජේ. පී. ශාන්ත සිරි



තාක්ෂණවිද්‍යාව සමාජ ආර්ථික සංවර්ධනයක ප්‍රමුඛ අවශ්‍යතාවයකි. රටක ආර්ථික සංවර්ධනය සඳහාවන අත්‍යවශ්‍යම සාධකය ලෙස තාක්ෂණවිද්‍යාව සැලකීමට පුළුවන අතීතයේ දී සිදුවූ අනුක්‍රමික තාක්ෂණිකමය ජයග්‍රහණ හා නවෝත්පාදන, සංවර්ධනය වෙමින් පවතින රටවල සංවර්ධනය කෙරෙහි දායක වී ඇත. තාක්ෂණවිද්‍යා වේදිකාව මත සිදුවන, සිවුවන තාක්ෂණවිද්‍යාත්මක විප්ලවය, සංඛ්‍යාංක (ඩිජිටල්), භෞතික සහ ජෛව විද්‍යාත්මක තාක්ෂණ එක්වීම හේතුකොට, විවිධ ආකාරයන්හී තාක්ෂණවිද්‍යා හෝ බහු ශික්ෂණ හෝ මගින් නිරූපණය වනු ඇත. එහෙයින් අනෙක් රටවල් අබිබවා පෙරමුණට ඒමට සමත් වනු ඇත්තේ නව තාක්ෂණවිද්‍යාව කාවද්දා ගැනීම සහ තාක්ෂණවිද්‍යාත්මක විප්ලවයෙන් ප්‍රයෝජන ගැනීමට සූදානම් වූ රටවලට පමණකි.

මෙසමයේදී තාක්ෂණවිද්‍යාව ගෝලීයකරණය සහ තරඟකාරිත්වයේ අත්‍යවශ්‍ය මූලයකි. එය රටවල්වලට, සමාගම්වලට සහ පුද්ගලයන්ට ධන සම්පත් සහ සශ්‍රීකත්වය උරුම කරදෙයි. විවිධ විෂයයන් යටතේ සිදුකළ අධ්‍යයනයන් පෙන්වා දී ඇත්තේ තාක්ෂණවිද්‍යාත්මක ප්‍රගතියත් ආර්ථික වර්ධනයත් අතර ධනාත්මක සහසම්බන්ධනයක් පවතින බවය. රොබට් ෂෝට අනුව එක්සත් ජනපද ආර්ථික වර්ධනයෙන් 2/3කම වගකීම තාක්ෂණවිද්‍යාත්මක වෙනස මත පැවරෙන බවයි. ලෝක ආර්ථික සංසදය විසින් ප්‍රකාශයට පත් කර ඇති "ගෝලීය තරඟකාරීත්ව දර්ශකය" පිළියෙළ කිරීමට යොදාගත හැකි කුළුණු 12න් 3ක් වන්නේ උසස් අධ්‍යාපනය හා පුහුණුව, තාක්ෂණවිද්‍යාත්මක සූදානම් සහිත බව සහ නවෝත්පාදනය වෙයි. ගෝලීය වශයෙන් තරඟ කාරී ජාතියක් බවට පත්වීමට නම් තාක්ෂණවිද්‍යාත්මක කුසලතා, නවෝත්පාදන හා තාක්ෂණවිද්‍යාත්මක විචිත්‍රික බව පැවතීමේ වැදගත්කම මෙමගින් පෙන්වාදෙයි.

දියුණුවෙමින් පවතින ආර්ථික පවතින (බ්‍රික්එම් - BRICM) රටවල් සහ මැලේසියාව, තායිලන්තය සහ ඉන්දුනීසියාව වැනි මෑතදී කර්මීකරණය වූ රටවල ජාතික සංවර්ධන න්‍යාය පත්‍රයන්හී එක් ප්‍රධාන ක්‍රමෝපායක් වූයේ විදේශ තාක්ෂණය ආනයනය ප්‍රතිවර්ත ඉංජිනේරුව, මායිම් හරහා තාක්ෂණවිද්‍යා හුවමාරුව, තාක්ෂණ බලපත්‍ර දීම, විදේශීය සමාගම් සමග ප්‍රතිලෝම සම්බන්ධක සෘජු විදේශ ආයෝජන ලබාගැනීම සහ තවත් දෑ මගින් තාක්ෂණවිද්‍යාත්මක හැකියා වැඩිදියුණු කිරීම සහ විචිත්‍රික බව ඇතිකිරීමය.

අවසානයේදී තරඟකාරී නිෂ්පාදන හඳුන්වාදීම තුළින් ගෝලීය වෙළඳපොළ ජයගැනීමට ඔවුනට හැකිවිය. එමගින් ඒ රටවල දළ ජාතික නිෂ්පාදනයට, උසස් ගණයේ තාක්ෂණික භාණ්ඩ අපනයනය තුළින් සැලකිය යුතු දායකත්වයක් ලැබීමට හේතුවිය. කෙසේවෙතත් රටකට විදේශීය තාක්ෂණවිද්‍යාව මත පමණක් යැපිය නොහැකිය. පර්යේෂණ හා සංවර්ධනය සහ තාක්ෂණවිද්‍යාවේ සංවර්ධනය සඳහා අඩුවෙන් ආයෝජනය කරමින් මූලධනය වැඩිපුර එක්රැස් කිරීම මත යැපෙන රටවල්වලට වඩා ශීඝ්‍ර සංවර්ධන ප්‍රවණතාවයක් ඇතිකරගැනීමට විද්‍යාත්මක සහ තාක්ෂණවිද්‍යාත්මක පර්යේෂණ සඳහා වැඩියෙන් ආයෝජනය කරන රටවල් සමත්ව ඇත. නව නිෂ්පාදන සහ නවෝත්පාදන ද කිසියම් රටක ශීඝ්‍ර ආර්ථික වර්ධනය සඳහා සැලකිය යුතු ලෙස දායකවී ඇත. 1වන රූප සටහන විමසීමෙන් මෙය ඉතා පැහැදිලිව දැකිය හැකිය. එමගින් ඇමෙරිකා එක්සත් ජනපදය සහ ජපානය අබිබවා යාමට වර්ෂ 2011 දී චීනයේ හිමිකම් පැතිකඩ සාතිය හෝ ශීඝ්‍ර වර්ධනයක් හෝ ලද ආකාරය දක්වයි.

## ශීඝ්‍ර ආර්ථික වර්ධනය ආපසු ගමනය සඳහා සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථික මුහුණ දෙන අභියෝග

පරිගණක ආකෘති නිර්මාණය සහ විඩම්බනය හෝ අනුකරණය හෝ නව තාක්ෂණවිද්‍යාත්මක සංවර්ධන මගින්




01 වන රූපය: ප්‍රධාන පෙළේ ආර්ථීක හිමි රටවල් කිහිපයක හිමිකම් බලපත්‍ර පැතිකඩ

විද්‍යාව සහ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාවලිය වේගවත් කර ඇත. ඒ අනුව අදහසක පිළිසිඳීම සහ එය අලෙවි කළහැකි නිෂ්පාදනයක් බවට පරිණාමනය වීම මෙන්ම විද්‍යාත්මක සොයාගැනීමක් වාණිජමය යෙදවුමක් ලෙසට පිළිගැනීම දක්වා ගතවන කාල පරතරය පහළ යමින් පවතියි. වර්තමාන තොරතුරු සන්නිවේදන තාක්ෂණයද නව දැනුම උපයෝජනය සහ එහි ව්‍යාප්තිය උදෙසා පහසුකම් සලසා ඇත. තොරතුරු සන්නිවේදන තාක්ෂණය සහ අනෙකුත් දියුණුවෙමින් පවතින තාක්ෂණ පිළිබඳ දැනුම සහ කුසලතා ශ්‍රම බලකායට ඉගැන්වීම තුළින්, ඔවුන් ශීඝ්‍රයෙන් වර්ධනයවන ගෝලීය දැනුම හිමිකර ගැනීමට සහ ගෝලීය නිසැඟියා සමූහයට එක්වීමටත්, එමගින් ගෝලීය අගය දම්වැලට සම්බන්ධවී රටට ලාභ ප්‍රයෝජන අත්පත්කර දීමටත් අවස්ථාව සැලසෙයි. වෙළඳාම පිළිබඳ ලෝක ප්‍රවාහන විශ්ලේෂණය කරන විට, මධ්‍යම සහ ඉහළ තාක්ෂණවිද්‍යාත්මක ආකාරයෙන් නිෂ්පාදනය කළ සහ හඳුන්වා දුන් නිෂ්පාදන පසුගිය වසර කිහිපයේදී වැඩියෙන් අපනයනය කර ඇති බව පෙනීයයි. කිසියම් රටක් දිගින් දිගටම ප්‍රාථමික භාණ්ඩ අපනයනයටම යොමුවුවහොත් එම රටට තරඟකාරිත්වය අහිමිවනවා මෙන්ම අවසානයේදී ගෝලීය වෙළඳපොළ අවස්ථාද අහිමිවීමට ඉඩ ඇත. එහෙයින් තාක්ෂණවිද්‍යාත්මක හැකියාව සහ කුසලතා නංවාලීමට, තව තවත් ආයෝජන යෙදීම මගින් පර්යේෂණ සහ සංවර්ධන සහාය ලබාදීම උසස් මට්ටමේ තාක්ෂණවිද්‍යාත්මක භාණ්ඩ නිෂ්පාදනය සහ අපනයනට උදෙසා අත්‍යවශ්‍යම වූ අවශ්‍යතාවයකි. රේගු බදු සහ වෙළඳාම පිළිබඳ පොදු එකඟතා ගිවිසුම (ගැට්) වැනි අභ්‍යන්තර වෙළඳ ගිවිසුම්, රේගු බදු සහ රේගු බදු නොවන බාධක හී මට්ටම් ක්‍රියාත්මක වීම බොහෝ රටවල අසාර්ථකව ඇත. දියුණුවෙමින් පවතින රටවල් තොරාගත් අංශයක් සඳහා ලෝකයේ ඕනෑම තැනකින් බොහෝ පුහුණු ශ්‍රමය ලබාගැනීම ආකර්ශණය කරගැනීම තම වෙළඳ ප්‍රතිපත්ති ලිහිල් කර ඇත. ගෝලීය වශයෙන් තරගකාරී වීමට නම් ජාතියක තාක්ෂණ කුසලතාවන්හී තිබිය යුතු ඉහළ මට්ටම මෙමගින් පෙන්වා දෙයි. සමහර අවස්ථාවලදී මෙවැනි ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් දේශීය වෙළඳපොළට පවා තරගකාරී පීඩනයක් ගෙන ඒමට සමත්ය. එහෙයින් දියුණුවෙමින් පවතින රටවල් මුහුණ දෙන අභියෝගය වන්නේ ගෝලීය තරගකාරීත්වයට විවෘතවන මට්ටම නියාමනය කරන උචිත ක්‍රමෝපා සකසන අතරම ගෝලීය තරගකාරී නිෂ්පාදන / සේවා නිෂ්පාදනය සඳහා තමන්ගේම කුසලතා සහ සංවර්ධනය කිරීමත්‍ය.

## තරුණයන්ට අධ්‍යාපනය ලබාදීම සහ කුසලතා සංවර්ධනය සඳහා පවතින ජාතික ප්‍රතිපත්ති නැවත නිර්ණය කිරීම

ශ්‍රම බලකායට තාක්ෂණවිද්‍යාත්මක කුසලතා හිමිකර ගැනීම සහ උත්ශ්‍රේණි ගත කිරීම වැදගත්වන්නේ දැනුම ආර්ථිකයට දායකත්වය දැක්වීමට

පමණක් නොව ලෝක වෙළඳපොළෙහි පැන නගිමින් පවත්නා ආර්ථික අවස්ථා ග්‍රහණය කරගැනීමට එමගින් හැකිවන බැවිනුත්ය. කම්කරු ශ්‍රම බලකාය, පුහුණු ශ්‍රම බලකායක් බවට පරිණාමනය, ස්ථිතික හෝ සෙමෙන් සිදුවන ක්‍රියාවලියක් හෝ නොවිය යුතු අතර එය හොඳින් අනුවර්තනය වන නම්‍යශීලී සහ ගෝලීය අවශ්‍යතා මෙන්ම වෙනස්වන පරිසරයට ද ප්‍රතිචාර දක්වන්නන් විය යුතුය. කුසලතා සංවර්ධනය, විධිමත් මෙන්ම අවිධිමත් යාන්ත්‍රණ ඔස්සේ සිදුවෙයි. දැනටමත් පවත්නා කුසලතා සංවර්ධන ක්‍රියාපටිපාටි, කාර්යක්ෂම ලෙස ගෝලීය අභියෝගවලට මුහුණදීමට ප්‍රමාණවත්ද, නොඑසේ නම් ජාතික සහ ගෝලීය අවශ්‍යතා සපුරාලීම සඳහා එම ක්‍රියාපටිපාටි සංශෝධනය කළ යුතුද යන්න නිගමනය සඳහා ක්‍රමානුකුල විශ්ලේෂණයක් කිරීම අගය කළහැකි ක්‍රියාවකි. ඒ අනුව, ජාත්‍යන්තර මට්ටම සහ සමවිය හැකි අන්දමට කුසලතා උත්ශ්‍රේණි ගතකිරීම සහ නවෝත්පාදන සඳහා ඇති ඉල්ලුමට ප්‍රතිචාර දැක්වීමට, ජාතික මට්ටමේ කුසලතා සංවර්ධන මූලාරම්භයක් අවශ්‍යය. තාක්ෂණවිද්‍යාත්මක කුසලතා සංවර්ධනය සහ යෙදවීම තරමටම දැනුම නිර්මාණය කෙරෙන අධ්‍යාපනයක් පැවතීම ද වැදගත්ය.

තාක්ෂණවිද්‍යාව සහ නවෝත්පාදන ප්‍රේරිත සංවර්ධනය යනු නව දැනුම නිර්මාණයන් සහ භාවිතයෙන් පමණක්ම සිදුවන්නක් නොවේ. එයට ගුණාත්මක අධ්‍යාපනය, පුහුණුව, තාක්ෂණවිද්‍යාත්මක කුසලතා සංවර්ධනය, ආයතන සමග ජාල ගතවම, බුද්ධිමය දේපළ ආරක්ෂණය, විදෙස් රටවල නව තාක්ෂණවිද්‍යාව ඉගෙනුම සහ රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වය පැවතීම ආදීය තුළින් ජනතාවගේ දැනුම දක්වීම අවශ්‍යය. උදාහරණයක් ලෙස දක්වතොත් කොරියානු සමූහාණ්ඩුව පර්යේෂණ සහ සංවර්ධනය සඳහා මෙන්ම උසස් අධ්‍යාපනය සඳහා ද බොහෝ සේ ආයෝජනය කරති. ලාබදායී නොපුහුණු ශ්‍රම වෙළඳපොළක සිට ප්‍රමුඛ දැනුම පදනම් ආර්ථිකයක් බවට එකවර ඉහළට එසවීමට සිංගප්පූරුව සමත්වූයේ කෙසේද යන්න විමසා බැලීම වටියි. සිංගප්පූරුව ද්විතීයක සහ තාක්ෂණ තෘතියක අධ්‍යාපනය සඳහා විශාල ලෙස ආයෝජනය කරමින් තරගකාරීව සිටීම සඳහා තම ශ්‍රම බලකායේ තාක්ෂණවිද්‍යාත්මක කුසලතා උත්ශ්‍රේණි ගත කිරීම තුළින් විදේශ ආයෝජන ආකර්ශණය කරගත්තේය. අළුතෙන් කාර්මිකකරණය වූ රටවල් දෙකක් වන මැලේසියාව සහ තායිලන්තය පර්යේෂණ හා සංවර්ධන සඳහා මෙන්ම විශේෂයෙන්ම තෘතියක අධ්‍යාපනය ද ඇතුළත් උසස් අධ්‍යාපනය සඳහා වැඩියෙන් ආයෝජනය කරයි. පර්යේෂණ හා සංවර්ධනය සහ නව දැනුම නිර්මාණය කෙරෙහි පමණක්ම නොසිතා, ක්‍රමෝපා සහ ගිවිසීම් කුසලතා අනුවර්තනය සහ නව දැනුම අන්තර්ග්‍රහණය ආදී අදාළ තාක්ෂණවිද්‍යාත්මක කුසලතා සහිත මානව සම්පත් පදනමක් ඇතිකර ගැනීමට කටයුතු කිරීම ද වැදගත්ය. දේශීය තත්වයට ගැලපෙන සේ තාක්ෂණවිද්‍යාව අනුවර්තනය කරගැනීමටවුවද අදාළ කුසලතා සහිත පුද්ගලයන් සිටීම අවශ්‍යයය.

කෙසේවෙතත් නව නිෂ්පාදන සහ නවෝත්පාදන වෙත යොමුවන පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාවලිය සරල වූවක් නොවේ. ඒ සඳහා තාක්ෂණවිද්‍යා තක්සේරුව, ගිවිසීම් (සාකච්ඡාමය) කුසලතා, ආර්ථික විද්‍යා තක්ෂණ - ව්‍යවසායකත්වය, බුද්ධිමය දේපළ සලකා බැලීම්, සමාජ විද්‍යාව, නීතිය, තීරු බදු සහ ආදායම් බදු ඇතුළු ආදායම් මිනුම් මෙන්ම නිවැරදි වේලාවට, නිසි සුදුසුකම්, අත්දැකීම් සහ කුසලතා සහිත පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන්හී නියැලි පුද්ගලයන් සේවයට යොදා ගැනීම ඇතුළු පරාස රැසක පැතිරුන කුසලතා පැවතීම අවශ්‍යය.

ලෝකය ජයගැනීම සඳහා තාක්ෂණවිද්‍යාත්මක කුසලතා උපයෝගී කරගත් තවත් රටකට උදාහරණ ලෙස තායිවානය දැක්විය හැකිය. තායිවානය රේගු බදු හා රේගු බදු නොවන බාධක තුළින් තම රට තුළ ශක්තිමත් ආනයන ආදේශක කර්මාන්ත හා වෙළඳ ප්‍රතිපත්තියක් ප්‍රවර්ධනය කරනු ලැබීය. තායිවානයේ තාක්ෂණවිද්‍යා සහ කර්මාන්ත ක්‍රමෝපාය කොතරම් දැඩි වූයේදයත් ලෝකය පුරා විවිධ රටවල ඉහළ මට්ටමේ තාක්ෂණිකමය කර්මාන්තවල සේවයේ නියැලි පිටරට සිටින තම රටවැසියන් ආපසු මව් රටට ආකර්ෂණය කරගැනීමට සමත්විය.

මෙසේ නිවැරදි කුසලතා සහිත පුද්ගලයන් තම රට තුළ සේවය කිරීමට සැලැස්වීම තුළින් ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ එක්රැස් කිරීම් සිදුකළ රටක්ව පැවති තායිවානය "චිප්" නිෂ්පාදනය කරන රටක් බවට ගෝලීය වෙළඳපොළෙහි තමන්ගේම වෙළඳ සන්නාම පවත්වා ගෙන යන රටක් බවට පත්විය.

බොහෝ කුසලතා සපිරි මෘදුකාංග ඉංජිනේරුවරුන් උත්පාදනය කරන්නාවූ, ඉංජිනේරුමය නිපුණතා ගෝලීයව පිළිගත් රටක් ලෙස ඉන්දියාව සැලකෙයි. රටතුළ ඉහළ මට්ටමේ මානව මූලධනයක් පවතින බව පෙන්වා දෙමින් දියුණු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයන්හී සහාය ලබන බහුජාතික සමාගම් පිහිටුවීමට ගෝලීයව නමක් දිනූ බහුජාතික සමාගම් ආකර්ෂණය කරගැනීමට ඉන්දියාව සමත්ව ඇත.

චීනයෙහි තාක්ෂණවිද්‍යා සහ වෙළඳ ක්‍රමෝපාය යොමුව ඇත්තේ සෘජු විදේශ ආයෝජන ලැබීම ප්‍රවර්ධනය කරනු සඳහාය. ඊහා සමගම ඔවුන් සිය පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් සඳහා සිදුකරන ආයෝජන ඉහළ නංවමින් තමන්ගේ නවෝත්පාදන වෙතින් හැකිතාක් ලාභ ප්‍රයෝජන ලබයි. ජපානය සහ කොරියාව මෙන්ම චීනයද මානව මූලධනය සඳහාද ආයෝජනය කර ඇත. එහෙයින්, චීනයේ නවෝත්පාදන මෙහෙයවන සුපිරි - බලවත් ආර්ථික සංවර්ධනය පිටුපස පවත්නා රහස වන්නේ නිවැරදි තාක්ෂණවිද්‍යා කුසලතා සහිත මානව මූලධන සාධකය වෙයි.

**ජාතික විද්‍යා පදනම් ප්‍රදාන ක්‍රියාපටිපාටි සහ තාක්ෂණවිද්‍යා නවෝත්පාදන සහාය මධ්‍යස්ථානය (TISC) :- තාක්ෂණවිද්‍යාත්මක කුසලතා සහ ධාරිතාව අභිවර්ධනය කරයි.**

ජාතික විද්‍යා පදනමේ "තාක්ෂණවිද්‍යා සංවර්ධනය සඳහා සහාය මධ්‍යස්ථානය (Tech – D)" තාක්ෂණවිද්‍යා ප්‍රදාන ක්‍රියාපටිපාටිය ප්‍රධාන අරමුණවනුයේ, පර්යේෂණ සහ සංවර්ධන සොයාගැනීම්, වානිජකරණය, තාක්ෂණවිද්‍යා සංවර්ධනය, සහ රටෙහි සමාජ - ආර්ථික ප්‍රයෝජනය වෙනුවෙන් තාක්ෂණ විද්‍යාත්මක තරග කාරිත්වය මෙහෙයවන තාක්ෂණය මෙහෙයවන නවෝත්පාදන අභිවර්ධනයය. එය පර්යේෂකයන්ට සහ නව නිෂ්පාදනයන්ට වානිජමය විභවයක් සහිත තම පර්යේෂණ ප්‍රතිඵල / නිෂ්පාදන රසායනාගාර මට්ටම අබිබවා අලෙවි මට්ටමට ගෙනයාමට මුදල් ආධාර සපයයි. එම ප්‍රදාන ක්‍රියාපටිපාටිය විශ්වවිද්‍යාල, පර්යේෂණ සහ සංවර්ධන ආයතන වැනි රාජ්‍ය අංශයේ සංවිධානවලට මෙන්ම රාජ්‍ය නොවන අංශය (කර්මාන්ත) සහ තනිපුද්ගල පර්යේෂකයන් සහ නව නිපැයුම්කරුවන්ටත් විවෘතය. එසේම එය ආනයන ආදේශ ප්‍රතිවර්ත ඉංජිනේරුමය, තාක්ෂණ අනුවර්තනය සහ තාක්ෂණ පැවරුම ලෙස අපගේ තාක්ෂණවිද්‍යාව යොදාගැනීම ද ප්‍රවර්ධනය කරයි. මෙහිදී හැමවිටම පර්යේෂකයන් සහ නව නිෂ්පාදකයන් දිරිමත් කරනු ලබන්නේ තම තමන්ගේ තාක්ෂණවිද්‍යා සංවර්ධන ව්‍යාපෘති අදාළ කර්මාන්තයේ සහක්‍රියාවක් ලෙස තහවුරු කිරීම සඳහා කර්මාන්තය සමග සහයෝගීතාවයෙන් යුතුව ක්‍රියාත්මක කරන ලෙසය. මෙම ප්‍රදාන ක්‍රියාපටිපාටිය නවෝත්පාදන පරිසර පද්ධතියෙහි සිටින විවිධ පුද්ගලයන්ගේ තාක්ෂණවිද්‍යාත්මක කුසලතා ඉහළ නැංවීමට පහසුකම් සලසනවා පමණක් නොව එය ආයතන සහ කර්මාන්තවල නවෝත්පාදන ධාරිතාවද උත්ශ්‍රේණි ගත කිරීමට සමත්වෙයි. මෙම ප්‍රදාන ක්‍රියාපටිපාටිය පිළිබඳ වැඩි තොරතුරු අවශ්‍ය නම් එය www.nsf.ac.lk/index.php/researchers-a-academics/tech-d-grants/212.html හරහා ලබාගත හැකිය.

දැනුම ආර්ථිකයක් යන සන්දර්භය තුළ බුද්ධිමය දේපළ අගයෙහි වැඩිවීමක් දැකිය හැකිය. එහෙයින් බුද්ධිමය දේපළ පිළිබඳ දැනුම හිමිකර ගැනීමත් සහ ඉන් පසුව වානිජකරණ උපයෝජනයක් පිළිබඳ දැනුම හා කුසලතා ගොඩනැගීම අවශ්‍ය මෙන්ම කාලෝචිත වුවක්ද වෙයි. ජාතික විද්‍යා පදනමෙහි තාක්ෂණවිද්‍යා නවෝත්පාදන සහාය මධ්‍යස්ථානය (TISC), පර්යේෂකයන්ට, නව නිෂ්පාදකයන්ට සහ තාක්ෂණවිද්‍යා සංවර්ධනයේ නියැලන්නන් හට නිර්මාණ හිමිකම් තොරතුරු සෙවීමට, නිර්මාණ හිමිකම් ලබාගැනීමේ ක්‍රියාවලිය, නිර්මාණ හිමිකම් කෙටුම්පත් කිරීම, නිර්මාණ හිමිකම් යොමු ගත කිරීම මෙන්ම නිර්මාණ හිමිකම් සංස්ථාපිත ගිවිසුම යටතේ නිර්මාණ හිමිකම් ඉල්ලා සිටීම පිළිබඳව පවා මග පෙන්වීම සිදුකරයි. එසේම ඔවුන් හට අනාවරණය නොකරන ගිවිසුම් පිළියෙළ කිරීම, තාක්ෂණවිද්‍යා බලපත්‍ර ගිවිසුම් මෙන්ම තාක්ෂණ පැවරුම් / බලපත්‍ර සාකච්ඡා සිදුකිරීම ආදිය පිළිබඳ දැනුම විමසා ලබාගත හැකිය. තාක්ෂණවිද්‍යා නවෝත්පාදන සහාය මධ්‍යස්ථානය ලබාදෙන සේවා මගින් පර්යේෂකයන් සහ නව නිෂ්පාදකයන් හට තමන්ගේම බුද්ධිමය දේපළ ආරක්ෂා කරගැනීමේදී සහ වානිජකරණය කිරීමේදී ඇතිවන අභියෝගයන්ට මුහුණදීමටත්, තමන්ගේ බුද්ධිමය දේපළ වඩා කාර්යක්ෂමව රැකගැනීමටත් අවස්ථාව සැලසෙයි.

**ජාතික විද්‍යා පදනමේ ජයග්‍රාහක කතාව**

**"ඉ - හෙල්ත් කිඔස්ක්" (e-Health KIOSK) සමගින් සෞඛ්‍ය සත්කාර සේවාවන් හී අගය ඉහළ නැංවීමට ජාතික විද්‍යා පදනමේ තාක්ෂණවිද්‍යා ප්‍රදාන ප්‍රතිඵල සමත්වෙයි.**

ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය තොරතුරු පද්ධතිය සහ සෞඛ්‍ය සත්කාර ව්‍යවහාර තවමත් වැඩිවශයෙන්ම රැදෙනුයේ කඩදාසි භාවිතයෙන් සහ හස්තිමය ක්‍රියාදාමයක් මතය. ඒවා බොහෝවිට සංකීර්ණ මෙන්ම බොහෝ කාලයක් වැයවන කාර්යයන් වේ. දැනට, රජයේ මෙන්ම පෞද්ගලික අංශයේද සෞඛ්‍ය සත්කාර පතා එන රෝගීන්හට හමුවීමේ නොම්මරයක් ලබාගැනීමට මෙන්ම වෛද්‍යවරයකු මුණගැසීමටද දීර්ඝ වේලාවක් පෝලිම්වල රැඳී සිටීමට සිදුවෙයි. මෙය ඉතා කරදරකාරී තත්වයක් මෙන්ම, රෝගීන් තුළ පසුතැවීම් ඇති කිරීමටද සමත් වූවකි. එයට අමතරව, විශේෂයෙන්ම තදබද වේලාවන්හීදී, රෝගීන්ගේ අවශ්‍යතා වෙන් වෙන්ව සොයා බැලීමට අවශ්‍යවන නිසා රෝහල් කාර්යමණ්ඩලයන්ට ගුණාත්මක රෝගී සත්කාර සැපයුමක් ලබාදීම තහවුරු කිරීම දුෂ්කර වෙයි. පවත්නා සෞඛ්‍ය සත්කාර ව්‍යවහාරයන්හී දී සිදුවන බොහෝ කාලවේලා ගතවන ක්‍රියාවලි සහ ලේඛනගත කිරීම් මත රැඳීම නිසා රෝහල් හී පරිපාලනමය වියදම්ද ඉහළ ගොස් ඇත. මෙම ගැටළුවට විසඳුමක් සොයා බොහෝ විධිමත් ආයතන ඉ - සෞඛ්‍ය හල් (ඉ - හෙල්ත් කිඔස්ක්) හෙවත් ස්වයං - සේවාහල් හරහා සෞඛ්‍ය සත්කාර සේවා සැපයීමට අවධානය යොමු කර ඇත. ජාතික විද්‍යා පදනමේ තාක්ෂණවිද්‍යා ප්‍රදාන ක්‍රියාපටිපාටිය මගින් ලද මුදල් සහාය යොදාගෙන ඊස්ට් ලින්ක් ඉංජිනේරු (පුද්ගලික) සමාගම මගින් ඉ - සෞඛ්‍ය විසඳුමක් නිෂ්පාදනය කර ඇත. ශ්‍රී ලංකාවේ පවතින සෞඛ්‍ය සත්කාර කර්මාන්තයෙහි ගැටළු විසඳීමට ඔවුන්ගේ විසඳුම නම් කර ඇත්තේ "ඉ - හෙල්ත් කිඔස්ක් - e-Health KIOSK" හෙවත් "ඊ - සෞඛ්‍යහල්" ලෙසිනි. ප්‍රතිකාර සඳහා පැමිණෙන රෝගීන් ලියාපදිංචිය වෛද්‍යවරු මුණගැසී උපදෙස් ලැබීම, බෙහෙත් වට්ටෝරු සම්පූර්ණ කිරීම ආදී රෝහල් තුළ සිදුවන චර්යාරටා ගත කාර්යයන් ස්වයංකෘත කිරීමට "ඉ - සෞඛ්‍යහල්" සමත්ය. එය චැනල් සේවා, බාහිර රෝගී අංශ සේවා, සායන සේවා, විශේෂඥ වෛද්‍ය සත්කාර සේවා, වෛද්‍යවරුන්ගේ පැමිණීම, රෝගීන් පරීක්ෂා කරන මෙන්ම චැනල් කිරීම් සඳහා කෙරෙන අය කිරීම් ඇතුළු

කාර්යයන් සියල්ලම පාහේ ලියාපදිංචිය සඳහා පෝලිම්වල නොසිට රෝගීන්ට අවශ්‍ය තොරතුරු සපයාදීමට මෙම අන්තර් ක්‍රියාකාරී ස්වයංසේවා ක්‍රමය මගින් සැලසුම් කර ඇත. එමගින් මෙම මෙවලම සෞඛ්‍ය සත්කාර සේවාවන්හී ගුණාත්මකභාවය ඉහළ නංවන අතරම රෝගීන් තෘප්තිමත් කිරීමටද සමත්ය. එසේම චැනල් සේවා සඳහා ගෙවීම්, ඖෂධ සඳහා ගෙවීම් මෙන්ම රසායනාගාර පරීක්ෂණ වාර්තා ලබාගැනීම සඳහා අවශ්‍ය පහසුකම්ද මෙම උපකරණය තුළින් සැපයීමට එහි හැකියාව දිගු කරදීමය. මෙසේ ඉ - කිඔස්ක් මගින් රෝගීන්ට සේවා සපයන අතරම, පරිපාලනමය වියදම් අඩුකිරීම, කඩදාසි භාවිතයෙන් සිදුවන ලේඛනගත කාර්යයන් අඩුකිරීම, කාර්යමණ්ඩලයේ වටිනා වැඩකරන කාලය ඉතුරු කිරීම, රෝගී පෝලිම් නිසියාකාරයෙන් කළමනාකරණය කිරීම සන්නිවේදන කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, සත්කාර ගුණාත්මකභාවය පිහිටවීම, දත්ත ගුණාත්මකභාවය නැංවීම, ආරක්ෂාව දියුණු කිරීම මෙන්ම සෞඛ්‍ය සත්කාර සේවා සඳහා සංගත බවක් ඇති කිරීම, කළමනාකරණමය තීරණ ගැනීමේදී කාර්යක්ෂම බවක් මෙන්ම ප්‍රගතියක් ඇති කිරීම තුළින් රෝහලටත් එල ප්‍රයෝජන සැපයෙයි.




**02 වන රූපය: ජාතික විද්‍යා පදනමේ ආධාර ඇතිව සංවර්ධනය කළ ඊ - සෞඛ්‍ය කිඔස්ක් යන්ත්‍රය**

මෙම උපකරණය සතු විශේෂ ලාභප්‍රයෝජන හේතුකොට රජයේ සහ පෞද්ගලික අංශ යන දෙ අංශයේ රෝහල් වෙතින් ඉ - හෙල්ත් කිඔස්ක් සඳහා විශාල ඉල්ලුමක් පවතියි. ජාතික විද්‍යා පදනම් මුදල් ප්‍රදාන යටතේ ඊස්ට් ලින්ක් ඉංජිනියරිං (පුද්ගලික) සමාගම නිපදවූ ඉ - හෙල්ත් කිඔස්ක් යන්ත්‍ර දෙකක් කොළඹ, සීමාසහිත නවලෝක පෞද්ගලික රෝහලේ සහ කොළඹ ජාතික රෝහලේ දැනටමත් සේවයේ යොදවා ඇත.

## ගුණාත්මක බව සහ තිරසාර බව තහවුරු කිරීම

භේදකාරී තාක්ෂණිකමය වෙනස්කම්, නිෂ්පාදනතාව වර්ධනය මෙන්ම අසමානත්වය, මානව සෞඛ්‍යය සහ පර්සරයේ ආරක්ෂාව ආදිය කෙරෙහි සාර්ව ආර්ථික බලපෑම් ඇතිකරයි. දියුණුවෙමින් පවතින සමහර ආර්ථිකයන් එවැනි තත්වයන්ට මුහුණ දී ඇත. එහෙයින් සංවර්ධනය සඳහාවන න්‍යාය පත්‍ර සකස් කරන විට නවෝත්පාදන මෙහෙයවන සංවර්ධනය ආර්ථික වශයෙන් සුදුසු, සමාජයීය වශයෙන් වගකීම දරණ සහ පරිසරයට මිතුරු බව තහවුරු කරගැනීම අත්‍යවශ්‍යයය.



ජාතික විද්‍යා පදනම
තාක්ෂණ අංශය
අංශ ප්‍රධානි
**ජේ. ජී. ශාන්ත සිරි**
shantha@nsf.gov.lk
0714491543

# විද්‍යාව සංවර්ධනයෙහිලා ජාත්‍යන්තර සම්බන්ධතා

වසන්ත අනුරුද්ධ




ලෝකයෙහි නව තාක්‍ෂණික සංවර්ධනය සිදුවීමත් සමගම විද්‍යාත්මක ලෝකය ඉතා ශීඝ්‍රයෙන් විෂයාන්තර බවට පත්වෙමින් ඇත. එබැවින් විද්‍යාවන් හරහා ලෝකය සම්බන්ධ කිරීම අවශ්‍යයය. පොදු ගැටළු විසඳීම සඳහා ජාතීන් අතර විද්‍යාත්මක සහයෝගීතාව භාවිත කිරීම පැහැර හැරිය නොහැක්කකි. එහෙයින් අද ජාත්‍යන්තර සම්බන්ධතාව ගොඩනැගීම කාලීන වශයෙන් වැදගත් වූවකි.

මෙම අත්‍යවශ්‍ය සාධකය වටහාගත් ශ්‍රී ලංකා රජය යටිතල පහසුකම් සංවර්ධනයට පමණක් නොව විද්‍යාව හා තාක්‍ෂණවිද්‍යාවෙහි නියැලි පුද්ගලයන්ගේ හැකියා හෙවත් ධාරිතාව සංවර්ධනය සඳහාද ආයෝජනය කිරීමට යොමුව තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස පාකිස්තානය, චීනය, ජපානය, ජර්මනිය යන රටවල් සමග ද්විපාර්ශවික ගිවිසුම්වලට එළඹීමක් මේ වනවිට සිදුව ඇත.

වර්ෂ 2016දී ශ්‍රී ලංකාවේ රජය **"සමාජය සඳහා විද්‍යාව හා තාක්ෂණවිද්‍යාව"** යන තේමාව යටතේ සංසදයක් සංවිධාන කරනු ලැබීය. එහි අරමුණ වූයේ ගෝලීය විද්‍යාව හා තාක්‍ෂණවිද්‍යා සංවර්ධන තුළින් ශ්‍රී ලංකාවේ සමාජයට ලබාගත හැකි අවස්ථා කවරේදැයි ගවේෂණය කිරීමය. මෙමගින් සමාජ - ආර්ථික සංවර්ධනයට විද්‍යාවෙහි සහ තාක්‍ෂණවිද්‍යාවෙහි ඇති වැදගත්කම රජය ක්‍රමයෙන් අවබෝධ කරගනිමින් සිටින බව පෙනෙන අතර එය දිරිගන්වන සුළු එලබුමක් ලෙස හැඳින්විය හැක.

මෙය ධනාත්මක සංඥාවක් ලෙස සලකමින් පර්යේෂණ කටයුතු සඳහා රටෙහි දළ ජාතික නිෂ්පාදනයෙන් 1% ක් දක්වා ආයෝජනය ඉහළ නැංවීමේ අවශ්‍යතාවය රජයට ඒත්තුගැන්වීමට සමාජය ලෙස අප කටයුතු කළ යුතුය. එලෙසින්ම ඔවුන්ගෙන් අපේක්‍ෂිත ප්‍රතිඵල සමාජය වෙත ලබාදීම සඳහා විද්‍යාඥයන් හා තාක්‍ෂණවිද්‍යාඥයන් ඒත්තුගැන්වීමටද උත්සාහ දැරිය යුතුව පවතියි.

මෙම කාර්යය සඳහා විද්‍යාඥයන් සහභාගී කරගැනීම සහ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ප්‍රමාණවත් මූල්‍යාධාර සැපයීමේ මුලාරම්භය අධිකාරීන් විසින් ගත යුතුය. සියළු විද්‍යාඥයන් සමාජයේ යහපත වෙනුවෙන් තමන්ට අදාළ ඒ ඒ විෂය ක්ෂේත්‍ර තුළ දේශීය හා අන්තර්ජාතික ජාලයන්හී කටයුතු කිරීම අවශ්‍යතාවයකි.

ජාතික විද්‍යා පදනම වර්තමාන අවශ්‍යතාවන්හී වැදගත්කම සහ ලෝක ක්ෂේත්‍රය තුළ පවතින ප්‍රවණතා වටහාගෙන, රටවල් කිහිපයක් සමගම නවජාල නිර්මාණයෙහිලා නිරතවිය. මෙම පියවර ගනුලැබුයේ විද්‍යාව හා තාක්‍ෂණවිද්‍යා ක්ෂේත්‍රයන්හී සහයෝගීතාව ශක්තිමත් කරනු උදෙසාය. ජාතික විද්‍යා පදනම දේශීය හා අන්තර්ජාතික වශයෙන් පුද්ගලයන්, සංවිධානය, සංගම් හෝ ආයතන හෝ සමග සම්බන්ධ ගොඩනගමින් ධාරිතා සංවර්ධනය දියුණු කිරීම හා ප්‍රවර්ධනය කිරීමේ නියුතුව සිටින්නේ එමගින් විද්‍යාව හා තාක්‍ෂණවිද්‍යාව සංවර්ධනය සඳහා දැනට විදේශ ගතව සිටින විශිෂ්ට විද්‍යාඥයන් සහ තාක්‍ෂණවිද්‍යාඥයන් ශ්‍රී ලංකාවට පෙරළා පැමිණීමට හේතුවන පහසුකම් සපයනු ඇතැයි. යන අපේක්‍ෂාවද සහිතවය.

## අන්තර්ජාතික ප්‍රදාන ක්‍රියා පටිපාටිය

ජාතික විද්‍යා පදනම් විද්‍යාඥයන් සහ තාක්‍ෂණවිද්‍යාඥයන් සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා සහ පෙර සඳහන් කළ පරිදි විද්‍යාවට සහ තාක්‍ෂණවිද්‍යාවට අදාළව ඔවුන් තුළ පවත්නා දැනුම නංවාලීම සඳහා ප්‍රදාන පිරිනැමීමේ ක්‍රියාපටිපාටි කිහිපයක් හඳුන්වා දී ඇත. එමගින් ඔවුන්ට තොරතුරු හුවමාරු කරගැනීමට හා තොරතුරු ලබාගැනීමට උදව් සැපයීමට සහ ජාල ගතවීමට අවස්ථාව සලසා ගැනීමට හැකිවෙයි. ජාතික විද්‍යා පදනම් අන්තර්ජාතික සම්බන්ධතා අංශය පහත දැක්වෙන ප්‍රදාන ක්‍රියාපටිපාටි සම්බන්ධිකරණය කරයි.

1. චාරිකා ප්‍රදාන ක්‍රියාපටිපාටිය (TG)
2. විදේශීය විශේෂ පුහුණු වැඩසටහන (OSTP)
3. විද්‍යාව හා තාක්‍ෂණවිද්‍යා ජාත්‍යන්තර හවුල්කාරීත්වය (IPSAT)
4. ජාත්‍යන්තර පර්යේෂණ වැඩසටහන් සහයෝගිතාව (ICRP)
5. විදේශීය විද්‍යා අධ්‍යාපන වැඩසටහන (OSEP)

**චාරිකා ප්‍රදාන ක්‍රියාපටිපාටිය (TG)** මගින් ශ්‍රී ලංකාවේ විද්‍යාඥයන්ට සහ තාක්‍ෂණවිද්‍යාඥයන්ට තම පර්යේෂණාත්මක සොයාගැනීම් ජාත්‍යන්තර තලයන්හිදී ඉදිරිපත් කිරීමට සහ හුවමාරු කරගැනීමට මෙන්ම තමන්ට අදාළ පර්යේෂණ ක්ෂේත්‍රයන්හී නව සොයාගැනීම් ජයග්‍රහණ සහ සංවර්ධන පිළිබඳ දැනුම හා කුසලතා හිමිකර ගැනීමට අවස්ථාව සලසයි. එසේම එමගින් ජගත් තලයට නිරාවරණය වීමට සහ අනාගත සහයෝගීතා ඇතිකර ගැනීමට ඉඩ සලසන සමාන පර්යේෂණ ක්ෂේත්‍රයන්හී කටයුතු කරන ලොවපුරා විද්‍යාඥයන් සමග සබඳතා ගොඩනගා ගැනීමටත් අවස්ථාව උදාකරයි.

**විදේශීය විශේෂ පුහුණු වැඩසටහන (OSTP)** මගින් නුදුරු අනාගතයේදී ශ්‍රී ලංකාව තුළ ඇතිවිය නොහැකි දියුණු රසායනාගාර කුසලතා හිමිකර ගැනීම සහ පුහුණුවීම් ලබාගැනීම තුළින් ජාතික ධාරිතාව නංවාලීමට සලස්වයි. එසේම අධ්‍යාපන පර්යේෂණ රාජ්‍ය ආදී ආයතන හෝ කර්මාන්තවල නියැලුන විද්‍යාඥයන්ට සහ තාක්‍ෂණිකයන් හට මෙන්ම මාධ්‍යවේදීන් හටද කර්මාන්තමය අත්දැකීම් සහ ජාත්‍යන්තරයට නිරාවරණය වීම සලයසි.

**විද්‍යාව හා තාක්‍ෂණවිද්‍යා ජාත්‍යන්තර හවුල්කාරීත්වය (IPSAT)** මෙම ක්‍රියාපටිපාටිය මගින් ශ්‍රී ලංකාවේ විද්‍යාඥයන්ට, ඉංජිනේරුවරුන්ට, විද්‍යා හා තාක්‍ෂණ ප්‍රතිපත්ති සම්පාදකයන්ට හා පර්යේෂණයන්හී නියැලුන්වුන් හට, නියමිත කාල සීමාවක් තුළ විදේශයන්හී සේවය කරන විද්‍යාඥයන් සමග ශ්‍රී ලංකාව තුළ පර්යේෂණ සහ සංවර්ධන / විද්‍යාව සහ තාක්‍ෂණවිද්‍යා සේවා පිළිබඳව සහයෝගිතා පැවරුම් සිදුකිරීමට පහසුකම් සලසයි. මෙමගින් අපගේ විද්‍යාඥ ප්‍රජාව ජාත්‍යන්තර පර්යේෂණ සහයෝගීතා තාක්‍ෂණ පැවරුම් ඇති කරගැනීමත් ශ්‍රී ලංකාව තුළදීම ගෝලීයව නිරත විය යුතු පර්යේෂණ දිසාවට විශේෂඥතාව ලබාගැනීම ප්‍රවර්ධනය කිරීම දිරිගැන්වීමත් අපේක්‍ෂා කරයි.

ශ්‍රී ලංකාවේ විද්‍යාඥයන්, ඉංජිනේරුවන් සහ සමාජ විද්‍යාඥයන් හට ශ්‍රී ලංකාවේ මායිම් ඉක්මවා ගොස් ජාත්‍යන්තර ක්ෂේත්‍රයේ සහයෝගීතා පර්යේෂණවල නියැලී වෙනත් රටවල තම සමානයන් සමග එක්වීමත් ඔවුන් සමග හවුල් පර්යේෂණ වැඩසටහන්හී නිරත වී ඒ වෙත යොමු කිරීමත් සඳහා ජාතික විද්‍යා පදනම **ජාත්‍යන්තර පර්යේෂණ වැඩසටහන් සහයෝගිතාව (ICRP)** හඳුන්වා දෙනු ලැබීණ.

**විදේශීය විද්‍යා අධ්‍යාපන වැඩසටහන (OSEP)** යනු නූතන විද්‍යාව, තාක්‍ෂණ විද්‍යාව, පර්යේෂණ සහ නවෝත්පාදනයන්හී ප්‍රවණතා පිළිබඳව ශ්‍රී ලංකාවේ පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට, ගුරුවරුන්ට, විශ්වවිද්‍යාල විද්‍යාඥයන්ට, ජාත්‍යන්තර නිරාවරණය සැපයීමට සැලසුම් කළ ක්‍රියාපටිපාටියකි. එමගින් විද්‍යාව, තාක්‍ෂණ විද්‍යාව සහ නවෝත්පාදන පිළිබඳව ඔවුන් තුළ පවත්නා දැනුම උත්ශ්‍රේණි කර දියුණු කිරීමෙන් වර්තමාන ලෝකයේ අභියෝගයන්ට මුහුණදීමේ හැකියාව හිමිකරයි.

මෙහි පහත දැක්වෙන වගුව මගින් ජාතික විද්‍යා පදනම රටෙහි විද්‍යාත්මක ප්‍රජාවට ප්‍රදාන පිරිනමන ආකාරය දැක්වෙයි. ලබාදෙන ප්‍රදාන සංඛ්‍යාව ක්‍රමයෙන් ඉහළ ගිය ආකාරයත් එමගින් විද්‍යාත්මක ප්‍රජාව මෙම ක්‍රියාපටිපාටිය තුළින් හිමි කරගත් ප්‍රයෝජන කවරේද යන්නත් එහි පෙන්වා දී ඇත.

**01 වන රූපය: ප්‍රදානය කරන ලද මූල්‍ය යෝජනා සංඛ්‍යාව**

| | ලබාදෙන ලද මූල්‍ය ප්‍රදාන සංඛ්‍යාව | | |
|---|---|---|---|
| **වර්ෂය** | **චාරිකා ප්‍රදාන ක්‍රියාපටිපාටිය** | OSTP | IPSAT |
| 2012 | 36 | 17 | 1 |
| 2013 | 43 | 19 | 3 |
| 2014 | 51 | 16 | 3 |
| 2015 | 41 | 16 | 3 |
| 2016 | 63 | 44 | 15 |
| 2017 | 60 | 38 | 11 |

## බහු - පාර්ශවික සහ ද්වි - පාර්ශවික සහයෝගිතාව

ද්වි - පාර්ශවික සහ බහු - පාර්ශවික වැඩසටහන්, රටවල් අතර, මූල්‍ය ප්‍රදාන සපයන ආයතන අතර පර්යේෂණ සහයෝගතාව ඇති කිරීමත්, රටතුළ සිදුකරන පර්යේෂණවල ගුණාත්මකභාවය දියුණු කිරීමත්, ඔවුනොවුන් අතර විද්‍යාත්මක සහයෝගතාව පිළිබඳ ජාල ඇති කිරීම දිරිමත් කිරීමත් සිදු කරයි.

එහෙයින්, ජාතික විද්‍යා පදනම ද්වි - පාර්ශවික සහ බහු - පාර්ශවික සහයෝගිතා පිහිටුවූයේ ජාත්‍යන්තර විද්‍යාත්මක සම්බන්ධතා ඉහළ දැමීම සහ සංවර්ධනය කිරීම අරමුණ ඇතිවය. මෙම වැඩසටහන්වල ඉලක්කය වනුයේ ශ්‍රී ලාංකික විද්‍යාඥයන්ට, ශාස්ත්‍රඥයන්ට, පර්යේෂකයන්ට සහ තාක්ෂණිකයන්ට තම දැනුම නංවා ගැනීමට සහ තම අන්තර්ජාතික සමානයන් සමග එකම මට්ටකට පැමිණීමේ අවස්ථා උදාකිරීමය. මෙම ක්‍රියපටිපාටිය ඔවුන්ට විද්‍යාව හා තාක්ෂණවිද්‍යාව පිළිබඳවන දැනුම හා පුහුණුව හිමි කරගෙන ජාත්‍යන්තර ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන්වලට යොමුවීමට අවස්ථාව සලසා දෙයි.




01 වන රූපය: ජාතික විද්‍යා පදනමේ ජාත්‍යන්තර හවුල්කාරීත්ව

## ද්වි - පාර්ශවික සහයෝගතාව

පසුගිය වසර කිහිපය තුළදී වැඩි අවධානයක් යොමුකර ඇත්තේ, අපගේ විද්‍යාඥයන්ගේ විද්‍යා සහ තාක්ෂණවිද්‍යා කුසලතා සහ ධාරිතා නංවාලීමේ අපේක්ෂා සහිත ද්වි - පාර්ශවික විද්‍යාත්මක සහයෝගතා ඇති කර ගැනීමටය. ජාතික විද්‍යා පදනම ඇමෙරිකා එක්සත් ජනපදය, කැනඩාව, ජර්මනිය, චීනය සහ ජපානය යන රටවල විද්‍යාඥයන්ද සහභාගි වූ ද්වි - පාර්ශවික විද්‍යාත්මක සහයෝගිතා රැස්වීම් කිහිපයක් **"ජාතික විද්‍යා පදනමේ ගෝලීය හවුල්කාරීත්වය"** තේමා කරගනිමින් 2016 සැප්තැම්බර් මාසයේදී කොළඹදී පවත්වනු ලැබීය.

මෙම රැස්වීම්වල ප්‍රධාන අරමුණු වූයේ ශ්‍රී ලංකාව සමග සහයෝගීතාව



02 වන රූපය: පකිස්ථාන විද්‍යා පදනම සමග ගිවිසුම අත්සන් කිරීම




**03 වන රූපය: ජාතික විද්‍යා පදනම සහ චීනයේ ජාතික ස්වභාවික විද්‍යා පදනම සමග පැවති පළමු වැඩමුළුව**

දැක්විය හැකි එම රටවල පවතින පර්යේෂණ පද්ධති සහ අවස්ථා සාකාච්ඡා කිරීමය. ජාතික විද්‍යා පදනම, ඉහත සඳහන් රටවල් සමග සහයෝගිතාවයෙන් යුතුව සිදුකරන මූලික ක්‍රියාකාරකම් ගණනාවක් හඳුනාගෙන ඇත. දැනටමත් මෙම රටවල් සමග සහයෝගිතා සම්බන්ධකම් පිහිටුවා ගෙන ඇති දේශීය විද්‍යාඥයන් කිහිප දෙනෙකුට ද මෙම රැස්වීම් සඳහා ආරාධනය කරනු ලැබීය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ජාතික විද්‍යා පදනම සඳහන් කළ රටවල් අතරින් සමහරක් සමග අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමටද හැකියාව ලැබී ඇත.

2016 දී පකිස්තානු විද්‍යා පදනමක් සමග ජාතික විද්‍යා පදනම අත්සන් කළ අවබෝධතා ගිවිසුම යටතේ ශ්‍රී ලංකික විද්‍යාඥයන්ට තම තමන්ගේ පර්යේෂණ ක්ෂේත්‍රවලට අයත් දෙරටේ ආයතනවලින් සපයන ඒකාබද්ධ සම - මූල්‍යාධාර භාවිතයෙන් සහයෝගිතා පර්යේෂණ වැඩසටහන් ආරම්භ කිරීමේ අවස්ථාව සැලසී ඇත.

දිවිපෙවෙත, විශේෂයෙන්ම ජල සුරක්ෂිතතාව, නොදන්නා හේතු නිසා ඇතිවන කාලික වකුගඩු රෝග ආදිය හා සම්බන්ධ ගැටලු නිරාකරණය කරගැනීමේ අපේක්ෂාවෙන් යුතුව ජාතික විද්‍යා පදනම 2017 ජූලි මාසයේදී **"දේශගුණික වෙනස් වීමට අනුවර්තනය, පරිසරය සහ සෞඛ්‍යය"** තේමා කරගෙන චීන විද්‍යා පදනම සමග ප්‍රථම ඒකාබද්ධ වැඩමුළුව පවත්වනු ලැබීය. ඉන් ඉක්බිතිව ආයතන දෙකෙහි සම - මූල්‍ය ආධාර යොදාගන්නා ඒකාබද්ධය පර්යේෂණ යෝජනා ලබාගනු ලැබීය. ජාතික විද්‍යා පදනම 2016 දී චීන ජාතික විද්‍යා පදනම සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කරනු ලැබීය. තවදුරටත් දැක්වුවහොත්, ජාතික විද්‍යා පදනම, ජාතික විද්‍යා හා තාක්ෂණ නියෝජිත ආයතනය සමග 2017 දී අවබෝධතා ගිවිසුමක් අත්සන් කරනු ලැබීය. දෙරටේ එකඟතාව මත **"පශු ගොවිපොළ හා කෘෂිකර්මයෙහි ජානමය සම්පත්"** තේමා කරගෙන පැවතීමට යෝජිත ඒකාබද්ධ වැඩමුළුවකින් පසුව පැවැත්වීමට නියමිත ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන් සංවිධානය කරමින් පවතියි. මෙම වසරේ ඔක්තෝම්බර් මාසයේදී පැවැත්වීමට නියමිත ඉහත වැඩමුළුවට මෙම ක්ෂේත්‍රයන්හී නියැලී දෙරටේම විද්‍යාඥයන් හා පර්යේෂකයන් ගණනාවක් සහභාගී වනු ඇත. මෙයට අමතරව පසුගිය අප්‍රේල් මාසයේදී ජාතික විද්‍යා පදනම "ජර්මානු විද්වත් හුවමාරු සේවාව" සමග අත්සන් කළ අවබෝධතා ගිවිසුම මගින් උසස් අධ්‍යාපන සහ පර්යේෂණ ක්ෂේත්‍රයන්ට ප්‍රතිලාභ හිමිවනු ඇත. එහෙයින් ව්‍යාපෘති පදනම් පුද්ගල හුවමාරු වැඩසටහන විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල පර්යේෂකයන්ගේ ගුණාත්මකභාවය ඉහළ නංවාලීමට උපයෝගී කරගැනීමට පුළුවන.

## බහු පාර්ශවීය සහයෝගතාව

බහු - පාර්ශවික විද්‍යාත්මක සහයෝගීතාව පිළිබඳව ගත්කළ ජාතික විද්‍යා පදනම ජාත්‍යන්තර විද්‍යාත්මක ආයතන ගණනාවකටම කේන්ද්‍රීය මධ්‍යස්ථානය වෙමින් පාලන කාර්යභාරයක් ඉටුකරයි. මෙම ආයතන අතරින් පහත දැක්වෙන ආයතන සමග දැනටමත් ශ්‍රී ලංකාව ඉතා සමීපව කටයුතු කරයි.

අ.) අන්තර්ජාතික ජාන ඉන්ජිනේරුමය සහ ජෛවතාක්ෂණ මධ්‍යස්ථානය (ICGEB)

ආ.) ජාත්‍යන්තර විද්‍යා කවුන්සිලය (ISC)

ඇ.) විද්‍යාව පිළිබඳව ලෝක ඇකඩමිය (TWAS)

ඈ.) ගෝලීය පර්යේෂණ කවුන්සිලය (GRC)

ඉ.) යුනෙස්කෝ වැඩසටහන

ඊ.) ආසියානු විද්‍යා කවුන්සිලය (SCA)

ශ්‍රී ලාංකික විද්‍යාඥයන්හට අන්තර්ජාතික ජාන ඉංජිනේරු සහ ජෛවතාක්ෂණ මධ්‍යස්ථාන සහයෝගිතා පර්යේෂණ වැඩසටහනට සහ මුල් වාහක පර්යේෂණ ප්‍රදාන ක්‍රියාපටිපාටිය සඳහා වාර්ෂිකව පර්යේෂණ යෝජනා ඉදිරිපත් කිරීමේ අවස්ථාව ලබාදී ඇත. ඒ අතර අන්තර්ජාතික ජාන ඉංජිනේරු සහ ජෛවතාක්ෂණ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය 2018 දී පැවැත්වූ රැස්වීමේදී, ශ්‍රී ලංකාවට තම යෝජනා එම ආයතනයේ දකුණු ආසියානු කලාපීය පර්යේෂණ මධ්‍යස්ථානයට භාරදීමට අවස්ථාව සලසා ඇත. මෙම යෝජිත කලාපීය මධ්‍යස්ථානය පිහිටුවීමට අදහස් කර ඇත්තේ ශ්‍රී ලංකාවෙහිය. ඒ සඳහා වන අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම සලකා බලමින් පවතියි. මේ අතර පර්යේෂණ සහායකයන්ට දීමනා ගෙවීම සඳහා හවුල් වියදම් දැරීම පිළිබඳව වන අවබෝධතා ගිවිසුමකටද ජාතික විද්‍යා පදනම සහ අන්තර්ජාතික ජාන ඉංජිනේරු සහ ජෛවතාක්ෂණ මධ්‍යස්ථානය අතර අත්සන් කිරීමට සැලසුම්කර ඇත. මේ සඳහා එම ආයතනය සහ මුල් වාහක පර්යේෂණ වැඩසටහන අවශ්‍ය අරමුදල් සැපයීමට යෝජිතය.

ජාත්‍යන්තර විද්‍යා කවුන්සිලය යටතේවන වැඩසටහන තුළින් තිරසර සංවර්ධනය හා දේශගුණ වෙනස්කම් ආදිය පිළිබඳව කටයුතු කිරීමට ජාතික විද්‍යා පදනම අපේක්ෂා කරයි. විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යුරෝපීය පරමාණු පර්යේෂණ සංවිධානය (CERN) සමග 2016දී එළැඹි අවබෝධතා ගිවිසුම යටතේ ජිනීවා නුවර යුරෝපීය පරමාණු පර්යේෂණ ආයතනයෙහි ග්‍රීෂ්ම සෘතු ශිෂ්‍ය වැඩසටහනට සහභාගිවන, ශ්‍රී ලංකා ශිෂ්‍යයන්හට එම වැඩසටහන පවතින කාලය තුළ අවශ්‍ය මූල්‍යාධාර සැපයීම ජාතික විද්‍යා පදනම සිදුකරනු ලැබීය. ජාතික විද්‍යා පදනම, ලෝක විද්‍යා ඇකඩමිය සමග සුසංගමය කරනුයේ, ජෛවවිද්‍යාව, රසායන විද්‍යාව, ගණිතය සහ භෞතික විද්‍යාව යන විද්‍යා ක්ෂේත්‍රයක ඉහළම මට්ටමේ විශිෂ්ටම පර්යේෂණ හැකියාව ලද නිපුණ තරුණ විද්‍යාඥයකුට වාර්ෂිකව තරුණ විද්‍යාඥ ත්‍යාගය පිරිනැමීමටය.

මිනිසා සහ ජෛවගෝලය වැඩසටහන 1968දී යුනෙස්කෝ ජෛවගෝල සම්මන්ත්‍රණයෙන් ලද සෘජු ප්‍රතිඵලයකි. එය ශ්‍රී ලංකාවෙහි ආරම්භ කරනු ලැබුයේ 1971දීය. ජාතික මිනිසා සහ ජෛවගෝල කමිටුව සඳහා සංග්‍රහකත්වය සපයනුයේ, ජාතික විද්‍යා පදනමය. මිනිසා සහ ජෛවගෝල වැඩසටහන යනු මිනිසා සහ ඔවුන් වෙසෙන පරිසරය අතර යහපත් සබඳතාවක් සලසාලන අන්තර්ජාතික විද්‍යාත්මක වැඩසටහනකි. ඒ සඳහා ස්වභාවික සහ සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව සහ අධ්‍යාපනය එකිනෙකට සම්බන්ධ වෙමින් මානව දිවිපෙවෙත නංවාලීමට සහ ස්වභාවික පරිසර පද්ධතිය ආරක්ෂා කිරීමට සුදුසු පරිදි ස්වභාවික සම්පත් සංවර්ධන කරයි. එමගින් සමාජයීය සහ සංස්කෘතිකමය වශයෙන් උක්ත සහ පරිසරමය තිරසාරත්වය සහිත ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කරන නව්‍ය වූ ප්‍රවේශයන් සපයයි. නවසීලන්ත ව්‍යාපාර නව්‍යකරණ සහ රැකියා අමාත්‍යාංශය සමග එක්ව, ජාතික විද්‍යා පදනම 2001 නොවැම්බර් මාසයේදී ගෝලීය පර්යේෂණ කවුන්සිලයේ ආසියා - ශාන්තිකර කලාපීය රැස්වීමට සම - සංවිධායකත්වය සැපයීය. මෙම රැස්වීමට රටවල් 20ක පර්යේෂණ සඳහා මූල්‍යාධාර සපයන ආයතන නියෝජනය කරමින් නියෝජිතයන් 37 දෙනෙකු සහභාගී වූහ. මෙම රැස්වීමේදී **"විද්‍යාව සඳහා ජාත්‍යන්තර සබඳතා මෙහෙයුම සහ සම පදස්ථ සමාලෝචනය"** යන තේමා දෙක සාකච්ඡාවට ලක්විය. ගෝලීය, කලාපීය සහ ජාතික අවශ්‍යතා සහ ප්‍රස්තුත විසඳීම සඳහා දියුණුවන විද්‍යාවෙහි කාර්යභාරය මෙන්ම ගෝලීය පර්යේෂණ කවුන්සිලය, විද්‍යා ජාත්‍යන්තර සබඳතා මෙහෙයුම සඳහා දැනටමත් කර ඇති කාර්යභාරය හඳුනාගත් නියෝජිතයන් මෙම සංකල්පයට සහාය දැක්වීය.

විද්‍යාව තුළින් ලෝකය යාකිරීම උදෙසා ලොවපුරා බොහෝ රටවල් දශක ගණනාවක් තිස්සේ ජාත්‍යන්තර සබඳතා මෙහෙයුම මෙවලමක් ලෙස විද්‍යාව යොදා ගෙන ඇත. "ජාත්‍යන්තර සබඳතා මෙහෙයුම" සඳහාවන එක් ක්‍රියාකාරකමක් ලෙස විද්‍යාත්මක සහයෝගතාව යොදාගැනෙයි. අපගේ රට මුහුණ දී ඇති සෞඛ්‍යය, ආර්ථික වර්ධනය, දේශගුණ වෙනස්කම් ආදී අභියෝග අතරින් බොහොමයක් විසඳීමට අන්තර්ජාතික සබඳතා තුළින් පුළුවන. එහෙයින් අපගේ විද්‍යාඥයන්, තාක්ෂණ විද්‍යාඥයන්, පර්යේෂණ ආයතන, රජයේ සහ පෞද්ගලික අංශයේ විශ්වවිද්‍යාල ආදිය සමාජ සමානත්වය, දරිද්‍රතාවය තුරන් කිරීම සහ අනෙකුත් සමාජ අවශ්‍යතා දෙස විමසුම් ඇස යොමුකර, අවශ්‍ය අවස්ථාවන් සඳහා විදේශීය සහයෝගතාව තුළින් ලද හැකි යෙදවුම් දේශීය තත්වයට ගැලපෙන සේ අනුවර්තනය කර විසඳුම් සෙවීමට ඉදිරිපත් විය යුතුය.



ජාතික විද්‍යා පදනම
ජාත්‍යන්තර සබඳතා අංශය
අංශ ප්‍රධානී
**වසන්ත අනුරුද්ධ**
anurudha@nsf.ac.lk
0715319379

# සංවර්ධනය වෙමින් පවතින දේශයක විද්‍යාත්මක පර්යේෂණ

ආචාර්ය ගීතිකා යාපා




විද්‍යාත්මක පර්යේෂණ යනු විද්‍යාත්මක න්‍යාය සහ කල්පිත (උපන්‍යාස) පිළිබඳව සිදුකෙරෙන විධිමත් විමර්ශනයයි. එහෙයින් එය දැනුමෙහි පදනමය. දැනුම යනු ආර්ථික වර්ධනයෙහි අත්‍යවශ්‍ය නිර්ණායකයකි. දැනුම, ජනතාවගේ යහපැවැත්ම උදෙසා සමාජය විසින් නිර්මාණය කරන, සන්නිවේදනය කරන සහ භාවිත කරනු ලබන්නකි. කාර්යමූල ක්‍රියාවලියක් තුළින් දැනුම ජාතික සංවර්ධනයට යොමුකරවන සමාජයීය සහ තාක්ෂණ විද්‍යාත්මක නවෝත්පාදන සඳහා වන ප්‍රධාන මෙහෙයුම්කරුවකු ලෙස විද්‍යාත්මක පර්යේෂණ හැඳින්වීමට පුළුවන. කුසලතා පූර්ණ මානව සම්පත්, ජාතික හා තාක්ෂණිකමය වශයෙන් අනුවර්තනයවීමේ හැකියා මට්ටම මෙන්ම පවතින තොරතුරු තාක්ෂණ පහසුකම් ආදිය රටෙක ආර්ථික වර්ධනය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කිරීමට සමත්ය.

පර්යේෂණ හා සංවර්ධනය තුළින් උත්පාදනය කරනු ලබන නවදැනුම හිමිකර ගැනීමේ හිඟපාඩුවට වැඩිවශයෙන්ම ගොදුරු විය හැක්කේ තුලනාත්මකව කුඩා ආර්ථික සහිත, වැඩි ජනගහනයක් වෙසෙන ඉහළ දරිද්‍රතා අනුපාතයක් සහිත, විද්‍යාත්මක පර්යේෂණ පැවැත්වීමට, ඒවාට අනුවර්තනය වීමට මෙන්ම භාවිතයට ද සීමිත තාක්ෂණ ධාරිතාවක් පමණක් තිබෙන සංවර්ධනය වෙමින් පවතින රටවලටය. සංවර්ධනය වෙමින් පවතින රටවලට පර්යේෂණ සිදුකිරීමේදී සැලකිය යුතු අභියෝග රාශියකට මුහුණදීමටද සිදුවෙයි. මූල්‍ය පහසුකම් ප්‍රමාණවත් තරම් නොමැති වීම, යටිතල පහසුකම් සීමිත සහ දුර්වල තත්වයක පැවතීම, සහාය සේවා ප්‍රමාණවත් නොවීම, දැඩි සහ අනම්‍ය සැපයුම් සේවා පැවතීම, අනවශ්‍ය අන්දමින් ඇඟිලි ගැසීම්, බාධා කිරීම් සහ හිරිහැර කිරීම් පැවතීම ආදී හේතු, පර්යේෂණ ප්‍රගතිය හීන කිරීමට සමත්ව ඇත. එසේම පර්යේෂණ සිදුකිරීමට දිරිමත් කරන රාජ්‍ය අනුග්‍රහය සහ ඒ සඳහා උචිත ප්‍රතිපත්ති නොමැතිකම වැනි සාධකද මෙම රටවල විද්‍යාඥයන් පර්යේෂණවල නිරත වීම සීමා කරවයි.

රටෙක ආර්ථික සංවර්ධනයෙහිලාවන අත්‍යවශ්‍ය අවශ්‍යතාවක් ලෙස විද්‍යාව හා තාක්ෂණවිද්‍යාව ප්‍රවර්ධනය කිරීම සහ ඒවායෙහි අවසන් ඵල නෙලා






**ජාතික විද්‍යා පදනමේ කිළිණ ප්‍රදාන උළෙල - 2018**

භුක්ති විඳීම සැලකිය යුතුය. මෙයට කදිම උදාහරණයක් ලෙස, වසර 50ක පමණ කාලයක් තුළ පර්යේෂණ, සංවර්ධන සහ නවෝත්පාදන වෙනුවෙන් සිංගප්පූරුව සිදුකළ ආයෝජන හේතුකොට අදවනවිට එරට සමෘද්ධිමත් සංවර්ධන රටක් බවට පත්වීම දැක්විය හැකිය. කාලෝචිත ජාතික විද්‍යා සහ තාක්ෂණවිද්‍යා සැලසුම් 5ක් ක්‍රියාවට නැංවීම තුළින් සිංගප්පූරුව මේ වනවිට නවෝත්පාදනය මගින් මෙහෙයවන දැනුම පදනම්වූ ආර්ථිකයක් බවට පත්ව ඇත. 2016 - 2020 කාලය එරට පර්යේෂණ සහ සංවර්ධන සඳහා දැරීමට යෝජිත රාජ්‍ය අයවැය ඩොලර් මිලියන 19කි.

විද්‍යාව සහ තාක්ෂණවිද්‍යාව ප්‍රවර්ධනය තුළින් දරිද්‍රතාවයේ සිට කාර්මිකරණය වූ දේශ ලෙස සංවර්ධනය වූ තවත් රටවල් දෙකක් ලෙස කොරියාව සහ තායිවානය හැඳින්වීමට පුළුවන. කොරියාව මෙම ක්‍රියාකාරකම් ආරම්භ කරනු ලැබුයේ 1962 දී ප්‍රථම ආර්ථික සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමත් සමඟය. අද එරට, ප්‍රධාන වශයෙන්ම විද්‍යාව සහ තාක්ෂණවිද්‍යාව මගින් මෙහෙයවනු ලබන ශක්තිමත් ආර්ථිකයකට හිමිකම් කියයි.

ආසියානු කලාපයේ සංඛ්‍යා ලේඛනවලට අනුව (www.rdmag.com) ඉන්දියාව, දකුණු කොරියාව, ජපානය සහ චීනය යන රටවල් එකමුතුව ගත්කළ ගෝලීය පර්යේෂණ සහ සංවර්ධන ආයෝජන 44% ක් පමණ දරති. එහිදී චීනය 21.68% ක දායකත්වයකට හිමිකම් දක්වයි. වර්ෂ 2014 දී කොරියානු සමූහාණ්ඩුව සිය දළ දේශීය නිෂ්පාදනයෙහි ප්‍රතිශතයක් ලෙස පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් සඳහා දැරූ දළ වියදම් දායකත්වය (GER) 4.23කි. සිංගප්පූරුවෙහි එම ප්‍රතිශතය 2.02ක්ද චීනයේ 2.07ක්ද විය. මේ සියළු රටවල් දැන් දියුණු විද්‍යාවේ හා තාක්ෂණවිද්‍යාවේ මහිමය හේතුකොට ශක්තිමත් ආර්ථික සහිත සංවර්ධිත රටවල්ය. සංවර්ධිත රටක් ලෙස සැලකුවද පර්යේෂණ හා සංවර්ධන සඳහා ඉන්දියාවේ දායකත්වය දළ දේශීය නිෂ්පාදනයෙන් 0.62%ක් තරම් වූ තුළනාත්මකව ගත් කළ සුළු ප්‍රමාණයකි.

මේ හා සම්බන්ධ ශ්‍රී ලංකාවේ තත්වය විමසා බලන විට පෙනෙනුයේ අවරට යාමකි. පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා 1966 දී දළ ජාතික නිෂ්පාදනයෙන් 0.3%ක් යෙදවූ අතර 2013 දී එය 0.11%ක් දක්වා පහළ බැස්සේය. 1960 - 2013 කාලය තුළ මෙම සංඛ්‍යා ලේඛන දෙක අතර පරාසයක මෙම ආයෝජන පැවතී ඇත.

ශ්‍රී ලංකාව පර්යේෂණ හා සංවර්ධනය සඳහා සිය දළ දේශීය නිෂ්පාදිතයෙන් ඉහළම ආයෝජනය සිදුකර ඇත්තේ 1974 දීය. එය 0.4%කි. වර්ෂ 2013 - 2015 දක්වා කාලය තුළදී පර්යේෂණ සඳහා වෙන්කරන මුදල් ප්‍රමාණයේ කිසිදු වැඩිවීමක් සිදුව නැත. විද්‍යාවට හා තාක්ෂණවිද්‍යාවට රජය දක්වන මෙම අඩුසැලකිල්ල විද්‍යාත්මක ප්‍රජාවගේ මහත් කණස්සල්ලට හේතුවී ඇත.

2015 වර්ෂයේ ශ්‍රී ලංකාවේ පර්යේෂණ පදනම, මෙරට ජනගහනයෙන් දස ලක්ෂයකට පර්යේෂකයන් 292 (මුළු සංඛ්‍යාව) ක් සහ දීර්ඝ කාලීනව ගත් කළ 106කට සමාන සංඛ්‍යාවකින් පමණක් සමන්විතය. එසේ වුවද කුසලතා පූර්ණ පර්යේෂකයන් එයට වඩා විශාල සංඛ්‍යාවක් ශ්‍රීලංකාවේ සංවර්ධනය සඳහා අවශ්‍යයය. වර්ෂ 2015 දී අපගේ පූර්ණකාලීන පර්යේෂකයන් සංඛ්‍යාව සමන්විත වුයේ සුදුසුකම් ලත් ආචාර්ය උපාධිධාරීන් (PhD) 944, දර්ශනපති (MPhill) උපාධිය ලත් 266, විද්‍යාශූරි (MD/MSs) සුදුසුකම් ලත් 640 සහ විද්‍යාපති (MSc) 609ක් වැනි සුළු ප්‍රමාණයකිනි.

වර්ෂ 1970 සිටම ජාතික විද්‍යා පදනම සහ එහි පූර්වගාමීන්, ශ්‍රී ලංකාවේ විද්‍යාව සහ තාක්ෂණවිද්‍යාව ප්‍රවර්ධනය කරන ප්‍රමුඛ රාජ්‍ය ආයතනය ලෙස ශ්‍රී ලංකාව තුළ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සලසා ඇත. ජාතික විද්‍යා කවුන්සිලය (1968) සහ ස්වභාවික සම්පත්, බලශක්ති සහ විද්‍යා අධිකාරිය (නරේසා) (1982) වෙනුවට 1994 විද්‍යා සහ තාක්ෂණවිද්‍යා සංවර්ධන පනත යටතේ සංස්ථාපිත ජාතික විද්‍යා පදනම ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණවිද්‍යා අංශ සඳහා සේවා සැපයීමත්, ඒවා ශක්තිමත් කිරීමත් සඳහාවන වරම ලබා ඇත. දැනුම පදනම් ආර්ථිකයක් සඳහාවන මඟ හෙළි පෙහෙළි කිරීමට විද්‍යාව සඵල කර මෙහෙයවමින් සාර්ථක කරගැනීමේ කාර්යමාර්ගයේ පෙරමුණ ජාතික විද්‍යා පදනම ගෙන ඇත.

ගෙවීගිය වසර 50ක ගමන් මඟ තිස්සේ ජාතික විද්‍යා පදනම හා එහි පූර්වගාමීන් ජාතික පර්යේෂණ සහ සංවර්ධන පදනම ශක්තිමත් කිරීම සඳහා බොහෝ අත්‍යවශ්‍ය සහ වැදගත් යාන්ත්‍රණයන් ස්ථාපනය කර ඇත. සිය විද්‍යාඥමය වෘත්තීය ජීවිතයෙහි කූටප්‍රාප්තිව සිටින බොහෝ ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන් මෙන්ම නැගී එන තරුණ පර්යේෂකයන්ද තම පර්යේෂණ කාර්යයන් හී මූලාරම්භය සඳහා අවශ්‍ය ප්‍රථම පර්යේෂණ ප්‍රදාන ලබාගෙන ඇත්තේ ජාතික විද්‍යා පදනමෙන් හෝ එහි පූර්වගාමීන් වූ ආයතන දෙකින් එකකින්ය.

විද්‍යාවෙහි හා තාක්ෂණවිද්‍යාවෙහි සියළු ක්ෂේත්‍රයන්හී නියැලි විද්‍යාඥයන්ගේ ශක්‍යතාව ප්‍රවර්ධනය සඳහාවන ක්‍රියාකාරකම් රාශියක් සහ ප්‍රදාන ක්‍රම ගණනාවක් පෙළගස්වා ඇත. පර්යේෂණ යටිතල පහසුකම් සංවර්ධනය, තාක්ෂණ විද්‍යාත්මක පැවරීම් සඳහා අරමුදල්, දැනුම නිර්මාණය සහ හුවමාරු කරගැනීම, ජාත්‍යන්තර සහයෝගීතාව අභිවර්ධනය සහ විද්‍යාව ප්‍රචලිතකිරීමවැනි ක්‍රියාකාරකම් තුළින් ජනතාවගේ ජීවන තත්වය දියුණුකිරීමට ඉවහල්වන ආර්ථික ජයග්‍රහණ හිමිකර ගැනීමට මඟ හෙළිපෙහෙළි කෙරී ඇත.

දීර්ඝ කාලයක් තිස්සේ පැවත එන පර්යේෂණ සහය ක්‍රියාපටිපාටියක් වන, **තරඟකාරී පර්යේෂණ ප්‍රදාන**

**ක්‍රමය** මේ වනවිට පර්යේෂණ ප්‍රදාන 2600කට වැඩි සංඛ්‍යාවක් ලබා දී ඇත. මෙම ප්‍රදාන තුළින් සතු කරගෙන ඇති වැදගත් ප්‍රතිඵලවනුයේ පශ්චාත් උපාධි මට්ටමේ තරුණ හා නැගී එන විද්‍යාඥයන් පුහුණු කිරීම, ඔවුනට ආචාර්ය (PhD) සහ දර්ශනපති (MPhil) ආදී උපාධි ලබාගැනීමට පහසුකම් සැලසීම සහ එමගින් දැනුම පාදිත ආර්ථිකයක් දෙසට රට යොමු කිරීමට අවශ්‍ය ප්‍රධාන අවශ්‍යතාව සම්පූර්ණ කිරීමත්ය.

තවදුරටත් සඳහන් කළහොත් දේශීය හා අන්තර්ජාතික ශාස්ත්‍රීය සඟරා (ජර්නල) හී පළවූ පර්යේෂණ පත්‍රිකා මෙන්ම පර්යේෂණ සන්නිවේදකයන්ද නව සොයාගැනීම් සමගින් දැනුම පදනම ශක්තිමත් කිරීමට සමත්ව ඇත.

පසුගිය දශකය තුළ විද්‍යාත්මක පර්යේෂණ සඳහා භාණ්ඩාගාරය මගින් සැපයෙන මුදල් වෙන්කිරීම පහළ බැස ඇතත්, වාර්ෂිකව පළකෙරෙන විද්‍යාත්මක ප්‍රකාශන සංඛ්‍යාව ප්‍රගතිගාමීව ඉහළ යාම තුළින් ශ්‍රී ලාංකික විද්‍යාඥයන්ගේ පර්යේෂණ සොයාගැනීම්හී උසස් ගුණාත්මක බව සහ පිළිගැනීම දැකිය හැකිය.

ජාතික පර්යේෂණ ප්‍රමුඛතාවන්ට යොමුවීම සඳහා 2010 වර්ෂයේදී ආරම්භ කළ **ජාතික තේමාගත පර්යේෂණ වැඩසටහන,** මෙහෙයක් පෙරදැරි කරගත් බහු ශික්ෂණ සහයෝගිතා පර්යේෂණ වැඩසටහනකි. මෙම ගිවිසුම්ගත පර්යේෂණ ප්‍රදාන මගින් අපේක්ෂා කරනුයේ පර්යේෂණ ගැටළුව සඳහා සමස්ත සහ අන්තර්ගත විසඳුම් ලබාදීමටය. මෙම ක්‍රියාපටිපාටිය යටතේ ප්‍රදාන ලබාදුන් ප්‍රථම තේමාව වූයේ ආහාර සුරක්ෂිතතාවයය. මේ වනවිට එය සාර්ථකව අවසන් වී ඇති අතර ඉන් ලද සමහර ප්‍රතිඵල රජය විසින් දැනටමත් ක්‍රියාත්මක කර අවසන්ය. ජල සුරක්ෂිතතාව, දේශගුණික වෙනස්කම් හා ස්වභාවික ව්‍යසන යන තේමා දෙක යටතේ විද්‍යාත්මක විමර්ශන මේ වනවිට සිදුවෙමින් පවතියි. දේශගුණික වෙනස්කම් සහ ස්වභාවික ව්‍යසන තේමාව සංවර්ධනය කර ඇත්තේ, දේශගුණික වෙනස්කම් සහ එහි බලපෑම් යටපත් කිරීම සඳහා හදිසි ක්‍රියාමාර්ග ගැනීම් අවශ්‍යතාවය, දක්වන තිරසර සංවර්ධන 13වන ඉලක්කය ශාක්ෂාත් කර ගැනීමේ අපේක්ෂාව ඇතිවය. මෙම තේමාව යටතේ ලබාදුන් ප්‍රදාන මගින් මෙහි ප්‍රධාන ඉලක්ක (13.1, 13.2 සහ 13.3 ඉලක්ක) සාක්ෂාත් කරගැනීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කළ හැකිය. ජල සුරක්ෂිතතාව සඳහාවන ජාතික තේමාගත පර්යේෂණ වැඩසටහන, ජල ක්ෂේත්‍රය පිළිබඳ දේශීය කලාපීය සහ ගෝලීය ප්‍රස්තුත සළකා බැලෙන තිරසර සංවර්ධන 6 වන ඉලක්කයෙහි අපේක්ෂා අනුව ක්‍රියාත්මක වෙයි.

2004 වර්ෂයේදී ජාතික විද්‍යා පදනම මගින් ආරම්භ කරන ලද **පර්යේෂණ ශිෂ්‍යත්ව ක්‍රියාපටිපාටියද,** පශ්චාත් උපාධි පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහාවන තවත් පර්යේෂණ සහාය ක්‍රියාපටිපාටියකි. වර්ෂ 2008 - 2017 කාලය තුළදී ආචාර්ය උපාධි (PhD) සහ දර්ශනපති (MPhil) උපාධි හිමිකර ගැනීම උදෙසා අවශ්‍ය පර්යේෂණ සිදුකිරීම සඳහා කැපී පෙනෙන තරුණ උපාධිධාරීන් සහ ඉංජිනේරුවන් 58 දෙනෙකුට මෙම ක්‍රියාපටිපාටිය ඔස්සේ ප්‍රදාන පිරිනමා ඇත. එසේම පශ්චාත් ආචාර්ය පර්යේෂණ විද්‍යාඥ ප්‍රදාන ක්‍රියාපටිපාටිය නැවුම් ආචාර්ය (PhD) උපාධිධාරීන් හට සිය පශ්චාත් උපාධි පර්යේෂණ ශ්‍රී ලංකාව තුළම සිදුකිරීමට ආකර්ෂණය කිරීමත් සිදුකර ඇත. මෙම ප්‍රදාන ක්‍රියාපටිපාටි තුන රටෙහි විද්‍යාත්මක මානව සම්පත් පදනම ශක්තිමත් ලෙස සංවර්ධනය කිරීමට සැලකිය යුතු අන්දමින් දායක වී ඇත.

ගෝලීය සංවර්ධනයත් සමග ශ්‍රී ලංකාවට එකට සිට ගැනීමට නම්, පුහුණු හා කුසලතා පූර්ණ පර්යේෂණ හා සංවර්ධන කටයුතුවල නියැලුනවුන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් බිහිකර ඔවුන්ව දිගින්දිගටම පෝෂණය කර රැකබලා ගැනීම අත්‍යාවශ්‍යය. මෙම අවශ්‍යතාවය අනුව යමින් ජාතික විද්‍යා පදනම වර්ෂ 2011 සිට **පර්යේෂණ උපාධි අධීක්ෂකයන් හට සහය වීමේ ක්‍රියාපටිපාටියක්** ආරම්භ කළේය. එමගින් විද්‍යාව හා තාක්ෂණවිද්‍යාව අංශයන්හී සියළු, ක්ෂේත්‍රයන්ට අයත් පර්යේෂණ සිදුකරන පශ්චාත් උපාධි ශිෂ්‍යශිෂ්‍යාවන් අධීක්ෂණයේ යෙදෙන ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන් / ඉංජිනේරුවරුන් දිරිගැන්වීමට, සහායවීමට සහ පිළිගැනීමට ලක්කිරීම සිදුකරයි. එසේම විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතනවලට පශ්චාත් උපාධි පර්යේෂණ පුහුණු වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැලසීමද මෙම ක්‍රියාපටිපාටිය දිරිගන්වයි. වර්ෂ 2012 - 2017 අතර කාලය තුළ අධීක්ෂණ කණ්ඩායම් 218කට මෙම ක්‍රියාපටිපාටිය යටතේ ප්‍රදාන හිමිකර දී ඇත.

පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන්හී නියැලුනවුන් සිය කටයුතු කිරීමේදී මුහුණ දෙන ප්‍රධාන සීමා කිරීම් අතර විද්‍යාත්මක සාහිත්‍ය ප්‍රකාශනවල අධික මිල දැක්විය හැකිය. විද්‍යාඥයන් හට පෞද්ගලිකව මෙන්ම බොහෝ විද්‍යා පුස්තකාලවලටද, දත්තසමුදා සහ ශාස්ත්‍රීය සඟරා (ජර්නල්) සඳහා මූල්‍ය දායකත්වය සැපයීම කළ නොහැකි ඒ මිල දරාගැනීම අසීරු කාර්යයක් වී ඇත. ජාතික විද්‍යා පදනමේ, ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය මෙම පරතරය පියවීමට පියවර ගෙන ඇත. එය විද්‍යාත්මක ප්‍රජාව සඳහා කාර්යක්ෂම ව්‍යාප්ති සේවාවක් මෙන්ම දත්තසමුදා ඇතුළත් යාවත්කාලීන සාහිත්‍යයක් වෙත ප්‍රවේශය ද සපයා ඇත.

ජාතික විද්‍යා පදනමේ, ශාස්ත්‍රීය සඟරාව (ජර්නලය), 'ක්ලැරිවේට් ඇනලිටික්ස්' හී විද්‍යා උද්ධාර සූචියෙහි (සයන්ස් සයිටේෂන් ඉන්ඩෙක්ස්) ලැයිස්තු ගතකර ඇති ශ්‍රී ලංකාවේ එකම විද්‍යා ජර්නලය වෙයි. මෙම ජර්නලය ප්‍රකාශ කිරීම තුළින් ජාතික විද්‍යා පදනම මෙරට විද්‍යාඥයන්ට සිය පර්යේෂණ ප්‍රතිඵල ගෝලීය ග්‍රාහක පිරිසක් වෙත ව්‍යාප්ත කළ හැකි මාර්ගයක් විවෘත කර ඇත. ජාතික විද්‍යා පදනම විසින් පවත්වා ගෙන යනු ලබන දෙවන




පර්යේෂණ කළමනාකරණය පිළිබඳ වැඩමුළුව - 20017

ශාස්ත්‍රීය සඟරාවවන 'සමාජ විද්‍යාව පිළිබඳ ශ්‍රී ලංකා ජර්නලය' අපගේ පර්යේෂකයන් විසින් සිදුකරන සමාජ විද්‍යා පර්යේෂණ තොරතුරු පළකරයි. පසුගිය වසර තුනක කාලය තුළ ජාතික විද්‍යා පදනමේ ජර්නල ප්‍රකාශන තුළ පර්යේෂණ පත්‍රිකා 81 ක්ද. ශ්‍රී ලංකා සමාජ විද්‍යා ජර්නලය තුළ පර්යේෂණ පත්‍රිකා 29 ක්ද ප්‍රකාශයට පත්කරමින් දැනුම හවුල් පරිහරණයට සහ ව්‍යාප්තියට ඉඩ සලසා ඇත.

වර්ෂ 2005 - 2017 කාලය තුළදී රුපියල් මිලියන 213ක ආයෝජනයෙන් පර්යේෂණ උපකරණ ප්‍රදාන 145ක් විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතන වෙත ලබාදීම තුළින් ශ්‍රී ලංකාවෙහි පර්යේෂණ යටිතල පහසුකම් ශක්තිමත් කිරීමට ජාතික විද්‍යා පදනම දක්වන කැපවීම සහ ගත් උත්සාහය වටහා ගත හැකිය. 2013 - 2017 කාලය, එනම් පසුගිය වසර 05 තුළදී ලබාදුන් ප්‍රදාන 64 අතරින් 39ක් ජාතික විද්‍යා පදනමේ අරමුදල් යොදාගෙන සිදුකරන පර්යේෂණ ක්‍රියාකාරකම් සඳහා භාවිත කර ඇති අතර වෙනත් මූලාශ්‍ර මගින් අරමුදල් සැපයූ ව්‍යාපෘති 289 ක්ද මෙම පහසුකම් මගින් ප්‍රයෝජන ලබා ඇත.

වර්ෂ 2000 දශකයේ මැදභාගයේදී, සමාජ, ආර්ථික සංවර්ධනය දියුණු කිරීමෙහිලා, පර්යේෂණ සහ සංවර්ධනය සතු වන, ඉතා වැදගත් කාර්යභාරයක් වටහාගත් ජාතික විද්‍යා පදනම, ජාතික නැනෝතාක්ෂණ විද්‍යා මූලාරම්භය සඳහා පෙරමුණ ගත්තේය. එහි අවසන් ප්‍රතිඵලය වූයේ වර්ෂ 2008 දී ශ්‍රී ලංකා නැනෝතාක්ෂණවිද්‍යා ආයතනය (ස්ලින්ටෙක් SLINTEC) පිහිටුවීමය. නැනෝතාක්ෂණ විද්‍යා පර්යේෂණ ඉහළ මට්ටමින් සිදුකරන ප්‍රමුඛම ආයතනය බවට එය දැන් පත්ව ඇත. ශ්‍රී ලංකාව තුළ නැනෝතාක්ෂණ විද්‍යා උද්‍යානයක් පිහිටුවීම සඳහාද දැන් මූලාරම්භය තබා ඇත. එමෙන්ම ජාතික විද්‍යා පදනම තාක්ෂණ විද්‍යා සංවර්ධනයට සහ ව්‍යාපාර පදනම් වූ කර්මාන්ත ආරම්භයට තුඩුදෙන පර්යේෂණ ප්‍රචලිත කිරීමට අවශ්‍ය නව තාක්ෂණයන්ට සහය වීමද ඇතුළත්වන තවත් ප්‍රදාන ගණනාවක්ම ආරම්භ කර ඇත.

ජාත්‍යන්තර චාරිකා ප්‍රදාන, විදේශ පුහුණු වැඩසටහන්, විද්‍යා හා තාක්ෂණවිද්‍යා ප්‍රකාශන, සුවිගත කළ ජර්නල් තුළ පළකෙරෙන පර්යේෂණ පත්‍රිකා සඳහා පිටුවලට ගෙවීම් සඳහා සහායවීම ආදියද අපගේ විද්‍යාඥයන්හට ජාතික විද්‍යා පදනම පිරිනමන අනෙක් බොහෝ පහසුකම් අතර පවතියි. මේ සියල්ලෙහිම බලාපොරොත්තුව තම පර්යේෂණ ප්‍රයත්න සාර්ථක කරගැනීමට වෙරදරන අපගේ විද්‍යාඥයන්හට සහය දැක්වීමය.

ද්වි - පාර්ශවික විද්‍යාත්මක සහයෝගිතාවය ශක්තිමත් කිරීම සහ ඒවායෙහි ඵල ප්‍රයෝජන ජාතික




**ජාතික විද්‍යා පදනමේ පර්යේෂණ මස්තකය - 2016**

සංවර්ධනයට හිමිකර ගැනීමේ අවධානයකින් යුතුව ජාතික විද්‍යා පදනම ද්වි - පාර්ශවික සහයෝගිතා පර්යේෂණ වැඩසටහන් ගණනාවකටම මුලපුරා ඇත. පකිස්තානු විද්‍යා පදනම, ජර්මන් පර්යේෂණ පදනම (DFG) සහ ජර්මානු DAAD (ජර්මන් ශාස්ත්‍රීය හුවමාරු සේවාව), ජපන් විද්‍යා හා තාක්ෂණවිද්‍යා නියෝජිත ආයතනය සහ චීන ජාතික ස්වාභාවික විද්‍යා පදනම (NSFC) යන ආයතන සමග දැනටමත් ද්විපාර්ශවික සබඳතා පිහිටුවා ඇති අතර එවැනි සබඳතා තවත් කිහිපයක් ආරම්භ කිරීමට නියමිතය. මෙම ඒකාබද්ධ වැඩසටහන් තුළින් පර්යේෂකයන් හුවමාරු කරගැනීමටද අපේක්ෂා කරන අතර එමගින් අපගේ පර්යේෂක ප්‍රජාවට තම පර්යේෂණ කුසලතා සහ වෙසෙසියාව ඉහළ නංවා ගෙන වඩාත් හොඳින් ජාතියට සේවය කිරීමට අවස්ථාව උදාවනු ඇතැයි සැලකිය හැකිය. 1968දී ජාතික විද්‍යා කවුන්සිලය නමින් නිහතමානී ගමනක් ඇරඹූ, ජාතික විද්‍යා පදනම දැන් මුල් පෙළේ මූල්‍යාධාර සපයන අධිකාරියක් බවට පත්ව තිබේ. ඒ සඳහා එදා මෙදා සිට කළමනාකාර මණ්ඩලය සැපයූ දැක්ම, සහ ලබාදුන් නායකත්වය හේතුවිය. අද මෙම ආයතනය ජාතික සංවර්ධනයෙහිලා අතිශය වැදගත් කේන්ද්‍රීය කාර්යභාරයක් ඉටුකරමින් සිටියි.

තමන් ලද වරම අනුව සිදුකළ යුතු ක්‍රියාකාරකම් නොපිරිහෙලා ඉටුකිරීමට සමත් සුදුසුකම් ලත් සහ කැපවීමෙන් කටයුතු කරන කාර්යමණ්ඩලයක් ජාතික විද්‍යා පදනම සතුය. මෙවැනි පසුබිමක් තුළ රජය ප්‍රමාණවත් අරමුදල් ආයෝජනය කිරීම සහ පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් සඳහා බදු සහන පිරිනැමීම, නම්‍යශීලි සහ විනිවිද ස්වභාවයෙන් සපයා ගැනීමේ ක්‍රමවේද ඇතිකිරීම සහ හමුවන බාධා නොතකා ඉදිරියටම යාමට අපගේ විද්‍යාඥයන් දක්වන කැමැත්ත ආදිය හේතුකොට නුදුරු අනාගතයේදීම දැනුම පදනම් ශක්තිමත් ආර්ථිකයක් පිළිබඳ ශුභවාදී බලාපොරොත්තු පිහිටුවා ගත හැකිය.



ජාතික විද්‍යා පදනම
පර්යේෂණ අංශය
අංශ ප්‍රධානි
**ආචාර්ය ගීතිකා යාපා**
geethika@nsf.ac.lk
0714488534

**පර්යේෂණ ව්‍යාපෘතියක් සිදුකිරීමේදී අනුගමනය කළ යුතු පියවර**

**1වන පියවර : ගැටළුව හඳුනාගැනීම**
පර්යේෂණයක් සිදුකිරීමේදී සිදුකළ යුතු ප්‍රථම කාර්යය වනුයේ ගැටළුව හඳුනාගැනීම හෝ පර්යේෂණයට අදාළ ප්‍රශ්නය හෝ ගොඩනැගීමය. සංවිධානයකට දැනගැනීමට අවශ්‍ය ගැටළුව, යම් දැනුම් හෝ තොරතුරු හෝ ප්‍රමාණයක් පර්යේෂණයෙහි ගැටළුව ලෙස හඳුනාගත හැකිය.

**2වන පියවර : සාහිත්‍යමය සමාලෝචනය**
පරීක්ෂණයට ලක් කරන මාතෘකාව හෝ තේමාව හෝ පිළිබඳව පර්යේෂකයා බොහෝ දෑ දැන උගත යුතුය. මේ සඳහා පර්යේෂකයා විසින් පර්යේෂණ ගැටළුව අදාළ සාහිත්‍ය සමාලෝචනයක් සිදුකිරීම අත්‍යවශ්‍යය. මෙම සමාලෝචනයට මෑතදී සිදුකළ පර්යේෂණ ක්‍රියාකාරකම් ද ඇතුළුව දේශීය හා ගෝලීය සාහිත්‍යය ආවරණය විය යුතුය. මෙම පියවර තුළින් ගැටළුව පවතින ක්ෂේත්‍රය පිළිබඳ දැනුමක් ලද හැකිය. මෙම සාහිත්‍ය සමාලෝචනය තුළින් ගැටළු ක්ෂේත්‍රය හා සම්බන්ධව මෙයට පෙර සිදු කළ අධ්‍යයනයන් කවරේද? එම අධ්‍යයනයන් සිදුකර ඇත්තේ කෙසේද? සහ ඒවායෙන් එළැඹි නිගමන කවරේද? යන්න පිළිබඳව පර්යේෂකයාට ඉගෙනුමක් ලැබීමට හැකිවනු ඇත.

**3වන පියවර : ගැටළුව පැහැදිළි කරගැනීම**
සාහිත්‍ය සමාලෝචනයෙන් පසුව පර්යේෂකයාහට පර්යේෂණ ව්‍යාපෘතියෙහි විෂය සීමාව පුළුල් කිරීමට හෝ පටු කිරීමට හෝ පුළුවන.

**4වන පියවර : පර්යේෂණයෙහි අරමුණු සහ කල්පිත නිර්වචනය (අර්ථකථනය) කිරීම**
පර්යේෂණයෙහි පොදු සහ විශේෂිත අරමුණු නිර්වචනය කරන්න. අරමුණු යනු අපේක්ෂිත ප්‍රතිඵල පිළිබඳව දක්වන පුළුල් ප්‍රකාශනයකි. මෙහිදී ව්‍යාපෘතිය තුළින් සාක්ෂාත් කරගැනීමට අපේක්ෂා කරන දෙය පැහැදිලි සහ සාරාංශමය වශයෙන් දැක්විය යුතුය.

**5වන පියවර : ක්‍රමවේදය**
පර්යේෂණ ව්‍යාපෘතියෙහි ඉතා තීරණාත්මක මෙන්ම වැදගත්ම කොටසද මෙයය. පර්යේෂණ ව්‍යාපෘතියෙහි සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය හෝ නිගමනය වනුයේ මෙමගිනි. එය ඉතා යථාතථ්‍ය සහ නිර්වද්‍ය විය යුතු අතර යෝජිත අරමුණු සාක්ෂාත් කරගැනීමට නැඹුරු විය යුතුය.

මානව භාජකයන් / සත්ව ආකෘති සම්බන්ධ කරගන්නා පර්යේෂණ ව්‍යාපෘති සඳහා අදාළ ආයතනයකින් ආචාර්ධර්ම අනුමැතිය ලබාගැනීම අනිවාර්යය.

**6වන පියවර : ප්‍රතිඵල සහ සාකච්ඡාව**
අපේක්ෂිත ප්‍රතිඵල හිමිකර ගැනීම සඳහා රැස්කළ දත්ත, උචිත සහ අදාළ මෙවලම් (සංඛ්‍යානමය ක්‍රමද ඇතුළත්ව) මගින් විශ්ලේෂණය කළ යුතුය. සාකච්ඡාව විධිමත් කරගැනීම සඳහා ප්‍රතිඵල පරෙස්සමෙන් අර්ථකථනය කිරීම අවශ්‍යය. යම් ලෙසකින් අයහපත් හෝ සෘණ ප්‍රතිඵල හෝ ලැබී ඇත්නම් ඒවාද මෙහිදී සාකච්ඡාවට ලක් කිරීම වැදගත්ය.

**7 වන පියවර : නිගමන**
පර්යේෂණයෙන් ලද ප්‍රතිඵල පදනම් කරගෙන පැහැදිලි නිගමන ලබාදීම ඉතා වැදගත්ය. මෙම පර්යේෂණ ව්‍යාපෘතිය තුළින් මතුවන තවත් පර්යේෂණ අවශ්‍යතා පවතී නම් ඒවාද මෙම කොටසෙහි සඳහන් කළ යුතුය.

**8වන පියවර : ආශ්‍රේය ලැයිස්තුව**
පර්යේෂණ අධ්‍යයනය සඳහා භාවිත කළ ආශ්‍රයයන් (මූලාශ්‍ර) මෙහිදී ලැයිස්තු ගත කළ යුතුය

# තහවුරු කළ කරුණු මත පදනම් ප්‍රතිපත්ති සඳහා විද්‍යාව

ආචාර්ය පී. ආර්. එම්. පී. දිල්රුක්ෂි




## ප්‍රතිපත්තියක් යනු කුමක්ද?

ප්‍රතිපත්තියක් ලෙස හඳුන්වනු ලබන්නේ, පුද්ගලයන්, කණ්ඩායමක්, වෙළඳ සංවිධානයක්, රජයයක් හෝ දේශපාලන පක්ෂයක් කිසියම් අවස්ථාවකදී කළ යුතු යයි. නිල වශයෙන් එකඟ වූ අදහස් සමූහයක් හෝ සැලසුමක්ය.

ප්‍රතිපත්තිය තුළට සහේතුක ප්‍රතිඵල සාක්ෂාත් කරවන තීරණවලට මඟ පෙන්වන හොඳින් සිතා බලා සකස් කළ මූලධර්ම සමූහයක් ඇතුළත්ය. එබැවින් ප්‍රතිපත්තියක් යනු අභිප්‍රාය දක්වන ප්‍රකාශයකි. එය ක්‍රියාදාමයක් හෝ අනුගමනය කරන සිරිත්විරිත් සමුදායකි. සාමාන්‍යයෙන් ප්‍රතිපත්ති සංවිධානයක් හෝ රජයක් හෝ තුළ පවත්නා පාලන තන්ත්‍රය මගින් පිළිගනු ලබන්නකි.

පොදු ප්‍රතිපත්ති ප්‍රධාන ආකාර 03ක් ඇත. ඒවා නම්,

1. නියාමන ප්‍රතිපත්තිය
2. ව්‍යාප්ති ප්‍රතිපත්තිය
3. ප්‍රතිව්‍යාප්ති ප්‍රතිපත්තිය

ඉහත සඳහන් කළ එක් එක් ප්‍රතිපත්ති වර්ගයකට එයටම සුවිශේෂ වූ අරමුණක් පවතියි.

**නියාමනය පිළිබඳ ප්‍රතිපත්තියෙහි** එක් ප්‍රධාන ඉලක්කයක් වනුයේ විනය රැකගැනීම සහ සමාජයට තර්ජනාත්මක විය හැකි චර්යා ඇතිවීම වැළැක්වීමය. ශ්‍රී ලංකාවේ ඡන්ද ප්‍රතිපත්තිය, රථවාහන අණපනත් ආදිය මෙම නියාමන ප්‍රතිපත්තියට උදාහරණ ලෙස දැක්විය හැකිය.

**ව්‍යාප්ති ප්‍රතිපත්තිය** බොහෝවිට ක්‍රියාත්මක කරනුයේ යම් ක්‍රියාකාරකම් සිදුකිරීමට ජනතාව දිරිගැන්වීමටය. පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන්හී වැඩිපුර නිරතවීම උනන්දු කිරීම සඳහා කර්මාන්තවලට බදුසහන ලබාදීම මෙයට උදාහරණය ලෙස දැක්විය හැක.

**ප්‍රතිව්‍යාප්ති ප්‍රතිපත්තිය** ඉලක්ක කරනුයේ ප්‍රජාවට, කණ්ඩායමකට හෝ සමාගමකට හෝ යම් කාර්යයන්හී නිරතවීම දිරිගැන්වීම සඳහා සමහර වාසි හා ප්‍රයෝජන ලබාදීමටය . ශ්‍රී ලංකාවේ ගොවීන් සඳහා පොහොර සහනාධාරය ලබාදීම එවැන්නක් සඳහා උදාහරණයක් ලෙස දැක්විය හැක.

ප්‍රතිපත්ති සකස්කිරීමේ ක්‍රියාවලිය පියවර කිහිපයකි. ඒවානම්;

1. ප්‍රතිපත්ති ප්‍රස්තුත හඳුනාගැනීම
2. අදාළ ප්‍රස්තුත (ගැටළු) විසඳීමට අවශ්‍ය ප්‍රතිපත්ති සැකසීම
3. සකස්කළ ප්‍රතිපත්ති අනුමත කරගැනීම
4. අනුමත කරගත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
5. එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙන් පසුව අදාළ ගැටළුව විසඳී ඇත්දැයි තක්සේරු කිරීම සඳහා ඇගයීම
6. අපේක්ෂා කළ පරිද්දෙන් කාර්යය ඉටුවී නැතිනම් ක්‍රියාත්මක කළ ප්‍රතිපත්තිය නවතා දැමීම හෝ නැවත සැකසීම.

ප්‍රතිපත්තිමය මැදිහත්වීමක් හෝ නව ප්‍රතිපත්තියක් සැකසීම හෝ අවශ්‍ය ගැටළුවක් හඳුනාගැනීම සඳහා, සාක්ෂි ලෙස හැඳින්වෙන නිවැරදි තොරතුරු පැවතීම අවශ්‍ය කරුණකි. නිවැරදි සාක්ෂි සපයා ගැනීම සඳහා ප්‍රතිපත්තිය අවශ්‍ය ප්‍රස්තුතය හෝ ගැටළුව හෝ නිවැරදි ලෙස හඳුනාගැනීම සිදුකළ යුතු අතර අදාළ ප්‍රස්තුතය විසඳීමට අවශ්‍ය විශ්වාසනීය ප්‍රතිපත්ති සැකසීම සිදුකළ යුතුය. එය හැකි වන්නේත් පර්පූර්ණ පර්යේෂණ සිදුකර නිවැරදි දත්ත විශ්ලේෂණය කිරීමෙනි.

එබැවින් ජාතික විද්‍යා පදනම විද්‍යාව හා තාක්ෂණවිද්‍යාව යන ක්ෂේත්‍රයන්හී ප්‍රතිපත්ති පර්යේෂණ සිදුකිරීම සඳහා විද්‍යා හා තාක්ෂණවිද්‍යා ප්‍රතිපත්ති පර්යේෂණ අංශයක් (STPRD) පිහිටුවීය. මෙම අංශය විසින්, විද්‍යාව සහ තාක්ෂණවිද්‍යාව ක්ෂේත්‍රයන්හී ප්‍රතිපත්ති සකස් කිරීමේ නියැලෙන ප්‍රතිපත්ති සැලසුම්කරුවන් සහ අධිකාරීන්හට අවශ්‍ය ප්‍රතිපත්තිමය නිර්දේශ සහ දර්ශක ලබාදීම සඳහා කටයුතු කරයි.

## විද්‍යාව හා තාක්ෂණවිද්‍යා ප්‍රතිපත්ති පර්යේෂණ අංශය (STPRD)

ජාතික විද්‍යා පදනම සිය විද්‍යා හා



01 වන රූපයः ජාතික විද්‍යා පදනම මගින් ප්‍රකාශිත සංඛ්‍යානය පිළිබඳව අත්පොත් මාලාව

තාක්ෂණවිද්‍යා ප්‍රතිපත්ති පර්යේෂණ අංශය (STPRD) ස්ථාපනය කරනු ලැබූයේ 2005 ජනවාරි මාසයේදීය. මෙම අංශය බිහිකිරීම සිදුවූයේ විද්‍යාව හා තාක්ෂණවිද්‍යා ක්ෂේත්‍ර සඳහා පර්යේෂණ අනුබද්ධ අංශයක් ඇතිකිරීමේ අපේක්ෂාවෙනි. එබැවින් විද්‍යා හා තාක්ෂණවිද්‍යා දර්ශක විශ්ලේෂණය කිරීම තුළින් තහවුරු කළ පර්යේෂණ දත්ත සැපයීම අපේක්ෂාවයි. එහි මෙහෙවර වන්නේ දිවයින පුරා සිටින ප්‍රතිපත්ති සම්පාදකයන්ට සහ අනෙක් අයහට විද්‍යාව, තාක්ෂණවිද්‍යාව, නවෝත්පාදන, අධ්‍යාපනය සහ අනෙකුත් ආශ්‍රිත ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු සැපයීමයි. රටෙහි ආර්ථික සංවර්ධනය සහ සමාජයේ පොදු යහපැවැත්ම ඇතිකිරීමට දායකවන විද්‍යාව සහ තාක්ෂණවිද්‍යාව සම්බන්ධ වැදගත් ප්‍රස්තුත කෙරෙහි සමාජය දැනුවත් කිරීමත් එහි තවත් අපේක්ෂාවකි.

විද්‍යාව සහ තාක්ෂණවිද්‍යා ප්‍රතිපත්ති පර්යේෂණ අංශයේ මූලික අවධානය පහත දැක්වෙන දිසාවන් වෙත යොමුව ඇත.

ප්‍රතිපත්ති සම්පාදනය සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන පිළිබඳ වැදගත් ක්ෂේත්‍රයන්හී පර්යේෂණ පැවැත්වීම. තීරණ ගැනීමෙහිලා ප්‍රයෝජනවත් විය හැකි විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන ක්ෂේත්‍රයන්හී සියළු අංශ සඳහා අදාළ වන දත්ත සමුදායක් පවත්වා ගෙනයාම සංවර්ධනය විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන ක්ෂේත්‍රයන්ට අදාළ ජාතික වශයෙන් වැදගත් ප්‍රස්තුත පිළිබඳව පොදු ජනතාව දැනුවත් කරන වැඩසටහන් සහ සාකච්ඡා වාර පැවැත්වීම.

ශ්‍රී ලංකාව තුළ දැනටමත් භාවිත වන සහ පැවති දේශීය දැනුම පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම, එක්රැස් කිරීම, සමාලෝචනය කිරීම සහ තහවුරු කිරීම එහි තවත් එක් කාර්යයකි. සමාජ විද්‍යා සහ දේශීය දැනුම යන ක්ෂේත්‍රයන්හි මානව සම්පත් කුසලතා නැංවීමට අදාළ පියවර ගැනීම තවත් කාර්යයක් ලෙස දැක්විය හැක.

## විද්‍යාව, තාක්ෂණවිද්‍යාව සහ නවෝත්පාදන ප්‍රතිපත්ති පර්යේෂණ ජාතික පර්යේෂණ සංවර්ධන සහ නවෝත්පාදන සමීක්ෂණය

විද්‍යාව හා තාක්ෂණවිද්‍යා ප්‍රතිපත්ති පර්යේෂණ අංශය 2004 වර්ෂයේ සිට සෑම වර්ෂ දෙකකටම වරක් බැගින් නිතිපතාම, පර්යේෂණ, සංවර්ධන සහ නවෝත්පාදන සමීක්ෂණයන් සිදුකරනු ලැබූ අතර වර්ෂ 2013 සිට එය වාර්ෂිකව පැවැත්වීමට පියවර ගැනින. මෙම සමීක්ෂණය, පර්යේෂණ සංවර්ධන සහ නවෝත්පාදනය සඳහා කෙරෙන ආයෝජනය මගින් රටතුළ විද්‍යාව, තාක්ෂණ විද්‍යාව හා නවෝත්පාදන සම්බන්ධයෙන් පවත්නා තත්වය මිනුම කර වාර්තා කරනු ලබයි. මෙහිදී විද්‍යාව, තාක්ෂණ විද්‍යාව සහ නවෝත්පාදන සඳහා පවතින මානව සම්පත් ප්‍රමාණය මෙන්ම, ප්‍රකාශන, නිර්මාණ (පේටන්ට්) හිමිකම් තාක්ෂණය සහ නවෝත්පාදන ඇතුළු තවත් බොහෝ දෑ පිළබඳව විද්‍යාව, තාක්ෂණවිද්‍යාව සහ නවෝත්පාදන නිමැවුම් විමසීමක යෙදෙයි. මෙම සමීක්ෂණ මගින් උත්පාදනය කරන දර්ශක රටෙහි විද්‍යාව, තාක්ෂණවිද්‍යාව සහ නවෝත්පාදන ප්‍රතිපත්ති සම්පාදනයට සහ ප්‍රතිපත්ති ප්‍රස්තුත විසඳීමට හා පරතර පියවීමට ප්‍රයෝජනවත්ය. රටතුළ සඵලමත් සහ ඵලදායී පර්යේෂණ සංවර්ධන සහ නවෝත්පාදන පද්ධතියක් නිර්මාණයට අවශ්‍ය අන්තර් දෘෂ්ටිය ලබාදීමට මෙම සමීක්ෂණ මගින් සැපයෙන ප්‍රතිපත්ති නිර්දේශ සමත්ය. අත්පොත මගින් ලබාදෙන තොරතුරු විද්‍යා හා තාක්ෂණවිද්‍යා අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය, මහ බැංකුව, සැලසුම්කිරීමේ දෙපාර්තමේන්තුව ඇතුළු තවත් ආයතන ගණනාවක ප්‍රතිපත්ති සැලසුම්කරුවන් හා පරිපාලකයන් භාවිත කරති. විද්‍යාව, තාක්ෂණවිද්‍යාව සහ නවෝත්පාදන ගෝලීය වාර්තාව සම්පූර්ණ කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංඛ්‍යාලේඛන ආයතනයට තොරතුරු සැපයීමේ කේන්ද්‍රීය මධ්‍යස්ථානය ලෙසට ද ජාතික විද්‍යා පදනම කටයුතු කරයි.

## උපාධිධාරීන් හා පශ්චාත් උපාධිධාරීන් පිළිබඳ අනුරේඛීය අධ්‍යයනය

ජාතික විද්‍යා පදනමේ, විද්‍යා හා තාක්ෂණවිද්‍යා පර්යේෂණ අංශය විසින් ජාතික විශ්වවිද්‍යාලවලින් පිටවන විද්‍යාව හා තාක්ෂණවිද්‍යා උපාධිධාරීන් සහ පශ්චාත් උපාධිධාරීන්ගේ වෘත්තිමය නිපුණතාව මැනීම සඳහා අධ්‍යයන කිහිපයක්ම සිදුකරනු ලැබීය. මෙම අනුරේඛීය අධ්‍යයන ශ්‍රම වෙළඳපොළට අවශ්‍ය උපාධි මට්ටමේ විද්‍යා හා තාක්ෂණවිද්‍යා මිනිස් බලය විමසා බැලීමේ මෙවලමක් ලෙසත් ඉදිරි වසරවලදී අවශ්‍ය ඉල්ලුම හා සැපයුම පිළිබඳ පුරෝකථනය සඳහාත් යොදාගැනින. එසේම මෙම දත්ත විද්‍යා සහ තාක්ෂණවිද්‍යා මිනිස් බලය ඵලදායීව උපයෝගී කරගැනීම සහ ඒ හා සම්බන්ධ ප්‍රතිපත්ති වෙනස්කම් සඳහා ද යොමුකිරීමක් හා මගපෙන්වීමක් සපයයි.

## ජාතික නවෝත්පාදන පද්ධති අධ්‍යයනයන්

විවිධ නවෝත්පාදන ක්‍රියාකාරකම් සිදුකිරීම සඳහා අදාළ විවිධ සංවිධාන සහ ආයතන එකිනෙක අතර පවතින අන්තර්සම්බන්ධතාව සිදුකරන සහ බලපෑම් කරන, ජාලගත බැඳීම ජාතික ආර්ථිකයේ උප පද්ධතියක් ලෙස, ජාතික නවෝත්පාදන පද්ධතියක දැකීමට පුළුවන. එහෙයින් රටෙහි නවෝත්පාදන පද්ධතිය සංවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති, දිරිදීම් ලබාදීම උදෙසා වන ජාතික නවෝත්පාදන පද්ධති අධ්‍යනය සිදුකිරීමට අවධානය යොමුකිරීමට ජාතික විද්‍යා හා තාක්ෂණවිද්‍යා ප්‍රතිපත්ති පර්යේෂණ අංශය ක්‍රියාකරයි. ජාතික විද්‍යා පදනම ප්‍රධාන වශයෙන් අවධානය යොමුකර ඇත්තේ සංවර්ධනය සහ ව්‍යාප්තිය සඳහා විශාල විභවයක් සහිත, මෙරට කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ කර්මාන්ත පද්ධති අධ්‍යයනය සඳහාය.

## පර්යේෂණ සහ සමාජ විද්‍යාව කෙරෙහි බලපාන සාධක පිළිබඳ අධ්‍යයනය

ශ්‍රී ලංකාවේ සමාජ විද්‍යාව පිළිබඳ පර්යේෂණ සිදුකිරීමේදී බලපාන සාධක විමසා බැලීම සඳහා වන සමීක්ෂණයක් 2016 දී ආරම්භ කරනු ලැබිය. මෙම සමීක්ෂණය සැලසුම් කරනු ලැබුයේ සමාජ විද්‍යාව සහ මානව ශාස්ත්‍ර විද්‍යාව යන ක්ෂේත්‍රයන්හී සිදුකරන පර්යේෂණ අධ්‍යනයන්හී ගුණාත්මකභාවය අඩුවීමටත්, සිදුකරන පර්යේෂණ ප්‍රමාණය අඩුවීමටත්, හේතු කවරේදැයි පරීක්ෂා කර බැලීමටය. මෙම සමීක්ෂණයෙන් ලැබෙන සොයාගැනීම් පදනම් කරගෙන එළඹෙන නිරීක්ෂණ, රටෙහි සිදුකරන සමාජ විද්‍යා පර්යේෂණ මට්ටම ඉහළ නංවන වැඩසටහන් සකස්කිරීමට උපයෝගී කරගැනීමට අපේක්ෂිතය. එමගින් ජාතික සංවර්ධන ප්‍රතිපත්තිය සම්පාදනයට ප්‍රයෝජනවත්වන පර්යේෂණ සංස්කෘතියක් නිර්මාණය කිරීමට බලාපොරොත්තුවේ.

## ප්‍රතිපත්ති සම්පාදනය සහ පර්යේෂණ සඳහා අවශ්‍ය විද්‍යාත්මක තොරතුරු රැස්කිරීම, විශ්ලේෂණය හා බෙදාහැරීම

රටෙහි ආර්ථික සංවර්ධනය සඳහා විද්‍යාව, තාක්ෂණවිද්‍යා සහ නවෝත්පාදන පිළිබඳ දැනුම යොදාගැනීමේ අවශ්‍යතාව මත විද්‍යා හා තාක්ෂණවිද්‍යා අංශයන්හී විවිධ ක්ෂේත්‍ර පිළිබඳ අදාළ තොරතුරු පද්ධතියක අවශ්‍යතාවය ඇති විය. එසේම ප්‍රතිපත්ති සැකසීමට අවශ්‍ය දර්ශක සහ සුචක හඳුනාගැනීමේත් අවශ්‍යතාවයක්ද පැවතින. මෙම අභියෝගයන්ට මුහුණදීම සඳහා විද්‍යා හා තාක්ෂණ අංශය මගින් විද්‍යා හා තාක්ෂණ තොරතුරු කළමනාකරණ පද්ධතිය (STMIS) නිර්මාණය කරන ලදි. විද්‍යාත්මක පර්යේෂණ, විද්‍යා හා






03 වන රූපය: තරුණ සමාජ විද්‍යාඥයන්ගේ සංසදය පිහිටුවීම

තාක්ෂණවිද්‍යා මානව සම්පත් පිළිබඳ තොරතුරු සහ වෙනත් ක්‍රියාකාරකම් සමග සබැඳි සමෝධානික ආකාරයෙන් පෙළගස්වනු ලැබූ තොරතුරු මෙම පද්ධතියේ ඇතුළත්ය. ඊට අමතරව යාවත්කාලීන තාක්ෂණික නිර්මාණ පිළිබඳ තොරතුරු විද්‍යාත්මක උපකරණ පිළිබඳ දත්ත ආදිය මෙම පද්ධතියේ ඇතුළත් කර ඇත.

## සමාජ විද්‍යා විද්‍යාඥයන්ගේ නාමාවලිය

විද්‍යාව සහ තාක්ෂණවිද්‍යා ප්‍රතිපත්ති පර්යේෂණ අංශය ශ්‍රී ලංකාවේ සමාජ විද්‍යාඥයන්ගේ නාමාවලියක් සකස්කර අවසන් කිරීම සඳහා ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත.

## තරුණ සමාජ විද්‍යාඥයන්ගේ සංසදය පිහිටුවීම

ජාතික විද්‍යා පදනම විසින් තරුණ සමාජ විද්‍යාඥයන්ගේ සංසදයක් පිහිටුවීම සඳහා මුලාරම්භය තබා ඇත. මෙමගින් තරුණ සමාජ විද්‍යාඥයන් හට තම කාර්ය සාධනය නංවාලීම සඳහා සාකච්ඡා කිරීමේ සහ





02 වන රූපය: විද්‍යා හා තාක්ෂණ තොරතුරු කළමනාකරණ පද්ධතිය




**04 වන රූපයඃ ශ්‍රී ලංකාව තුළ පවතින දේශීය දැනුම රැස්කිරීම සහ වලංගු කිරීමේ වැඩසටහන්**

මුලාරම්භයන් ගැනීම උදෙසා පොදු වේදිකාවක් සැකසීම සහ ජාතික සංවර්ධන කාර්යයන් සඳහා සහභාගිවීමට අවස්ථාව සැලසෙයි. මෙම සංසදය රටෙහි පිළිගත් ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන්ගේ මගපෙන්වීම යටතේ ඵලදායී පර්යේෂණ ව්‍යාපෘති සඳහා වන පර්යේෂණ අදහස් සංවර්ධනය කරනා විද්‍යාඥායන්ගේ දායකත්වයෙන් සිදුකිරීමට බලාපොරොත්තුවේ.

## ජ්‍යෙෂ්ඨ සාමාජ විද්‍යාඥයන්ගේ සංසදය පිහිටුවීම

ජාතික විද්‍යා පදනම මගින් ක්‍රියාත්මක කරන පර්යේෂණ සහ වැඩසටහන් මෙන්ම ජාතික සමාජ - ආර්ථික සංවර්ධනයට අදාළ ක්‍රියාකාරකම් සඳහා ජ්‍යෙෂ්ඨ සමාජ විද්‍යාඥයන්ගේ සක්‍රිය දායකත්වය සහ සහභාගිත්වය ලබාගැනීම සඳහා ජාතික විද්‍යා පදනම විසින් ජ්‍යෙෂ්ඨ සමාජ විද්‍යාඥයන්ගේ සංසදයක්ද පිහිටුවීමට සැලසුම් කර ඇත.

## විදේශගතව වෙසෙන ශ්‍රී ලංකා ජාතික විද්‍යාඥයන්ගේ දත්ත පද්ධතිය

ලෝකයේ විවිධ රටවල සේවය කරන, විද්‍යාව සහ තාක්ෂණවිද්‍යාවට සම්බන්ධ ක්‍රියාකාරකම් හී නියැලී විදේශගත ශ්‍රී ලාංකික විද්‍යාඥයන් දත්ත පද්ධතියක් නිර්මාණය කර ඇත. මෙම කාර්යයයෙහි ප්‍රධාන අරමුණවන්නේ, ජාතික වැඩසටහන් සඳහා ඔවුන්ගේ දායකත්වය සහ සහයෝගය ලබාගැනීමය.

## පාරම්පරික දේශීය දැනුම

ශ්‍රී ලංකාව තුළ පවතින දේශීය දැනුම රැස්කිරීම, අධ්‍යනය කිරීම සහ ආරක්ෂා කිරීම රටෙක තිරසර සංවර්ධනය සඳහා ඉතා වැදගත්ය. දේශිය දැනුම සහ රටෙහි පවතින ව්‍යවහාර භාවිත කරගත් ජෛවවිවිධත්වය ආරක්ෂා කිරීම සහ තිරසර ආකාරයෙන් උපයෝගී කරගැනීම සමග සමීප සබඳතාවක් දක්වති. විවිධ රටවල දේශීය දැනුම පද්ධති ශාක, සත්ව, මිහිපිට සහ ඉන් බාහිර ජීවිත තිරසර ලෙස භාවිත කිරීම සමග සබැඳි යහපත් ප්‍රායෝගික දැනුම ද ඇතුළත් විවිධ ක්ෂේත්‍රයන් පිළිබඳ දැනුම් සම්භාරයකින් සමන්විත වටිනා උරුමයකි. මෙම වැදගත්කම වටහාගත් එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයාගේ විද්‍යා උපදේශක මණ්ඩලය, 2015 මැයි මාසයේදී පැවැත්වූ එහි තෙවන සැසිවාරයේදී, තිරසර  සංවර්ධනය සඳහා දේශීය දැනුමට දැක්විය හැකි වැදගත් කාර්යභාරය සඳහන් කරමින් ප්‍රතිපත්ති සංක්ෂේපයක් සකස් කිරීමට තීරණය කරනු ලැබීය. එසේම එමගින් දේශිය දැනුම සහ විද්‍යාව අතර පවත්නා සහක්‍රියාකාරිත්වය නංවාලීම සඳහා වන නිර්දේශය සපයා ඇත. (යුනෙස්කෝ - 2015 විද්‍යා වාර්තා). ඒ අනුව ජාතික විද්‍යා පදනමේ දේශිය දැනුම පිළිබඳ ක්‍රියාකාරී කමිටුව පසුගිය සහස්‍රක ගණනාවක් මුළුල්ලේම ශ්‍රී ලංකාව තුළ පැවතුන සහ උපයෝගී කරගත් දේශිය දැනුම හඳුනාගැනීමට, රැස්කිරීමට සහ ආරක්ෂා කිරීමට කටයුතු කරමින් සිටියි.



ජාතික විද්‍යා පදනම
විද්‍යා හා තාක්ෂණවිද්‍යා ප්‍රතිපත්ති
පර්යේෂණ අංශය
අංශ ප්‍රධානි
**ආචාර්ය පී. ආර්. එම්. පී. දිල්රුක්ෂි**
dilrukshi@nsf.ac.lk
0717316705

# සාර්ථක විද්‍යා ගුරුවරයෙකු වීමේ රහස

**රේඛා ගුරුගේ**




විද්‍යාව යනු භෞතික සහ ස්වභාවික ලෝකයේ ව්‍යුහය හා හැසිරීම පිළිබඳව නිරීක්ෂණයෙන් හා ගවේෂණයෙන් කරනු ලබන ප්‍රායෝගික හා මානසික ක්‍රියාවලියකි. මෙය විද්‍යාව යනු කවරේදැයි පැහැදිලි කරනු වස් යොදාගත හැකි හොඳම අර්ථකථනය නොවන බව ඔබට වැටහෙනු ඇති. ඒ සඳහා ඔබටම සුවිශේෂවූ අර්ථකථනයක් තිබිය හැකිය. එසේනම් "විද්‍යා ගුරුවරයා" යන්නට ඔබට දියහැක්කේ කවරවූ අර්ථකථනයක්ද? මම එය ඔබෙන් ඇසීමට ඉක්මන් නොවෙමි. මන්ද මට කීමට කථාවක් ඇති බැවිනි.

දකුණු පළාතේ ඉපදුණු මා බද්දේගම ක්‍රිස්තුදේව බාලිකා විද්‍යාලයෙන් සිප්සතර හදාරා, කුඩා කළ සිට තිබූ සිහිනයක් සැබෑකරමින් සියනෑ අධ්‍යාපන විද්‍යා පීඨයේ පළමු කණ්ඩායම ලෙස අධ්‍යාපන ක්ෂේත්‍රයට පියනගන්නේ විද්‍යා ගුරුවරියක ලෙස බහතෝරමිනි. ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක් හඳුන්වා දී ඇති යුගයක ප්‍රායෝගිකත්වය තුළින් විද්‍යාව ඉගැන්වීම පිළිබඳ අඩිතාලම දැමුවේ මා මධ්‍යම පළාතේ සිටි කාලයේදීය.

පන්ති කාමරයේ හා විද්‍යාගාරය තුළ විද්‍යා විෂයයන් උගන්වමින් සිටින සිය දහස්වර මා සිත තුළ බැඳුණු එක් පැණයක් මෙහිලා සඳහන් කළ යුතුය. විද්‍යා සංකල්ප සිසුන් තුළට හොඳින් කාවැද්දීම කළ යුත්තේ පන්තියක හෝ විද්‍යාගාරයක් තුළ පමණමද? මෙම පැනයට පිළිතුරු දෙනු උදෙසාදෝ ජාතික විද්‍යා පදනම දැයේ දරුවන්ගේ නැණ පහන් දැල්වීම සඳහා වෙනස්ම ආකාරයේ වැඩසටහන් ක්‍රියාත්මක කරවන බව මා හට දැනගන්නට ලැබුණි. එදා සිට මසිත ඇතිවූයේ ප්‍රබෝධයකි. ඉගැන්වීමට අපහසු කරුණු නාට්‍යානුසාරයෙන්, රඟදැක්වීමෙන් විද්‍යා සංකල්ප සිත් තුළට කාවැද්දීමට හැකි බව ජාතික විද්‍යා පදනම තහවුරු කර ඇත.




ජගත් විද්‍යා දිනය - 2013

එවකට මා සේවය කළේ මාතලේ ශ්‍රී සංඝමිත්තා බාලිකා විද්‍යාලයේය. මා එහි විද්‍යා සංගමය භාරව කටයුතු කළ අතර විද්‍යා හා සෞන්දර්ය අංශයේ ගුරුමහත්ම මහත්මීන් හා එක්ව, විද්‍යා නාට්‍ය සැකසුවෙමු. බලශක්ති අර්බුදය, තිරසර සංවර්ධනයට නවෝත්පාදන, දේශගුණ විපර්යාස ආදී විවිධ තේමා යටතේ නාට්‍ය ඉදිරිපත් කර, ජයග්‍රහණ ලබා, ජගත් විදු දිනය සඳහා ඉදිරිපත්කර, එයින් නොනැවතී

ජාතික රූපවාහිනිය තුළින්ද, දැයේ දරුවන්ට පෙන්වීමට අවස්ථාව සලසා ගත හැකිවිය. ඒ ජාතික විද්‍යා පදනම හා ජාතික රූපවාහිනිය අතර සුසංයෝගයෙනි. මේ සියල්ල පිටුපස උපදෙස් දෙමින් අපව දිරිමත් කළේ ජාතික විද්‍යා පදනමයි. මෙසේ විද්‍යා සංකල්ප මනසට නොමැකෙනසේ කාවද්දන්නට විද්‍යා නාට්‍යකරණයට හැකිවූ බව මැනවින් පැහැදිලිය. විද්‍යා ගුරුවරියක ලෙස පන්ති කාමරය තුළදී මගේ සාර්ථකත්වය දැනුනාටත් වඩා දෙයක් මා තුළ ඇති වී ඇති බව මට පසක් විය.

ජාතික විද්‍යා පදනම විද්‍යා ගුරුවරියක ලෙස මා හට ලබාදුන් එකම අවස්ථාව විද්‍යා නාට්‍යකරණය පමණක් නොවේ. මේ වනවිට විරිදු, කවීක, පෝස්ටර්, ඩිජිටල් කතාන්දරකරණය, භූමිකා රංගනය, විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරඟ ආදිය ජාතික විද්‍යා පදනම දියත්කර තිබුණි. මේ සෑම අංශයක් සඳහාම සිසුවියන් ඉදිරිපත්කර, ඔවුන් සහතිකපත්, සම්මාන, පදක්කම් ලබාගෙන ඔවුන් ප්‍රබෝදයට පත් වනවිට මා හට ඇතිවූයේ ඉමහත් සතුටකි. මේ මගින් විද්‍යාවට එතරම් ලැදි නොවූ දරුවන්ගේද, විද්‍යා අධ්‍යාපන ආශාව වැඩිදියුණු වී නිර්මාණ කිරීමට පෙළඹීම මෙතෙක් මා තුළ පැවති ඉගැන්වීම් ක්‍රම පිළිබඳවූ හැඟිම උඩු යටිකුරු කරවීමට සමත්වූ බව නොකිවමනාය. විද්‍යා පදනම මගින්, විද්‍යාව ප්‍රචලිතකිරීමට ගෙන ඇත්තේ සම්මානනීය ක්‍රියා පිළිවෙතක් බව මා හට පසක් වූයේ දරුවන් තුළ වූ උද්යෝගය සුළුපටු නොවන බව දැකීමෙනි.






භෞතික විද්‍යාව, රසායන විද්‍යාව හා ජීව විද්‍යාව යනුවෙන් වෙන්ව සැලකුවද ඒ සියල්ල විද්‍යාව විෂයය යටතේ ඉගැන්වීමට සිදුවන විවිධ ක්ෂේත්‍රයන්ය. එහිදී විවිධ වූ ගවේෂණයන් නිරන්තරයෙන්ම සිදුවූ බවත්, සිදුවෙමින් පවතින බවත් අපි දනිමු. අද පන්ති කාමරයේ ඉගෙනුම ලබන දරුවන් හෙට දවසේ පාරසරික ගැටලුවකට විසඳුම් සොයාගන්නෙකු, නව නිර්මාණයක් ලොවට හඳුන්වා දෙන්නෙකු, බලශක්ති අර්බුදයට විසඳුම් දෙන පරිසර හිතකාමී යන්ත්‍රයක් හඳුන්වාදෙන්නෙකු හෝ පළිබෝධක මර්දනය සඳහා නව පළිබෝධනාශකයක් හඳුන්වා දෙන්නෙකු විය හැක. විද්‍යා ශිෂ්‍යයෙකු පන්ති කාමරය තුළදී එවැන්නක් දක්වා මෙහෙයවන්නේ කෙසේද යන පැනයට මා වැනි අන් සියළු ගුරුවරුන් හට ජාතික විද්‍යා පදනම හඳුන්වාදුන් ක්‍රමවේදයක් වූයේ විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති වැඩසටහනයි.

සැබවින්ම මා ඉතා ප්‍රියතාවයෙන් ළමුන් මෙහෙයවූ තවත් අංශයක් වූයේ මෙකී විද්‍යා ව්‍යාපෘති තරඟයයි. එහිදී ළමුන් කණ්ඩායම් මෙන්ම තනි තනිවද, විවිධ පර්යේෂණ සඳහා යොමු වූයේ මා බලාපොරොත්තු වූවාටත් වඩා වැඩි ආකාරයටයි. මෙය විද්‍යා ගුරුවරියන් සියළුදෙනා එක්ව කරන්නාවූ සාමූහික ක්‍රියාවලියක් වූ නිසාම, පාසලේ බොහෝ දරුවන්ට විවිධ අවස්ථා සැලසීමට හැකිවීම සතුටට හේතුවක් විය. අප විද්‍යාලයේ ශිෂ්‍යාවන්ට ජාත්‍යන්තර තලයට පවා යාහැකි වූයේ ජාතික විද්‍යා පදනමේ දිරිගැන්වීම හා ලබා දුන් ශක්තිය නිසාමය.

එක් අවස්ථාවකදී කැරපොත්තන් පළවා හැරීම සඳහා ශාකසාර විකර්ෂකයක් හඳුන්වා දී සිදුකළ කණ්ඩායම් ව්‍යාපෘතිය ජයග්‍රහණය කර එම ශිෂ්‍යාවන් සියලු දෙනාට ඇමරිකා එක්සත් ජනපදයේ පැවැත්වූ ඉන්ටෙල් ජාත්‍යන්තර විද්‍යා හා ඉන්ජිනේරු සන්දර්ශනයට සහභාගිවීමට අවස්ථාව ලැබීම ද විද්‍යාලය ලද විශාල ජයග්‍රහණයකි.

එමෙන්ම තවත් සුවිශේෂී අවස්ථාවක් මා හටද හිමිවිය. තවත් ශිෂ්‍යාවක් විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරඟය යටතේ "මිරිස් වගාවේ කොළ කොඩවීම පාලනය සඳහා වර්ණවත් ඇලෙන සුළු උගුල් භාවිතය" (A Study to find out suitable colour

to control pests of chilli plants using a colour trap) යන මාතෘකාව යටතේ පර්යේෂණ ව්‍යාපෘතියක් සිදු කළ අතර, එයටද එකී තරඟයෙන් ජයග්‍රහණයක් හිමිවිය. ඉන් අනතුරුව, ඇය සමඟ 2012 වසරේදී තායිවාන ජාත්‍යන්තර විද්‍යා ප්‍රදර්ශනය සඳහා සහභාගිවීමට මා හට ද අවස්ථාවක් ලැබුණේ ජාතික විද්‍යා පදනමේ පූර්ණ අනුග්‍රහයෙනි. එම අවස්ථාවේදී ශ්‍රී ලංකාව නියෝජනය කළ ඇය සිව්වන ස්ථානයට පත්වී, සහතික පත් මුදල් ත්‍යාග සම්මාන ලබාගන්නා විට මා හට ඇතිවූයේ අපූර්ව ආකාරයේ සතුටකි. එම අත්දැකීම මා මීට පෙර අත්විඳ නැත. ශ්‍රී ලංකාව හා තවත් රටක විද්‍යා අධ්‍යාපනය අතර සන්සන්දනාත්මක විග්‍රහයක් ඇති කර දීමට විද්‍යා පදනමේ ක්‍රියාකාරිත්වය මා හා උරින් උර ගැටී කටයුතු කිරීම කෙතරම් භාග්‍යයක් දැයි මට පසක් විය.

විද්‍යාඥයකු බවට පත්වන්නට තමන්ටද හැකියාවක් ඇතැයි යන්න මතුකොට දක්වෙන, තමුන් කැමති විද්‍යාඥයින් පිළිබඳ හදාරා ඔවුන් පිළිබඳ භූමිකා රංගන ඉදිරිපත් කිරීමට පාසල් ළමුන් පෙලඹවීම ද ජාතික විද්‍යා පදනමේ තවත් ජයග්‍රහණයකි. එය මා ගුරුවරියක ලෙස පෙරදී සිතා තිබූ මානයක් නොවේ. එහෙත් ඔවුන් ඒ හරහා විද්‍යාඥයන් පිළිබඳ සෙවීමට හා කථාකිරීමට දැක්වූ උනන්දුවත්, ගවේෂණයට වූ කැමැත්තත් ඒ තුළින් ඉස්මතු වූ අයුරු දෙස මා බලා සිටියේ සොම්නසිනි.

පාසල් විද්‍යා සමාජ සඳහා ජාතික විද්‍යා පදනම මගින් පිරිනැමෙන ඉහළම සම්මානය වන තරුපහේ සම්මානය දිනාගැනීමට ශ්‍රී සංඝමිත්තා බාලිකා ජාතික පාසලට හැකිවීම විදුහල්පතිතුමියට, ආචාර්ය මණ්ඩලයට හා සිසුවියන්ට ඉමහත් සතුටකි. ඒ දක්වා යාමට හැකිවූයේ සියළු දෙනා සමගම ඉතා සුහදව, ඉවසීමෙන්, සැමගේ අදහස්වලට සවන්දී කටයුතු කළ බැවිනි. ඒ සඳහා මා ආදර්ශයට ගත්තේ ජාතික විද්‍යා පදනම බව නිහතමානීව සඳහන් කරනුයේ සතුටිනි. එම ආයතනයේ තිබූ සම්බන්ධීකරණ හැකියාව හා සුහදතාවය මම අගය කරමි.

පාසල් සිසුන් අතර විද්‍යාව ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් ගුරුවරුන්ට පිදෙන ජාතික විද්‍යා පදනම් සම්මානය යටතේ කුසලතා සහතිකයක් 2008 වසරේදී මා හට හිමිවීම මහත් ප්‍රීතියක් ගෙන දෙන්නක් විය. පාසල් සිසුන් අතර විද්‍යාව ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් ගුරුවරුන්ට පිදෙන ජාතික සම්මානය 2010 වසරේදී මා හට හිමිවීම ගුරු ජීවිතයේ ලද උච්චතම අවස්ථාවක් ලෙස මා දකිමි. ඒ, ගුරුවරයකු හට ජීවිතයේ එක් අවස්ථාවකදී පමණක් ලැබෙන්නක් හෙයිනි.



මේ සියළු බාහිර ක්‍රියාකාරකම් සඳහා වෙහෙසෙන අතරම විෂය නිර්දේශයට අනුව ඉගැන්වීම් කටයුතුද සිදුකිරීමේ හැකියාව ලැබීමද මහත් සතුටකි. එහි ප්‍රතිඵලයක් ලෙස අ.පො.ස. සාමාන්‍ය පෙළ විද්‍යාව ප්‍රතිඵල ඉහළ නැංවීම වෙනුවෙන් මාතලේ කලාපීය විද්‍යා දිනයේදී සහතිකපත් හිමිවීම එයට සාක්ෂි දරනු ඇත.

මේ සියල්ලෙන්ම විසල්වූ ශාරීරික හා මානසික ශක්තීන්ගෙන් පෝෂිත වූ මම 2011 වසරේදී ශ්‍රී සංඝමිත්තා බාලිකා ජාතික පාසලේ විද්‍යා ගුරුමහත්ම මහත්මීන් හා එක්ව විදු දිනයක් පැවැත්වීම සඳහා තරඟ මාලාවක් සංවිධානය කළෙමි. එයට නාට්‍ය, විරිඳු, පෝස්ටර්, ගීත නිර්මාණ, භූමිකා රංගන, දැනුම මිනුම සහ විද්‍යා ප්‍රබන්ධ තරඟ ඇතුළත් විය. ජයග්‍රාහකයන් සඳහා රන්, රිදී, ලෝකඩ පදක්කම් හා සහතිකපත් ප්‍රදානය සිදු කළ අතර විද්‍යා සඟරාවක්ද එළි දැක්වීම ද සිදුවිය. විද්‍යා දිනයේ තේමාව වූයේ "විදු නැණසින් හරිත ලොවක් කරා" යන්නයි.

**"විද්‍යාවෙන් දැනුම ලබා**
**දහමින් විදුනැණ පාදා**
**නව නිපැයුම් ලොවට තනන**
**නව තෝතැන්නක්**
**විදු දින විදු නැණ වඩනා**
**නව තෝතැන්නක්."**

ඒ විදු දිනයේ තේමා ගීතයෙන් කොටසකි. මම ඒ විදු දිනය සිහිකරනුයේ අසීමිත ප්‍රීතියකිනි. එනම්, එදිනට සහභාගිවීම සඳහා අප කළ ආරාධනය පිළිගෙන, බොහෝ දුරකතර ගෙවා, අගනුවරින් බොහෝ ඈත ප්‍රදේශයක පිහිටි අප පාසලට ජාතික විද්‍යා පදනමේ විද්වතුන්ගේ පැමිණීම සියල්ලන්ටම සතුටකි. අප කළ ආරාධනය නිහතමානීව පිළිගත් ඔවුන්ගේ පැමිණීම අපට මහත් ශක්තියකි. එය මා ඉමහත් ගෞරවයෙන් සිහිපත් කරමි. ජාතික විද්‍යා පදනම පිළිබඳව සිදුකරන ලද ඉදිරිපත් කිරීම බොහෝ සිසු




පිරිසකට සහ ගුරුවරුන්ට වැදගත් විය. ඒ මන්දයත් විදු දිනය සඳහා මාතලේ වෙනත් පාසල් නියෝජනය කරන ගුරු සිසු පිරිසක්ද එහි සිටි බැවිනි. ප්‍රධාන දේශනය සඳහා ආරාධනා ලැබුවේද ජාතික විද්‍යා පදනම මගින් සපයන ලද ශ්‍රී ලාංකික විද්‍යාඥයකු විසිනි. එම දේශනය සියළුදෙනාටම ඉතා වටිනා කරුණු ඉගෙනීමට ලද අවස්ථාවක් බව මට පසක් විය. නිරන්තරයෙන් සිසුන් පමණක් නොව ගුරුවරුන් ධෛර්යමත් කිරීම පිළිබඳව ජාතික විද්‍යා පදනම වෙත අපගේ ස්තුතිය පළ කරනුයේ සෙනෙහසමුසු මහත් භක්තියෙනි. දැයේ දරුවන්ට ඔවුන්ගේ සෙවන මහා නුගරුකක් මෙනි.

ආ මග දෙස ආපසු හැරී බැලීමේදී නොමසුරුව කිවයුතු දෙයක් ඇත. විද්‍යා ගුරුවරියක ලෙස මා පන්ති කාමරයට හෝ විද්‍යාගාරයට පමණක් කොටු වූවකු බව කිසිවෙකුටත් කිව නොහැක. මා විද්‍යා ශිෂ්‍යයින් පන්ති කාමරයෙන් පරිසරයට ගෙන ආවෙමි. ඒ තුළ ඔවුන් ක්‍රියාකාරකම් වෙත සත්‍ය ලෙස යොමු කළෙමි. ඒ හරහා ඔවුන්ට විද්‍යාත්මක ගවේෂණ කළහැකි බවත් නවීන ලෝකය තුළ ඔවුන්ගේ භූමිකාව කෙසේ විය යුතුද යන්නත්, ප්‍රායෝගිකව දරුවන්ට ඉගැන්වීමට මට හැකියාව ලැබුණි. මේ සියළුදේ මට පසක් කරනුයේ මා සාර්ථක විද්‍යා ගුරුවරියක බව නොවේදැයි නිහතමානීව මම අසමි. මා තුළ වූ යමෙක් මෙසේ කියන බව මට ඇසේ. එහි රහස ඔබ පමණක්ම නොවේ. ඔබේ සාර්ථකත්වය නම් වූ ගසෙහි බීජය පැළ කළේ ද, එයට ජලයත්, පොහොරත් දමා අවැසි රැකවරණය සැලසුවේද වෙන කිසිවෙක් නොවේ. ඒ ජාතික විද්‍යා පදනමයි. එය එසේ පැවසිය යුතුමය. මගේ රහස එයම බව ලොවට හඬගා කියන්නට මම කිසිසේත් මැලි නොවෙමි.



දම්වැලක් සැකසීමට නම් එහි පුරුක් මනා ලෙස පෑස්සිය යුතුය. ජාතික විද්‍යා පදනමේ විද්‍යාව ප්‍රචලිතකිරීමේ අංශය කරනුයේ ද එයම නොවේදැයි මට සිතෙනුයේ ශ්‍රී ලංකාව සිසාරා පාසල් සමූහයක ගුරුවරුන්, සිසුන් විවිධ ස්ථානවලදී ඒකරාශිකොට, කලාපීය, පළාත් මට්ටම්වල වේදිකාවන් මතින් දැයේ දරුදැරියන්ගේ දක්ෂතා ජාතික වේදිකාවට ගෙන ආ අපූර්ව ආකාරය දෙස බැලීමෙනි. දරුවන් තුළ විද්‍යා ප්‍රබෝධයක් ඇතිකොට ඔවුන් නව විද්‍යාත්මක ලෝකය සමගින් බද්ධ කොට, අනෙකුත් මහද්වීප තුළට ශ්‍රී ලාංකික ගුරුවරුන්ගේ දූ දරුවන්ගේ ආගමනය සටහන් කරන්නටත් එයිනුදු නොනැවතී සමස්ත ලෝකය තුළ ශ්‍රී ලාංකේය නම සටහන් කරන්නටත් ඉඩහසර සලසා දෙන සහ අප වැනි ගුරුවරුන්ගේ භූමිකාව ඔපමට්ටම් කොට නවමු වර්ණයකින් වර්ණවත් කිරීමට උරදුන් ලබැඳි සොහොයුරුඃ "ජාතික විද්‍යා පදනම, ඔබට බෙහෙවින් ස්තුතියි" කියන්ට මෙසේ ඉඩහසර විවර කරගනුයේ සාර්ථක විද්‍යා ගුරුවරියක වීමේ රහස ඔබ මිස අන් කවරකුවත් නොවේ දැයි දෙවන වරටද ලොවට හඬගා කියමිනි.



මාතලේ
මා/ක්‍රිස්තුදේව ජාතික පාසල
**රේඛා ගුරුගේ**
sasajaya93@gmail.com
0714471867



# ගෝලීය විද්‍යා සහ තාක්ෂණවිද්‍යා සාක්ෂරතාව තහවුරුකරන ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය

මනුජ කරුණාරත්න



ජාතික විද්‍යා පදනම (N.S.F.) ශ්‍රී ලංකාව තුළ විද්‍යා සහ තාක්ෂණවිද්‍යා තොරතුරු හවුලේ පරිහරණය සලසන කේන්ද්‍රීය ස්ථානයය. පොදු ජනතාව වෙත විද්‍යාත්මක දැනුම ව්‍යාප්ත කිරීමේ කාර්යය විද්‍යා හා තාක්ෂණවිද්‍යා සන්නිවේදනය ලෙස හැඳින්වෙයි. මෙරට වෙසෙන විද්‍යාත්මක ප්‍රජාව වෙත විද්‍යාත්මක දැනුම රැගෙන යාම සඳහා විවිධ මාර්ග පවතියි. දැනුම හවුලේ පරිහරණය සඳහා අවශ්‍යවූ තොරතුරු බෙදාහැරීම වාර සඟරා, පෙළපොත්, ජර්නල් (වෘත්තියමය විද්වත් වාර ප්‍රකාශන), පුවත්පත්, නිබන්ධන ආදි විවිධ මුද්‍රිත මාධ්‍ය මගින් සිදුවෙයි. විද්‍යාව සන්නිවේදනය සඳහා වර්තමානයේ භාවිත කරන ජනප්‍රිය ක්‍රමවේද අතරට පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා "විද්‍යා දින" පැවැත්වීම, විද්‍යාත්මක ප්‍රජාවගේ දැනුම නංවාලීම සඳහා විද්‍යා ප්‍රදර්ශන, වැඩමුළු සහ විද්‍යා සම්මන්ත්‍රණ සංවිධානය කිරීම දැකිය හැකිය. මෙයට අමතරව ජාතික විද්‍යා පදනමෙහි, ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය (NSLRC) පොදුජනතාවට විද්‍යාත්මක දැනුම හිමිකර ගැනීමට, විද්‍යාව සහ තාක්ෂණවිද්‍යාව පිළිබඳ විවිධ මාර්ගගත සේවා සහ භෞතිකමය ප්‍රකාශන හා උපකරණ වෙත ප්‍රවේශවීමේ අවස්ථාව සලසා ඇත.

ජාතික විද්‍යා පදනම වෙත පවරා ඇති එක් වගකීමක් වන්නේ රටෙහි ඕනෑම සමාජයීය, දේශපාලනමය, ආර්ථික හා සංවර්ධන කාර්යයන්ට සම්බන්ධ විද්‍යා සහ තාක්ෂණවිද්‍යා ක්‍රමවේද හා පොදුකාර්ය සංවිධාන පිළිබඳව තොරතුරු සැපයීමය.

1970 දී ජාතික විද්‍යා පදනම සිය සේවා සැපයුම් මාර්ගයක් ලෙස පිහිටුවන ලද ශ්‍රී ලංකා විද්‍යාත්මක හා තාක්ෂණවිද්‍යා තොරතුරු මධ්‍යස්ථානය පසුකළෙක දී රටෙහි විද්‍යාව හා තාක්ෂණවිද්‍යාව සඳහා කැපවූ ප්‍රකාශන කෝෂ්ඨාගාරය බවට පත්විය. මෙම කෝෂ්ඨාගාරය තුළ මෙරට ප්‍රකාශිත හා අප්‍රකාශිත විද්‍යාත්මක ප්‍රලේඛන, ලෝක ව්‍යාප්ත සඟරාවන්හී පළවූ ලිපි, සම්මන්ත්‍රණ වාර්තා හා පත්‍රිකා පර්යේෂණ තොරතුරු නිබන්ධන, පර්යේෂණ පත්‍රිකා සහ තාක්ෂණ වාර්තා එක්රැස් කර ඇත. විද්‍යා සහිත්‍යමය ප්‍රකාශන සෙවීම්, දැනුවත්බව නංවාලීම, ප්‍රලේඛන සේවා සැපයීම, පුස්තකාල වෘත්තිකයන් පුහුණු කිරීම ඇතුළු සේවා සපයමින් පොදුජනතාව වෙත විද්‍යාව පදනම් වූ තොරතුරු සේවා පැය 24 පුරාම පවත්වා ගෙන යමින් තම අරමුණු සාක්ෂාත් කරගැනීමට ජාතික විද්‍යා පුස්තකාල සහ සම්පත් මධ්‍යස්ථානය කැපව සිටියි.

## විද්‍යාවෙහි සහ තාක්ෂණවිද්‍යාවෙහි වැදගත්කම නිරූපණය කිරීම

මෙරට තුළ විද්‍යා හා තාක්ෂණවිද්‍යා තොරතුරු හුවමාරු කරගැනීමට සහ හවුල් පරිහරණයට පවත්නා ප්‍රධානම කේන්ද්‍රස්ථානය වන්නේ ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානයය. ශ්‍රී ලංකාවෙහි සහ අනෙකුත් රටවල විද්‍යාඥයන් අතර තොරතුරු හුවමාරු කරගැනීම සහ තොරතුරු ජාලය ව්‍යාප්ත කිරීම සහ ශක්තිමත් කිරීම එහි ප්‍රමුඛ අරමුණු අතර වෙයි. මෙයට අමතරව පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්, විශ්වවිද්‍යාලයන්හී අධ්‍යාපනය ලබන්නාවුත්, පර්යේෂකයන් සහ විද්‍යා ශාස්ත්‍රඥයන් ඇතුළු විද්‍යාත්මක ප්‍රජාව වෙත, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ඔස්සේ කාර්යක්ෂම ලෙස තොරතුරු පැවරීමද ජාතික විද්‍යා පුස්තකාල සහ සම්පත් මධ්‍යස්ථානය ඉටුකරන තවත් වැදගත් සේවාවකි. විද්‍යාව හා තාක්ෂණවිද්‍යාවට අදාළ එවැනි තොරතුරු සමාජය වෙත සපයමින් හවුල් පරිහරණට යොමුකිරීමට තුළින් අවසානයේදී රටෙහි ආර්ථික සංවර්ධනයට අවශ්‍ය මූලික පදනමක් සැකසෙනු ඇත.

විද්‍යාව හා තාක්ෂණවිද්‍යාව පිළිබඳව අධ්‍යාපනික සහ වෘත්තියමය දැනුම නංවාලීමේ ඇති වැදගත්කම ජාතික විද්‍යා පදනම වටහාගෙන ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස පිහිටුවා ඇති Sri Lanka Scientific and Technology Information Network (ශ්‍රී ලංකා විද්‍යාත්මක සහ තාක්ෂණික

තොරතුරු ජාලය) (SLSTINET) හී අරමුණුව ඇත්තේ පුස්තකාල හා සම්බන්ධ වෘත්තිකයන්, පර්යේෂකයන්, ශිල්පශාස්ත්‍රඥයන් හා විද්‍යාඥයන් තුළ පවත්නා විද්‍යා හා තාක්ෂණවිද්‍යා දැනුම උස් තලයකට ගෙනයාමය. පුස්තකාල මෘදුකාංග හඳුන්වාදීම, දත්ත ඇතුළත් කිරීම උදෙසා සහාය සේවා සැපයීම, පුස්තකාල දත්ත සමුදා පුහුණු වැඩසටහන්වලට සංග්‍රහකත්වය දැක්වීම, සහ සම්මන්ත්‍රණ සංවිධානය ආදිය සඳහාවන කාර්යක්ෂම සේවා Sri Lanka Scientific and Technology Information Network (ශ්‍රී ලංකා විද්‍යාත්මක සහ තාක්ෂණික තොරතුරු ජාලය) (SLSTINET) මගින් සපයයි. දැනටමත් මෙමගින් පුස්තකාල 119ක් සඳහා සේවාවන් සැපයීමට ක්‍රියා කරනු ලබයි. මෙම සේවාවන්හි පූර්ණ ඵල ප්‍රයෝජන භුක්තිවිඳීම සඳහා පර්යේෂණ, විද්‍යා, තාක්ෂණවිද්‍යා සහ තාක්ෂණ ශිල්පීය නොවන ආයතන රැසක් ශ්‍රී ලංකා විද්‍යාත්මක සහ තාක්ෂණික තොරතුරු ජාලය (SLSTINET) හී සාමාජිකත්වය ලබා ඇත.

ජාතික විද්‍යා පුස්තකාල සහ සම්පත් මධ්‍යස්ථානය සතුව, දේශීය හා අන්තර්ජාතික පර්යේෂණ ප්‍රකාශන තාක්ෂණ වාර්තා, විද්‍යා ප්‍රතිපත්ති ප්‍රකාශන, නවෝත්පාදන වාර්තා, ආදියෙහි විශාල එකතුවක් මෙන්ම වාර සඟරා එකතුවක්, දේශීය හා අන්තර්ජාතික විද්‍යුත් සඟරා සමූහයක්, සම්මන්ත්‍රණ වාර්තා ආදියෙහි එකතුවක් ද පවතියි.

ජාතික විද්‍යා පදනම විසින් ප්‍රදාන සැපයූ පර්යේෂණයන්හී වාර්තා, ජාතික විද්‍යා පදනමේ නිබන්ධ මාලා, විදුරාව සඟරා කලාප, මෙන්ම සමාජ විද්‍යාව පිළිබඳ ශ්‍රී ලංකා ජර්නලය සහ ජාතික විද්‍යා පදනමේ ජර්නලයේද පැරණි කලාප ඇතුළත් අතිවිශාල එකතුවක්ද



ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානයේ සේවාවන්

ජාතික විද්‍යා පුස්තකාල සහ සම්පත් මධ්‍යස්ථානය පවත්වා ගෙන යන්නේ විද්‍යාත්මක ප්‍රජාව අතරට විද්‍යාත්මක තොරතුරු පතුරුවා හැරීමේ පියවරක් ලෙසය. ඔවුනට දැන් www.dl.nsf.ac.lk හරහා ජාතික විද්‍යා පුස්තකාල සහ සම්පත් මධ්‍යස්ථානයේ සංඛ්‍යාංක කෝෂ්ඨාගාරයේ පවතින දේශීයව ප්‍රකාශිත විද්‍යාත්මක ප්‍රකාශන වෙත නොමිලයේ ප්‍රවේශ විය හැකිය.

### ජාතික විද්‍යා පුස්තකාල සහ සම්පත් මධ්‍යස්ථානයේ වෙබ් අඩවිය මධ්‍යම පිවිසුම් මගක් ලෙස ක්‍රියා කරයි

ජාතික විද්‍යා පුස්තකාල සහ සම්පත් මධ්‍යස්ථානයෙහි වෙබ් පිටුව, දේශීය හා ජාත්‍යන්තර විද්‍යාත්මක ප්‍රකාශනයන් හී අඩංගු තොරතුරු හවුල් පරිහරණය සලසන කැපී පෙනෙන මධ්‍යස්ථානයකි. එය සැලසුම් කර ඇත්තේ විද්‍යාත්මක තොරතුරු සපයන මධ්‍යස්ථානයක් ලෙස සහ ඒ හා සමගාමීවම පාසැල් මට්ටමේ සිට පර්යේෂකයන් දක්වා වන විවිධ විද්‍යාත්මක තොරතුරු අවශ්‍යවුවන් ආවරණය වන පරිදි විද්‍යාත්මක තොරතුරු ලබාගැනීම සඳහා පහසුවෙන් ප්‍රවේශ විය හැකි තැනක් වීමේ ඉලක්කයක් ඇතිවය. එමගින් විද්‍යාත්මක ප්‍රජාවනට දැන් nslrc.nsf.gov.lk/new එබීම තුළින් වඩා දියුණු සෙවුම් මෙවලම් හරහා දේශීය සඟරා ලිපි හා ප්‍රකාශන වෙත ප්‍රවේශවීමේ වාසිය උදාකර ඇත.

### මාර්ගගත ප්‍රවේශය පහසු කරන සංඛ්‍යාංක පුස්තකාලය

පර්යේෂකයන්, විද්‍යාඥයන්, ශාස්ත්‍රඥයන් සහ පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ දැනුම් පදනම ඉහළ නංවාලීම උදෙසා විද්‍යා හා තාක්ෂණවිද්‍යා ආයතනවලට අදාළ ලිපි සහ ප්‍රකාශන සඳහා සංඛ්‍යාංක තොරතුරු ජාලයක, ජාතික කෝෂ්ඨාගාරයක් පැවතීමේ ජාතික වැදගත්කම ජාතික විද්‍යා පදනම හඳුනාගෙන ඇත. දේශීය විද්‍යාඥයන්ගේ විද්‍යා ප්‍රකාශන සංචිත කිරීමේ අපේක්ෂාවෙන් වර්ෂ 2009 දී ප්‍රථම සංඛ්‍යාංක කෝෂ්ඨාගාරය පිහිටුවනු ලැබුයේ මෙම අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසාය. එමගින් ඔවුන් අතර තොරතුරු සංසරණය, දත්ත ආරක්ෂණය සහ විවෘතාකාරයේ නිදහසේ ප්‍රවේශ වී එම ප්‍රකාශන හවුල් පරිහරණය සඳහා අවස්ථාව උදා කෙරින. 2011 දී ජාතික විද්‍යා පදනම, ජාතික සංඛ්‍යාංකකරණ වැඩසටහන (NDP) ආරම්භ කරනු ලැබුයේ දිවයින පුරා පිහිටුවා ඇති පර්යේෂණ සහ ශාස්ත්‍රීය පුස්තකාල තුළ දැනට පවත්නා දේශීය විද්‍යා හා තාක්ෂණවිද්‍යා සාහිත්‍යමය ප්‍රකාශන සංඛ්‍යාංකකරණය සඳහාය. එමගින් ශ්‍රාස්ත්‍රීය, පර්යේෂණ සහ ඒ ආශ්‍රිත අයතනයන්හී පවත්නා සම්පූර්ණ පාඨ වාර්තාගතව පහසුවෙන් සහ ඉක්මණින් ප්‍රවේශගත වීමට සලස්වන ආයතනික කෝෂ්ඨාගාර ජාතික ජාලයන් බිහිකරනු ලැබීය. එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ සමාජ සහ ආර්ථික සංවර්ධනයට උපකාරීවන ඵලදායී පර්යේෂණවලට සහ නවෝත්පාදනයන්ට සහාය වන සහ ප්‍රවර්ධනය කරන මාර්ගයකට දොරටු විවෘත කිරීමට ජාතික සංඛ්‍යාංකකරණ වැඩසටහන සමත්විය. එසේම තම සංඛ්‍යාංක කෝෂ්ඨාගාර සංවර්ධනය

කරගැනීම සඳහා තවදුරටත් සහාය පැතූ අනෙකුත් පුස්තකාල සඳහාද එතැන්හීදීම සංග්‍රහක පහසුකම් සැලසීමද ජාතික විද්‍යා පදනම මගින් සිදුකරනු ලැබීය.

සංඛ්‍යාංක කෝෂ්ඨාගාරය **ඩී.ස්පේස්** (DSpace) මෘදුකාංගය ඔස්සේ ධාවනය කරන අතර ඒ තුළ මේ වන විට පූර්ණ පාඨ ලිපි 5500ක් පමණ dl.nsf.ac.lk වෙබ් පිටුව හරහා සමාලෝචනය උදෙසා තැන්පත්ව පවතියි.

## දේශීය දත්ත සමුදා හරහා ජාතික විද්‍යා පුස්තකාලය හා සම්පත් මධ්‍යස්ථානය සිදුකරන අත්‍යාවශ්‍ය සේවා

### ශ්‍රී ලංකා විද්‍යා සුචිය (SLSID)

ශ්‍රී ලංකා විද්‍යා සුචිය වෙත යොමුවීමෙන් තවත් දැනුම හිමිකර ගැනීමට විද්‍යා ප්‍රජාවට දැන් හැකියාව ලැබී ඇත. මෙහි විද්‍යා හා තාක්ෂණවිද්‍යා පර්යේෂණ ලිපි 40,000කට වැඩි සංඛ්‍යාවක් දේශීය පර්යේෂකයන් විසින් සමාලෝචනය කර ඒකාධිකාරී ලෙස සංක්ෂිප්ත කර ඇත්තකි. සමාලෝචකයන් හට මෙහි අඩංගු ඕනෑම ජර්නල් ලිපියක්, සම්මන්ත්‍රණ පත්‍රිකාවක්, පර්යේෂණ වාර්තාවක්, තාක්ෂණ ශිල්පීය වාර්තාවක්, පර්යේෂණයක් සහ අප්‍රකාශිත ලිපියක් වෙත මුළු පාඨ ලිපියක් ලෙස යොමුවීමට හෝ අවශ්‍ය නම් අන්තර්ජාලය හරහා මිලදී ගැනීමට හෝ පුළුවන.

### ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය (SLAAS)

ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ වාර්ෂික වාර්තා සාරාංශමය වශයෙන් විද්‍යා ප්‍රගති තොරතුරු හවුල් පරිහරණය අපේක්ෂාවෙන්, ජාතික විද්‍යා පුස්තකාල සහ සම්පත් මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයට දායකත්වය දක්වයි. 1970 - 2016 කාලය තුළ මෙමගින් ප්‍රකාශිත පත්‍රිකා 8,367 ක් පවත්වාගෙන යමින් පවතියි.

### පර්යේෂණ ප්‍රදාන දත්ත සමුදාය (RGRA)

පර්යේෂණ හැකියා, නවෝත්පාදන නංවාලීම සහ ඵලදායීතාව තහවුරු කිරීම අරමුණු කරගනිමින් ජාතික විද්‍යා පදනම පර්යේෂණ ප්‍රදාන පිරිනමයි. ජාතික විද්‍යා පදනම මූල්‍ය අනුග්‍රහය දැක්වූ පර්යේෂණ ව්‍යාපෘති සහ උපාධි පර්යේෂණ 2110 ක සාරාංශ ගත තොරතුරු පර්යේෂණ ප්‍රදාන දත්ත සමුදායෙහි අඩංගු කර ඇත. මේ පිළිබඳ වැඩි තොරතුරු ලබාගැනීමට htttp://www.viduketha.nsf.ac.lk වෙත පිවිසෙන්න.



ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානයේ සංඛ්‍යාංක පුස්තකාල සේවාවන්

### ශ්‍රී ලංකා මාර්ගගත ජර්නලය (SLJOL)

ජාතික විද්‍යා පදනම ශ්‍රී ලංකා මාර්ගගත ජර්නලය හඳුන්වා දෙනු ලැබූයේ විද්‍යාත්මක ප්‍රජාවට දැනට පළවෙන දේශීය විද්‍යාත්මක ජර්නල ප්‍රකාශන මාර්ගගත වේදිකාවක් තුළින් ලබාගැනීමේදී පවත්නා තොරතුරු හිඩැස පියවීම සඳහාය.

මේ වන විට ශ්‍රී ලංකා මාර්ගගත ජර්නලය දේශීයව ප්‍රකාශයට පත් ජර්නල දත්ත සමුදායක් පවත්වාගෙන යයි. එය දැනට ශ්‍රී ලංකාවේ ප්‍රකාශිත ශාස්ත්‍රීය ජර්නල 25ක කලාප 1005 ආවරණය කරයි. එසේම එය කෘෂිකර්මය, ඉංජිනේරු විද්‍යාව, වෛද්‍ය විද්‍යාව සහ සමාජ විද්‍යාව යන ක්ෂේත්‍රවල දේශීය ජර්නල ලිපි 9056 කට සංග්‍රහකත්වය දක්වයි. තොරතුරු විශ්ලේෂණයෙහිලා සහාය දක්වන පිරික්සන්නන්හට ප්‍රයෝජනවත් වන අංග ගණනාවක්ද මෙමගින් සපයයි.

ශ්‍රී ලංකා මාර්ගගත ජර්නලයෙහි, මාර්ගගත වේදිකාව ජාතික විද්‍යා පදනම මගින් කළමනාකරණය සිදුකරනුයේ තොරතුරු ලැබීමේ බාධාවන්ට මුහුණ දෙන්නවුන් හට ප්‍රායෝගික සහ තාක්ෂණික විසඳුම් ලැබෙන ආකාරයටය. සංඛ්‍යාංක ආකාරයේ සැකසුමකින් ලබාගත හැකි මෙම ප්‍රකාශන, ජර්නල මුළු පාඨයම අවශ්‍ය පිරික්සන්නන්හට ප්‍රවේශවීමට හැකිය. මෙයට අමතරව දේශීය ජර්නල සංස්කාරකයන්, උනන්දු කිරීමට සහ අභිප්‍රේරණය කිරීමට වැඩමුළු හා පුහුණු සැසිවාරද පවත්වයි. http://www.sljol.info වෙබ් පිටුව තුළින් විද්‍යා ප්‍රජාවට, ශ්‍රී ලංකා මාර්ගගත ජර්නලයට නොමිලයේ පිවිසිය හැකිය.

## ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය ජාත්‍යන්තර විද්‍යාව හා තාක්ෂණ විද්‍යාව හකුලුවා ගනියි

### උපුටා දැක්වීමේ සහ සාරසංග්‍රහ කිරීමේ දත්තපාදකය (SCOUPUS)

ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය උපුටා දැක්වීමේ සහ සාරසංග්‍රහ කිරීමේ දත්තපාදකය (SCOUPUS) හටද දායකව ඇත. මෙය ගෝලීය විද්‍යාත්මක අන්තර්ගතයට, වඩාත් කාර්යක්ෂම දැනුම තොරතුරු විශ්ලේෂණ මෙවලම් හරහා විසඳුම් රාශියක් සපයනු ලබයි. එහි අරමුණවන්නේ පර්යේෂකයන් වඩා උසස් මට්ටමකට ගෙන ඒම මෙන්ම මිලියන 27කට වඩා වැඩි පේටන්ට් (නිර්මාණ හිමිකම්) වාර්තා, ඉ-මුද්‍රණ, නිබන්ධන සංඛ්‍යාවක් ආවරණය කරන මිනුම් සමග ආයතනික ඵලදායිතා මඟගැන්වීමක් සැකසීමය. එහි ප්‍රතිඵලය වන්නේ වෙළඳ ප්‍රකාශන 360ක එකතුවක්, 530කට වැඩි මාර්ගගත පොත් මාලාවක් සහ මිලියන 72 කට වැඩි සම්මන්ත්‍රණ පත්‍රිකා රාශියක් හරහා විද්‍යාත්මක ප්‍රජාව වෙත සුවිශාල දැනුම් සම්භාරයක් ලැබීම පහසු කරවීමය. මෙයට අමතරව මෙම ජාත්‍යන්තර දත්ත සමුදාය සම්පාදස්ථයන් විසින් සමාලෝචනය කළ, ප්‍රකාශකයන් 5000කට වැඩි සංඛ්‍යාවක් පළකළ ජර්නල් 21500ක් වෙත නිර්වද්‍ය ප්‍රවේශයක් පිරිනමයි. උපුටා දැක්වීමේ සහ සාරසංග්‍රහ කිරීමේ දත්තපාදකය (SCOUPUS) යනු වේගවත්, භාවිත කරන්නවුන්හට මිතුරු සහ පරිපූර්ණ මාර්ගගත දත්ත සමුදායකි. එය විද්‍යාව, තාක්ෂණවිද්‍යා, වෛද්‍ය විද්‍යා, සමාජ විද්‍යා, කලා සහ මානව විද්‍යා ආදී ක්ෂේත්‍රයන්හී පර්යේෂණ සඳහා සහාය දක්වයි. මෙය පිළිබඳ විස්තර http://www.scoups.com වෙතින් ලබාගැනීමට පුළුවන.

### අත්‍යාවශ්‍ය කෘෂිකාර්මික තොරතුරු ජාලය / පුස්තකාලය - The Essential Electronic Agricultural (TEEAL)

ප්‍රධාන පෙළේ ප්‍රකාශකයන් සහ සමාලෝචකයන් විසින් ප්‍රකාශයට පත්කළ කෘෂිකාර්මික ජර්නල 425ක අඩංගු කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළ විශිෂ්ට තොරතුරු එකතුවක් අත්‍යාවශ්‍ය කෘෂිකාර්මික තොරතුර ජාලය / පුස්තකාලය - The Essential Electronic Agricultural (TEEAL) වෙතින් සැපයෙයි. මෙම තොරතුරු http://teeal .nsf.ac.lk හරහා නොමිලයේ ප්‍රවේශ විය හැකිය.

### පර්යේෂණ මූලාරම්භයන් වෙත සෞඛ්‍ය අන්තර්ජාල ප්‍රවේශ්‍ය (HINARI)

මෙම වැඩසටහන පිහිටුවා ඇත්තේ ලෝකයේ විශාලතම ජෛව වෛද්‍යමය සහ සෞඛ්‍ය විද්‍යා ප්‍රකාශන සාහිත්‍යය එකතුව වෙත ප්‍රවේශවීම සඳහාය. මෙම වැඩසටහන තුළ ජර්නල 13500 (විවිධ භාෂා 45කින් පළවන) සහ ඉ-ග්‍රන්ථ 60,000ක් පමණ මෙන්ම තවත් තොරතුරු සම්පත් 110ක් පමණ අඩංගුය. මේ සියල්ල දැන් රටවල්, ප්‍රදේශ, බලප්‍රදේශ 115කට වැඩි සංඛ්‍යාවක, සෞඛ්‍ය ආයතනවල සේවය කරන දහස් සංඛ්‍යාත සෞඛ්‍ය කාර්ය මණ්ඩල සාමාජිකයන් සහ පර්යේෂකයන් අත පත්ව ඇත්තේ, ලෝක සෞඛ්‍යය නංවාලීමේ දායකත්වය සපයමිනි.

### කෘෂිකර්මය පිළිබඳ ගෝලීය මාර්ගගත පර්යේෂණ තොරතුරු ප්‍රවේශය - (Online Research in Agriculture) (AGORA)

කෘෂිකාර්මික දැනුමෙහි පවත්නා පරතර මකාදැමීම සඳහා, කෘෂිකර්මය පිළිබඳ ගෝලීය මාර්ගගත පර්යේෂණ තොරතුරු ප්‍රවේශය (AGORA) ආහාර කෘෂිකර්මය, පරිසර විද්‍යාව සහ අදාළ ක්ෂේත්‍රයන් ආවරණය කරන සංඛ්‍යාංකිත කෘෂිකාර්මික ජර්නල හවුල් පරිහරණයට ඉඩ සලසයි. තවදුරටත් මෙම පහසුකම් මගින් ජර්නල 21000ක සංඛ්‍යාවක් ආවරණය කිරීමද මෙමගින් සිදුවෙයි.

### සංවර්ධනය සහ නවෝත්පාදන සඳහාවන පර්යේෂණ වෙත ප්‍රවේශ්‍ය - Access to Research for Development and Indormation (ARDI)

විවිධ ක්ෂේත්‍රවල නියැලි විද්‍යාඥයන්හට ශාස්ත්‍රීය සාහිත්‍යමය ප්‍රකාශන වෙත නොමිලයේ මාර්ගගත ප්‍රවේශය ලබාගැනීමට සංවර්ධනය සහ නවෝත්පාදන සඳහාවන පර්යේෂණ වෙත ප්‍රවේශ්‍ය පහසුකම් සලසයි. එමගින් විද්‍යාව සහ තාක්ෂණවිද්‍යා තොරතුරු රැගත් ජර්නල්, පොත් සහ වෙනත් අදාළ තොරතුරු සපයන 10,000ක් ප්‍රකාශන ආවරණය කෙරෙයි. ජාතික විද්‍යා හා තාක්ෂණවිද්‍යා පුස්තකාලය විද්‍යාඥයන්, විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයන්, ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහ පොදුජනතාව සමග තොරතුරු හවුල් පරිහරණයෙහි යෙදේ. එසේම අවශ්‍ය තොරතුරු ජර්නල්, ඡායාරූප සහ අන්තර්ජාලය හරහා ලබාගැනීමටද හැකිය.

ජාතික විද්‍යා පුස්තකාලයක සහ සම්පත් මධ්‍යස්ථානය (NSLRC) වැඩ කරන දිනවල උදෑසන 8.30 සිට සවස 4.15 දක්වා සේවා සැපයීම සඳහා විවෘතව පවතියි. එසේම දුරකථනය මගින් 0112696771-3 ඇමතීමෙන් සහ www.nsf.ac.lk වෙත පිවිසීමෙන් ද තොරතුරු ලබාගැනීමට ජනතාවට පුළුවන.



ජාතික විද්‍යා පදනම
ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය
අංශ ප්‍රධානි
**මනුජ කරුණාරත්න**
manuja@nsf.ac.lk
0712479491
0112679981



# විද්‍යාත්මක ලේඛනය සහ ප්‍රකාශනයඃ දැනුම සන්නිවේදනයට මඟක්

ආචාර්ය එස්. ඒ. වී. මූර්ති




ලේඛනය, විද්‍යාත්මක කාර්යයන් සන්නිවේදනයට පවත්නා ඉතා වැදගත් ක්‍රමයකි. අදහස්, පර්යේෂණ සොයාගැනීම් සහ නව සංවර්ධන තොරතුරු අනෙකුත් අය වෙත සන්නිවේදනය කිරීමට සහ ලේඛනගත කිරීමට ලේඛනය යොදාගැනෙයි. විද්‍යාත්මක ලේඛනයෙහි විවිධ ආකාර පවතියි. පර්යේෂණ පත්‍රිකා, ලිපි, සමාලෝචන, පොත් පරිච්ඡේද, පර්යේෂණ සටහන් යනාදිය ඒ අතර දැකිය හැකිය. ලිපි සහ පර්යේෂණ පත්‍රිකා, ශාස්ත්‍රීය සඟරා (ජර්නල්) සහ සඟරා තුළ පළකිරීමෙන් අදාළ තොරතුරු ලේඛිතව තැන්පත් කිරීමට සහ ඒවායේ අගය ඉහළ නංවාලීමට හේතුවෙයි. පර්යේෂණ පැවැත්වීම, චක්‍රයේ එක් කොටසක් පමණය. චක්‍රය සම්පූර්ණවන්නේ අදාළ පර්යේෂණයෙහි සොයාගැනීම් ප්‍රකාශයට පත්කිරීමෙන් පසුවය. එසේ කටයුතු කරන පර්යේෂකයන්හට, තමන් නියැලි ක්ෂේත්‍රය තුළ විද්වතුන් ලෙස පිළිගැනීමක් සහ සම්භාවනයක් ලැබීමට, තුති පිදීමක් සහ අගය කිරීමක් හිමි කරගැනීමට දේශීය වශයෙන් මෙන්ම අන්තර්ජාතික වශයෙන්ද හැකිවෙයි. එම පිළිගැනීම අදාළ පර්යේෂකයාට පමණක් නොව සේවය කරන ආයතනයට හා දෙපාර්තමේන්තුවට ද හිමිවෙයි. තෝරාගත් මාතෘකාව ජාත්‍යන්තර වශයෙන් වැදගත්වන අවස්ථාවකදී පර්යේෂකයා වෙසෙන රටටද මහත් ගෞරවයක් එමගින් හිමිවීම නිරායාසයෙන් සිදුවෙයි.

දර්ශන විද්‍යාවෙහි ඉතිහාසය සහ විද්‍යා ප්‍රතිපත්ති පිළිබඳව කැපී පෙනෙන ලෙස බොහෝ දෑ ලියූ "ඩෙරෙක් සොලාඩ් ප්‍රයිස්" නම් වූ 20වන සියවසේ මැදභාගයේ විසූ ලේඛකයා 1967 දී ඔහුගේ එක් ශාස්ත්‍රීය පත්‍රිකාවක මාතෘකාව ලෙස යොදා තිබුනේ "ජාතියකට පළකිරීමට හෝ නොඑසේ නම් වැනසී යාමට හෝ හැකිබවය". මෙය පසුකලෙක ඉතා ජනප්‍රිය ආදර්ශ පාඨයක් බවට ද පත්විය.

## විද්‍යාත්මක ලේඛනය සහ ප්‍රකාශනය

රොබට් ඩේල් ගේ මතය අනුව විද්‍යාත්මක පත්‍රිකාවක් යනු "මුල් පර්යේෂණයක ප්‍රතිඵල විස්තර කරමින් ලියා ප්‍රකාශයට පත් කරනු ලැබූවකි". ඔහුගේ අදහස අනුව විද්‍යාත්මක පත්‍රිකාව වලංගු ප්‍රකාශනයක් විය යුතුවා මෙන්ම නිවැරදි ස්ථානයක පළ කරනු ලැබුවක්ද වීම අවශ්‍යය. පර්යේෂණ ලිපියක් යනු ශාස්ත්‍රීය සඟරාවක් (ජර්නලයක) පළකරනු ලැබූ, මුල් අධ්‍යයනයක ලිඛිත ආකාරයය. එහෙයින් එය තොරතුරු සපයන ප්‍රාථමික මූලාශ්‍රයකි. විද්‍යාත්මක පත්‍රිකාවක් සරල, පැහැදිලි, අපක්ෂපාතී, නිවැරදි සහ තර්කානුකූලව ගොඩනැගූ ව්‍යුහයකින් යුක්තවිය යුතුය. විද්‍යාත්මක පත්‍රිකාවක් රචනයේදී ලේඛන රටාව, භාවිත කරන භාෂාව, අපේක්ෂිත ඉලක්ක පාඨක සමූහය ආදී කරුණුද සැලකිල්ලට ලක්කළ යුතුය. පොදුවේ ගත්කළ තාක්ෂණික (පාරිභාෂිත) වචන, දිගු වචන හා දිගු වාක්‍ය භාවිතයෙන්ද වැළකීම මැනවි.

තම තමන් නියැලි පර්යේෂණ ප්‍රතිඵල අනෙකුත් විද්‍යාඥයන් වෙත සන්නිවේදනය කිරීමට, විද්‍යාඥයන් හට යොදාගත හැකි ක්‍රමයක් ලෙස විද්‍යාත්මක පර්යේෂණ ලිපි හැඳින්වීමට පුළුවන. විද්‍යාත්මක ලිපි රචනයේදී යොදාගැනෙන පොදු සම්මත ආකාරය තුළට මාතෘකාව, කතෘනාමය සහ අනුබද්ධ හෝ නිල වශයෙන් සම්බන්ධ ආයතනය, හැඳින්වීමට යොදාගත් උපකරණ හා භාවිත කළ ක්‍රමවේදය, ප්‍රතිඵල, සාකච්ඡාව, ස්තුතිය සහ ආශ්‍රිතයන් දැක්වීම ඇතුළත්ය. එහිදී ප්‍රතිඵල ඉදිරිපත් කරනුයේ ක්‍රමානුකූල හා තර්කානුකූල ආකාරයටය. මෑත කාලයේදී වැඩිපුරම අවධානය යොමුකර ඇත්තේ ශාස්ත්‍රීය ආයතනවලින් පළ කෙරෙන ප්‍රකාශන වෙතය.

පර්යේෂණ ප්‍රතිඵල / සොයාගැනීම ප්‍රකාශයට පත්කිරීම විද්‍යාවෙහි සංවර්ධනය සහ වර්ධනය කෙරෙහි බලපෑමක් ඇතිකරයි. එවැනි ප්‍රතිඵල හා අදහස් සඟවා තබාගතහොත් විද්‍යාවෙහි ප්‍රගමනයක් සිදුනොවනු ඇත. ප්‍රකාශයට පත්කිරීම තුළින් දැනුම නිර්මාණයට දායකවීමේ අවස්ථාව හිමිවෙයි. මෙයට අමතරව අදාළ සොයාගැනීම හා ප්‍රතිඵල වෙත එල්ල වන එලදායී විවේචන හේතුවෙන්,

අනෙකුත් පර්යේෂකයන්හට, අදාළ ක්ෂේත්‍රය තුළ තවතවත් පර්යේෂණ සිදු කිරීමට දිරිගැන්වීමක් සහ උදව්කිරීමක් සැපයෙනවා මෙන්ම, ප්‍රතිපත්ති සම්පාදකයන් හට තහවුරු කළ කරුණු පදනම් වූ ප්‍රතිපත්ති සංවර්ධනය කිරීමටත් අවස්ථාව සැලසෙයි. එසේම එමගින් උත්පාදනය වූ සාක්ෂි / තහවුරු කළ කරුණු පිළිගනිමින් සහ අගය කරමින් තීරණ ගැනීමේ හැකියාවක් ලබාදෙයි. මෙය රටෙහි සමාජ - ආර්ථික සංවර්ධනය කෙරෙහි දායකවනවා මෙන්ම ජනතාවගේ යහපැවැත්ම ද ඉහළ නැංවීමටද සමත් වන්නකි.

## පළකිරීමට පවත්නා අවශ්‍යතාවය කුමක්ද?

ශාස්ත්‍රඥයකුගේ වෘත්තීයමය ජීවිතයේ සාර්ථකත්වය සඳහා ඔහුගේ පර්යේෂණ සොයාගැනීම් පළකිරීම අත්‍යාවශ්‍යය. එමගින් විද්‍යාඥයා / පර්යේෂකයාගේ කීර්තිය නංවාලීමට සහ නව විද්‍යාත්මක සහයෝගීතා සහ උපදේශක තත්වයන් ඇති කිරීමට උදව්වනවා පමණක් නොව නව පර්යේෂණ සොයාගැනීම් යාවත්කාලීන කිරීමටද හේතුවකි. තවදුරටත් විමසනවිට මෙවැනි පළකිරීම් චක්‍ර ප්‍රදාන හිමිකරදීමට ද සමත්ය. උදාහරණ ලෙස පර්යේෂකයාගේ රැකියා අපේක්ෂා සහ උසස්වීම් ලැබීමේ හැකියාව ඉහළ නැංවීමට හැකිවීම දැක්වීමට පුළුවන. නව සොයාගැනීම් ප්‍රතිඵල ප්‍රකාශයට පත්කිරීම තුළින් ලැබිය හැකි පහත දැක්වෙන ඵල ප්‍රයෝජන සැලකිල්ලට ගත්විට විද්‍යාඥයන් / පර්යේෂකයන් තම ප්‍රතිඵල, විද්‍යාත්මක ලිපි ලෙස පළකිරීමට උනන්දුවනවා නිසැකය.

## පළකිරීමට මුල්වන හේතු

- ❖ කිසියම් දෙයක් අළුතෙන් සොයාගත් බව අන්‍යයන්ට දැනගැනීමට සැලැස්වීමට.
- ❖ ඉතා ගෞරවනීය සහ ඵලදායී ආකාරයෙන් ප්‍රතිඵල ව්‍යාප්ත කිරීමට සැලැස්වීමට.
- ❖ අදහස් හුවමාරු කරගැනීමට.
- ❖ දැනට පවත්නා දැනුම් සම්භාරය තුළට අළුතෙන් යමක් එකතු කිරීමට.
- ❖ ශාස්ත්‍රීය පිළිගැනීමට ලක්වීමට සහ තම වෘත්තීය තත්වය ඉහළ නංවාගැනීමට.
- ❖ තම පෞද්ගලික ප්‍රතිරූපය වඩා ශක්තිමත් කරගැනීමට.
- ❖ තම සන්නිවේදන සහ ලේඛන කුසලතා වඩා යහපත් කරගැනීමට.
- ❖ තමන් වෙත සමාලෝචකයන්ගෙන් ලැබෙන නිර්මාණාත්මක ප්‍රතිපෝෂණ තුළින් ඉගෙනීමට.
- ❖ අගනා සහයෝගීතාවන් ඇතිකර ගැනීමට.
- ❖ පවත්නා ප්‍රතිපත්තිය සංවර්ධනය කරගැනීමට හෝ දියුණු කරගැනීමට.
- ❖ පෞද්ගලිකව තෘප්තිමත් වීමට සහ ආත්ම විශ්වාසය නංවාගැනීමට.
- ❖ මූල්‍යාධාර සපයන නියෝජිත ආයතනයන්ට කාර්ය නිම කළ බව පෙන්වාදීමට.

පළකිරීම් සිදුකිරීම සඳහා මුල්වන හේතු අතර පවතියි.

## විද්‍යාත්මක සඟරාවක (සයන්ස්ටිෆික් ජර්නලයක) කාර්යභාරය

පර්යේෂකයන් තමන් සිදුකළ කාර්යයන් ප්‍රකාශකිරීම සහ ව්‍යාප්ත කිරීම විවිධාකාරයෙන් සිදුකරති. ග්‍රන්ථ, ශාස්ත්‍රීය සඟරා (ජර්නල), සම්මන්ත්‍රණ, මුද්‍රිත වාර්තා වැනි පළකිරීම් ඒ සඳහා උදාහරණය. පළකිරීම සඳහා යොදාගන්නා විවිධ ආකාරයන්, විවිධ විෂය ක්ෂේත්‍ර අතර වෙනස්කම් දක්වයි. ශාස්ත්‍රීය සඟරා (ඇකඩමික් ජර්නල්) ප්‍රථමයෙන් පළවූයේ 17වන සියවසේ මැදභාගයේදීය. දැනුම ව්‍යාප්තකිරීමේ ක්‍රමයක් ලෙස එහි ඇති වැදගත්කම එතැන් සිට බොහෝ වර්ධනය වී ඇත. ප්‍රජාව වෙත නිවැරදි තොරතුරු ව්‍යාප්ත කිරීමෙහිලා වැදගත් කාර්යභාරයක් ශාස්ත්‍රීය සඟරා (ජර්නල) මත පැවරෙයි. විද්‍යාත්මක සඟරාවකට (ජර්නලයකට) අන්තර්ජාතික පිළිගැනීමක් හිමිකර ගැනීමට නම් ගුණාත්මක බවින් උසස් ලිපි පළකිරීම අනිවාර්යයෙන්ම කළයුතු වෙයි. මෙම කාර්යයේදී කතෘවරු සහ සමාලෝචකයන් ඉතා වැදගත් කාර්යයභාරයක් ඉටු කරයි.

ශාස්ත්‍රීය ප්‍රකාශනයේදී, විද්‍යාත්මක සඟරාවක් (සයන්ටිෆික් ජර්නල්) යනු සාමාන්‍යයෙන් නව පර්යේෂණ සොයාගැනීම් වාර්තා කරන විද්‍යාවෙහි ප්‍රගමනය තවදුරටත් සිදුකිරීමේ අපේක්ෂාවෙන් පළකෙරෙන වාර ප්‍රකාශනයකි. විද්‍යාත්මක ජර්නල, විද්‍යාත්මක පරීක්ෂණ ඉදිරිපත් කරන, ඒවා දෙස විචක්ෂණයෙන් බැලීම සහ සාකච්ඡාවට ලක්කරන ස්ථිර හා විනිවිදභාවයෙන් යුත් වේදිකාවක් ලෙස කටයුතු කරයි. මෙම ජර්නලයන්හී පළකෙරෙන ලිපි බොහෝවිට සම - පදස්ථයන් විසින් සමාලෝචනය කරනු ලැබූ දේ වෙයි. පළවෙන විද්‍යාත්මක සඟරා නොහොත් "සයන්ටිෆික් ජර්නල්" සංඛ්‍යාව දහස් ගණනකි. ඉන් සමහරක් සම - පදස්ථ සමාලෝචිතය. තවත් සමහරක් සුචිගතව සම - පදස්ථ සමාලෝචිතය. මේ අතර සම - පදස්ථ සමාලෝචනයට කල් නොවූ ජර්නල ද පවතියි.

## සම - පදස්ථ සමාලෝචිත සහ සුචිගත ජර්නල

සම - පදස්ථ සමාලෝචිත ලෙස සැලකෙන්නේ කතුවරුන්ට සමාන නිපුනතාවයක් ඇති විද්වතෙකු හෝ විද්වතුන් සමූහයක් හෝ විසින්, ජර්නලයෙහි පළකිරීමට පළමු ඒවායෙහි ගුණාත්මකභාවය, විද්‍යාත්මක වලංගුභාවය, නිර්වද්‍යතාවය සහ පළකිරීමට සුදුසු බව තහවුරු කිරීම සඳහා ලිපි සමාලෝචනයට ලක්කරන ප්‍රකාශනය. ජර්නලය සඳහා පොදු ප්‍රවණතා ක්‍රමවේදයක් වනුයේ "සුචිගත කිරීමය". සුචිගත කළ ජර්නලයක් වන්නේ, විද්‍යා උද්ධාර සුචිය, උපුටා දැක්වීමේ සහ සාරසංග්‍රහ කිරීමේ දත්තපාදකය (SCOPUS), සබ්. මෙඩ්. හිනාරි හෙවත් පර්යේෂණ මූලාරම්භය වෙත සෞඛ්‍ය අන්තර්ජාල ප්‍රවේශය, උල්රිච්ගේ අන්තර්ජාතික වාරසඟරා නාමාවලිය, ඉන්ඩෙක්ස් කොපර්නිකස්, ප්‍රෝ කුවෙස්ට් ආදී මුල්පෙලේ දත්ත සමුදායන් හී ඇතුළත් ශාස්ත්‍රීය සඟරාවක් හෙවත් ජර්නලයකි. ලෝක ව්‍යාප්තව බහුලවම භාවිත වන සුචි අතර විද්‍යා උද්ධාර සුචිය හෝ සමාජ විද්‍යා උද්ධාර සුචිය හෝ ඉංජිනේරුමය සුචිය පවතියි. සුචිගත කිරීම තුළින්

ජර්නලයක ගුණාත්මකභාවය දක්වාලයි. සුචිගත නොකළ ජර්නල හා සන්නිවේදනය කිරීමේදී සුචිගත කළ ජර්නල විද්‍යාත්මක වශයෙන් ඉහළ මට්ටමක පවතින බව පිළිගැනෙයි. ජර්නලයක් සුචිගත කිරීම තුළින් එහි දෘෂ්‍යතාව, සුලභතාව හා පාඨක සමූහය ඉහළ නැංවිය හැකිය.

## බලපෑම් සාධකය සහ උද්ධාරය

විද්‍යාත්මක ජර්නලයක (සඟරාවක) බලපෑම් සාධකය (ඉම්පැක්ට් ෆැක්ටර්) ලෙස හැඳින්වෙන්නේ අදාළ සඟරාවෙහි පළවූ ලිපි සඳහා ලද උද්ධාර සංඛ්‍යාවෙහි වාර්ෂික සාමාන්‍යයයි. සාමාන්‍ය පිළිබිඹු කරන බලපෑම් සාධකය සාමාන්‍යයෙන් භාවිත කරනුයේ කිසියම් ක්ෂේත්‍රයක් තුළ අදාළ ජර්නලය සතු සාපේක්ෂ වැදගත්කම ඇගයීමටය. "ක්ලැරිවේට් ඇනලිටික්ස්" (මෙයට පෙර තොම්සන් රොයිටර්ස්ට අයිතිව තිබූ ආයතනයකි) විසින් වාර්ෂිකව පළරන "ජර්නල් සයිටේෂන් රිපොට්ස්" හී ලැයිස්තු ගත ප්‍රකාශන ජර්නල් සඳහා ගණනය කළ බලපෑම් සාධකය පළ කරනු ලැබේ. සුචිගත කළ සියළු ජර්නල් සඳහා බලපෑම් සාධකය ලද නොහැකිය. ඉහළ බලපෑම සාධක සහිත ජර්නල, පහළ බලපෑම් සාධක සහිත ජර්නලවලට වඩා වැදගත් බව බොහෝවිට සැලකෙයි.

උද්ධාරයක් යනු පත්‍රයක්, පොතක් හෝ කතුවරයාට දක්වන උද්ධෘතයක් හෝ යොමුවකි. පර්යේෂණයන්හී වර්තමාන ප්‍රවණතා, පරතර, අළුතෙන් ඉස්මතුවන ක්ෂේත්‍ර තක්සේරු කරගැනීමට උද්ධාර උපකාරී වෙයි. උද්ධාර සුචිය යනු, තමන්ට අදාළ ක්ෂේත්‍රයෙහි උද්ධාර සුචිය තුළ පර්යේෂකයකු ලකුණු අත්පත් කරගන්නා ආකාරය හඟවන ශාස්ත්‍රීය සම්මාන වාර්තාවකි.

## විවෘත ප්‍රවේශය

"විවෘත ප්‍රවේශය" යනු ඕනෑම අයෙකුට "භාවිත කළ හැකි" හෝ "ලද හැකි" බව දැක්වීමකි. මෑතදී සිදුවූ තාක්‍ෂණවිද්‍යා සංවර්ධන හේතුකොට වඩාත් පහසුවෙන් සහ වේගයෙන් ප්‍රකාශිත තොරතුරු වෙත ප්‍රවේශවීම, ඒවා සෙවීම සහ හවුල් පරිහරණය ඉහළ දැමීමට සමත්ව ඇත. ඒසේම තාක්‍ෂණය අවනතිය සහ සමාලෝචන ක්‍රියාවලි සහ ප්‍රකාශන කාලය වඩා පහසුකර ඇත. විවෘත ප්‍රවේශය තුළ පර්යේෂණ ප්‍රතිඵල / ප්‍රකාශන කිසිදු පිරිවැයකින් තොරව මාර්ගගතව නොමිලයේ ලබාගැනීමට පුළුවන. සම පදස්ථ සමාලෝචිත සහ සම පදස්ථ සමාලෝචිත නොවන ජර්නල් ලිපි, සම්මන්ත්‍රණ පත්‍රිකා, පොත් පරිච්ඡේද, නිබන්ධන සහ ඒක විෂය සංග්‍රහ ඇතුළු සියළු ආකාරයේ ප්‍රකාශිත ද්‍රව්‍ය විවෘත ප්‍රවේශයට ලක්කළ හැකිය.




**01 වන රූපය: ජාතික විද්‍යා පදනම මගින් ප්‍රකාශයට පත්කරන ජර්නලය**




**02 වන රූපය: විවිධ ශික්‍ෂණයන් ඔස්සේ ජාතික විද්‍යා පදනමේ ජර්නලය වෙත ලිපි ඉදිරිපත් කෙරෙන ආකාරය**

## ජාතික විද්‍යා පදනමේ ශාස්ත්‍රීය සඟරා (ජර්නල)

ජාතික විද්‍යා පදනම ශාස්ත්‍රීය සඟරා හෙවත් ජර්නල් දෙකක් පළ කරයි. ඒවා නම් ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනම් ජර්නලය සහ සමාජ විද්‍යාව පිළිබඳ ශ්‍රී ලංකා ජර්නලයය. ඒවා පළකිරීමේ අරමුණ වන්නේ පර්යේෂණ ප්‍රතිඵල පළකිරීම ප්‍රවර්ධනය කිරීම සහ සහායවීමයි. මෙම ප්‍රකාශන දෙකම විවෘත ප්‍රවේශ සහ සම - පදස්ථ සමාලෝචිත ජර්නල වෙයි.

ජාතික විද්‍යා පදනමේ ජර්නලය 1973 වර්ෂයේ සිටම විද්‍යාව හා තාක්‍ෂණවිද්‍යාවේ සියළු අංශවල පර්යේෂණ ප්‍රතිඵල පළකිරීමේ නියැලෙයි. එය දේශීය හා විදේශීය පර්යේෂකයන්ගේ පර්යේෂණ පත්‍රිකා පිළිගන්නා ප්‍රකාශනයකි. ජාතික

විද්‍යා පදනමේ ජර්නලයට කෙරෙන ඉදිරිපත්කිරීම් විද්‍යාව සහ තාක්ෂණ විද්‍යාවේ විෂය ක්ෂේත්‍ර පුළුල් පරාසයක් ආවරණය කරයි. ඉංජිනේරුවිද්‍යාව, තොරතුරු තාක්ෂණය, ගණිතය (2වන රූප සටහන) වැනි විෂය එහිදී ප්‍රමුඛය. මෙම ජර්නලය මාර්තු, ජූනි, සැප්තැම්බර් සහ දෙසැම්බර් වශයෙන් වර්ෂයකට කලාප 4ක් පළකෙරේ. එය "ක්ලැරිවේට් ඇනලිටික්ස්" හී මෙන්ම "කෙමිකල් ඇන්ඩ් බයෝලොජිකල් ඇබ්ස්ට්‍රැක්ට්ස්", "බයෝසිස් ප්‍රිවීව්ස්", "සූලොජිකල් රෙකෝඩ්ස්", "ස්කෝපස්", "ටීල්", "යුල්රිච්", "ඇග්රිකෝලා" සහ "ඉබස්කෝහොස්ට්" අදී දත්ත සමුදා ගණනාවකට සුචිගත කර ඇත.

ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනමේ ජර්නලය සඳහා දේශීය වශයෙන් මෙන්ම විදේශීය වශයෙන්ද විශාල සංසරණයක් හිමිය. රටවල් 25කට වැඩි සංඛ්‍යාවක කතුවරයන් ඔවුන්ගේ ලිපි මෙම ජර්නලයෙහි පළකර ඇත.

සුචිගත කිරීමෙන්, විවෘත ප්‍රවේශය ඇතිකිරීමෙන් සහ සම - පදස්ථ සමාලෝචිත කිරීමෙන් පසුව ජාතික විද්‍යා පදනමේ ජර්නලයට ලිපි ඉදිරිපත්කිරීම් හී අතිවිශාල වැඩිවීමක් නිරීක්ෂණය කර ඇත. ජාතික විද්‍යා පදනමේ ජර්නලයේ 2016 වර්ෂයේ බලපෑම් සාධකය 0.42කි. එය පසුගිය වසර සමග සන්නිවේදනය කරන විට සැලකිය යුතු වර්ධනයක් පෙන්වයි. සමාජ විද්‍යාව පිළිබඳ ශ්‍රී ලංකා ජර්නලය (SLJSS) පළකෙරන්නේ වසරකට දෙවරකි. ඒ ජූනි හා දෙසැම්බර් ලෙසිනි. 1978 සිටම මෙම ජර්නලය ශ්‍රී ලංකාව සහ අනෙකුත් දකුණු ආසියානු රටවල් වෙත අවධානය යොමුකරමින්, සමාජ විද්‍යාවේ සියළු විෂය පරාසයන් ආවරණය කරන ලිපි සිංහල, දෙමළ සහ ඉංග්‍රිසි යන භාෂාත්‍රයෙන්ම පළකරනු ලබයි. මෙම ජර්නලය සමාජ විද්‍යාව, දේශපාලනය, අධ්‍යාපනය සහ ආර්ථික විද්‍යාව යන විෂයයන් ප්‍රමුඛ කොට සමාජ විද්‍යාවට සහ




**03 වන රූපය: ශ්‍රී ලංකා සමාජ විද්‍යා ජර්නලය**

මානව ශාස්ත්‍ර විද්‍යාවට අයත් විවිධ විෂයයන් ගණනාවක් ආවරණය කරයි. මෙම ජර්නලය දැනට "ස්කෝපස්" (SCOPUS) හි සුචිගත කර අතර "ක්ලැරිවේට් ඇනලිටික්ස්" යටතේද සුචිගත කිරීමට පියවර ගනිමින් ඇත.

අවසාන වශයෙන් සඳහන් කළ හැක්කේ, විද්‍යාත්මක ලේඛනය සහ පළකිරීම්, විද්‍යාත්මක දැනුම පුළුල් කිරීමට දායක වන්නේ විද්‍යාත්මක ප්‍රජාව අතර විද්‍යාත්මක ප්‍රතිඵල සහ අදහස් සන්නිවේදනය කිරීමේ අත්‍යවශ්‍ය මෙවලමක් බවට පත්වෙමිනි. එහිදී කතුවරයාට පෞද්ගලික සංතුෂ්ටියක්ද හිමිවන බව කිව යුතුය.




**04 වන රූපය: විවිධ ශික්ෂණයන් ඔස්සේ ශ්‍රී ලංකා සමාජ විද්‍යා ජර්නලය වෙත ලිපි ඉදිරිපත් කෙරෙන ආකාරය**



ජාතික විද්‍යා පදනම
ප්‍රකාශන ඒකකය
අංශ ප්‍රධානි
**ආචාර්ය එස්. ඒ. වී. මූර්ති**
gowry@nsf.gov.lk
0775099339



# ලැබූ දැනුම විමසමු

**35 වෙළුම 2018 ඔක්තෝම්බර් - දෙසැම්බර්**

**විදුරාව සඟරාවේ මෙම කලාපය කියවීමෙන් ඔබ ලද දැනුම විමසා බලමු.**

මෙම කලාපයෙහි පළව ඇති ලිපි කියවා පහත දැක්වෙන ප්‍රශ්නවලට ඔබට පිළිතුරු දිය හැකිදැයි බලන්න.

## 1. හරිද? වැරදිද?

අ. ජාතික විද්‍යා පදනමෙහි ආරම්භය සනිටුහන් වූයේ ජාතික විද්‍යා කවුන්සිලය ලෙසය.

ආ. ජාතික විද්‍යා කවුන්සිලයෙහි ප්‍රථම සභාපතිවරයා වූයේ ශ්‍රීමත් නිකොලස් ආටිගල මහතාය.

ඇ. ජාතික විද්‍යා පදනම පිහිටුවනු ලැබුයේ 1994දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ විද්‍යා හා තාක්ෂණවිද්‍යා සංවර්ධන පනත මගිනි.

ඈ. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක විද්‍යාව හා සම්බන්ධ සියළු ක්‍රියාකාරකම් ජාතික විද්‍යා පදනම හරහා ක්‍රියාත්මක විය යුතුය.

ඉ. 2002 දී යුනෙස්කෝ ජාතික කමිටුව මගින් "සාමය සහ සංවර්ධනය" තේමා කරගත් ලෝක විද්‍යා දිනය සැමරීමේ කේන්ද්‍රීය මධ්‍යස්ථානය ලෙස ජාතික විද්‍යා පදනම හඳුනා ගනු ලැබිණ.

## 2. හරිද? වැරදිද?

අ. "බරින් වැඩි වස්තු ඒවායේ බර වැඩිකම හේතු කරගෙන වේගයෙන් ඇදවැටේ" මෙය ඇරිස්ටෝටල්ගේ සිද්ධාන්තයකි.

ආ. ලෝකය පිළිබඳව මිනිසුන් දැරූ අදහස් වෙනස්කිරීමට විද්‍යාඥයන්ගේ සොයාගැනීම් ඉවහල්විය.

ඇ. බාහිර ස්වරූපයෙන්, අභ්‍යන්තර ව්‍යුහයෙන්, පෝෂණ ක්‍රමයෙන්, වාසස්ථාවලින් වෙනස්වන ශාක සහ සත්ව මිලියන එකක් පෘථිවියෙහි වෙසෙති.

ඈ. සුමිත්‍රා රාහුබද්ධ මහත්මිය රචිත "මුහුද කළු උණා" ළමා කෘතිය සුනාමි ඛේදවාචකය ගැන දරුවන් දැනුවත් කරයි.

ඉ. ජාතික විද්‍යා පදනම නිපදවූ "මිහිමඩල" වැඩසටහන් මාලාවට "මන්තත්" දකුණු ආසියානු ජාත්‍යන්තර සම්මානය දිනාගත හැකිවිය.

## 3. හරිද? වැරදිද?

අ. උසස් අධ්‍යාපනය සහ පුහුණුව, තාක්ෂණවිද්‍යාත්මක සූදානම, සහ නවෝත්පාදන, ගෝලීය තරඟකාරීත්ව දර්ශක වාර්තාව දක්වන ප්‍රධාන කුළුණු තුනකි.

ආ. තාක්ෂණවිද්‍යාව සහ නවෝත්පාදන මගින් මෙහෙයවන සංවර්ධනය නව දැනුම නිර්මාණය සහ භාවිත කිරීමට පමණක් සීමා නොවේ.

ඇ. විදේශ ඍජු ආයෝජන දිගුකිරීම හෝ ප්‍රවර්ධන හෝ තාක්ෂණවිද්‍යාත්මක වෙළඳ ක්‍රමෝපාය නොවේ.

ඈ. දැනුම ආර්ථික සන්දර්භයක් තුළ බුද්ධිමය දේපළ අගය තවත් ඉහළයයි.

ඉ. ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය තොරතුරු පද්ධතිය, සහ සෞඛ්‍ය සත්කාර ව්‍යවහාර තවමත් වැඩිවශයෙන් රදෙනුයේ කඩදාසි භාවිතය සහ හස්තීයමය ක්‍රියාකාරකම් මතය.

## 4. හරිද? වැරදිද?

අ. සමාජය සඳහා විද්‍යාව හා තාක්ෂණවිද්‍යාව මැයෙන් රජය සංසදයක් පිහිටවනු ලැබුයේ 2016දීය.

ආ. ජාත්‍යන්තර තලයන්හී දී තම පර්යේෂණාත්මක කාර්යයන් හී ප්‍රතිඵල හා සොයාගැනීම් ඉදිරිපත් කිරීමට ජාතික විද්‍යා පදනම ආධාර සපයයි.

ඇ. විද්‍යාව හා තාක්ෂණවිද්‍යාව හා සම්බන්ධ ජාත්‍යන්තර

# ලැබූ දැනුම විමසමු

**35 වෙළුම 2018 ඔක්තෝම්බර් - දෙසැම්බර්**

*විදුරාව සඟරාවේ මෙම කලාපය කියවීමෙන් ඔබ ලද දැනුම විමසා බලමු.*

මෙම කලාපයෙහි පළව ඇති ලිපි කියවා පහත දැක්වෙන ප්‍රශ්නවලට ඔබට පිළිතුරු දිය හැකිදැයි බලන්න.

හවුල්කාරීත්ව ඇතිකිරීමට ජාතික විද්‍යා පදනම සම්බන්ධ නොවේ.

ඈ. ජාතික විද්‍යා පදනම ද්වි - පාර්ශවික සහයෝගිතාව නංවාලීමට දැනටමත් රටවල් කිහිපයක් සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කර ඇත.

ඉ. අන්තර්ජාතික ජාන ඉංජිනේරු සහ ජෛවතාක්ෂණ මධ්‍යස්ථානයේ කලාපීය කාර්යාලයක් ශ්‍රී ලංකාව තුළ පිහිටුවීමට යෝජිතය.

## 5. හරිද? වැරදිද?

අ. කුඩා ආර්ථිකයක් සහිත වැඩි ජනගහනයක් වෙසෙන ඉහළ දරිද්‍රතා අනුපාතයක් ඇති රටවලට නව දැනුම හිමිකර ගැනීම අසීරුය.

ආ. සිංගප්පූරුව වසර 50ක පමණ කාලයක් තුළ පර්යේෂණ සංවර්ධන හා නවෝත්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කළ බැවින් දැන් සංවර්ධිත දේශයක් බවට පත්ව ඇත.

ඇ. වර්ෂ 2013 සිට 2015 කාලය දක්වා ශ්‍රී ලංකාව පර්යේෂණ කටයුතු සඳහා වෙන්කරන මුදල් අතිවිශාල ලෙස වැඩිවී ඇත.

ඈ. පර්යේෂණ හා සංවර්ධන කටයුතුවල නියැලුනවුන්ගේ කාර්යභාරය සීමාකරන ප්‍රධාන හේතුවක් වන්නේ විද්‍යාත්මක සාහිත්‍ය ප්‍රකාශන සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවීමය.

ඉ. පර්යේෂණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේදී අනුගමනය කළ යුතු පියවර වනුයේ 1) ගැටළුව හඳුනාගැනීම 2) පවතින සාහිත්‍ය සමාලෝචනය 3) ගැටළුව පැහැදිලි කිරීම 4) අරමුණු සහ කල්පිත නිර්වචනය 5) ක්‍රමවේදය 6) ප්‍රතිඵල හා සාකච්ඡාවය.

## 6. හරිද? වැරදිද?

අ. නියාමන, ව්‍යාප්ති හා ප්‍රති - ව්‍යාප්ති වශයෙන් ප්‍රතිපත්ති තෙආකාරය.

ආ. සකස්කළ ප්‍රතිපත්ති අනුමත කරගැනීම ප්‍රතිපත්ති සකස්කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ නැත.

ඇ. ප්‍රතිපත්ති සැලසුම්කරුවන්ට හා අධිකාරීන්හට අවශ්‍ය ප්‍රතිපත්තිමය නිර්දේශ ලබාදීම විද්‍යා හා තාක්ෂණවිද්‍යා ප්‍රතිපත්ති පර්යේෂණ අංශයේ අභිලාෂයය.

ඈ. ජාතික විද්‍යා පදනම විසින් ජාතික පර්යේෂණ සංවර්ධන හා නවෝත්පාදන සමීක්ෂණයක් 2004 වර්ෂයේ සිට පවත්වාගෙන යයි.

ඉ. ජාතික නවෝත්පාදන පද්ධතිය ජාතික ආර්ථිකයේ උප පද්ධතියකි.

## 7. හරිද? වැරදිද?

(අ) භෞතික සහ ස්වභාවික ලෝකයේ හැසිරීම් සහ ව්‍යුහය නිරීක්ෂණය හා පරීක්ෂාකිරීම් සිදුකරන ක්‍රියාවලියක් ලෙස විද්‍යාව හැඳින්විය හැකිය.

(ආ) ජාතික විද්‍යා පදනම විවිධ වැඩසටහන් දියත් කරනු ලැබුයේ විද්‍යා ශිෂ්‍ය ශිෂ්‍යාවන් වඩා දැනුවත් කිරීම සඳහාය.

(ඇ) පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පර්යේෂණ කටයුතුවල නිරතවීම දිරිමත් කිරීම ඉතා සතුටුදායක ක්‍රියාවකි.

ඈ) ගුරු මහත්ම මහත්මීන් පංති කාමරයට සීමාවී විද්‍යාව ඉගැන්වීම කළ යුතු වුවත් ඉන් පිටතට නොයායුතුය.

(ඉ) ජාතික විද්‍යා පදනම් වැඩසටහන් විද්‍යාව හදාරණ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට මෙන්ම ගුරුවරුන්ටද ප්‍රයෝජනවත්ය.

# ලැබූ දැනුම විමසමු

**35 වෙළුම 2018 ඔක්තෝම්බර් - දෙසැම්බර්**

*විද්‍යුරාව සඟරාවේ මෙම කලාපය කියවීමෙන් ඔබ ලද දැනුම විමසා බලමු.*

මෙම කලාපයෙහි පළව ඇති ලිපි කියවා පහත දැක්වෙන ප්‍රශ්නවලට ඔබට පිළිතුරු දිය හැකිදැයි බලන්න.

### *8. හරිද? වැරදිද?*

*අ. ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය කැපව සිටිනුයේ විද්‍යා සාහිත්‍යමය ප්‍රකාශන සෙවීම සහ ඒවා වෙත ප්‍රවේශවීම, දැනුවත්බව නංවාලීම සහ ප්‍රලේඛන සේවා සැපයීම උදෙසාය.*

*ආ. ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානයේ වෙබ් අඩවිය මධ්‍යම පිවිසුම් මඟක් නොවේ.*

*ඇ. දේශීය විද්‍යාත්මක ජර්නල ප්‍රකාශන මාර්ගගත වේදිකාවක් තුළින් ලබාගැනීමට, ශ්‍රී ලංකා මාර්ගගත ජර්නලය අවස්ථාව සලසයි.*

*ඈ. සංඛ්‍යාක තොරතුරු ජාලයක ජාතික කෝෂ්ඨාගාරයක් පැවතීම වැදගත්කමක් නොදක්වයි.*

*ඉ. ජාතික විද්‍යා පදනම පර්යේෂණ ප්‍රදාන පිරිනමන්නේ පර්යේෂණ හැකියා සහ නවෝත්පාදන නංවාලීමටය.*

### *9. හරිද? වැරදිද?*

*(අ. ලිපි සහ පර්යේෂණ පත්‍රිකා ශාස්ත්‍රීය සඟරා තුළ පළකළත් නොකළත් අදාළ තොරතුරු ලේඛිතව තැන්පත්වේ.*

*ආ. පර්යේෂණ තොරතුරු සඳහා එල්ල වෙන එලදායි විවේචන අදාළ ක්ෂේත්‍රය තුළ තවතවත් පර්යේෂණ සිදුකිරීම දිරිගැන්වෙයි.*

*ඇ. පර්යේෂණ තොරතුරු පළ කිරීමෙන් විද්‍යාඥයන්හට තම සන්නිවේදන සහ ලේඛන කුසලතා යහපත් කර ගැනීමට හැකිවෙයි.*

*ඈ. විද්‍යාත්මක සඟරාවක "බලපෑම් සාධකය" ලෙස හැඳින්වෙන්නේ අදාළ සඟරාවෙහි පළවූ ලිපි ලද උද්ධාර සංඛ්‍යාවෙහි වාර්ෂික සාමාන්‍යයය.*

*ඉ. විවෘත ප්‍රවේශය භාවිත කළ හැක්කේ ඒ සඳහා අවසරලත් අයට පමණය.*

## පිළිතුරු

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | (අ) හරි | (ආ) හරි | (ඇ) හරි | (ඈ) වැරදි | (ඉ) හරි |
| 2. | (අ) හරි | (ආ) හරි | (ඇ) වැරදි | (ඈ) හරි | (ඉ) හරි |
| 3. | (අ) හරි | (ආ) හරි | (ඇ) වැරදි | (ඈ) හරි | (ඉ) හරි |
| 4. | (අ) හරි | (ආ) හරි | (ඇ) වැරදි | (ඈ) හරි | (ඉ) හරි |
| 5. | (අ) හරි | (ආ) හරි | (ඇ) වැරදි | (ඈ) හරි | (ඉ) හරි |
| 6. | (අ) හරි | (ආ) වැරදි | (ඇ) හරි | (ඈ) හරි | (ඉ) හරි |
| 7. | (අ) හරි | (ආ) හරි | (ඇ) හරි | (ඈ) වැරදි | (ඉ) හරි |
| 8. | (අ) හරි | (ආ) වැරදි | (ඇ) හරි | (ඈ) වැරදි | (ඉ) හරි |
| 9. | (අ) වැරදි | (ආ) හරි | (ඇ) හරි | (ඈ) හරි | (ඉ) වරදි |

# ජාතික විද්‍යා පදනම් ගීතය

විදුහුරු නුවණයි
සිප්ලකු දැනුමයි

සිරිලක් වාසී දනට බෙදා දෙන
ජාතික විද්‍යා පදනම අපගේ

නව ලොව දකිනා දෑසයි
නව ලොව දකිනා දෑසයි

ගොඩ නංවන්නෙමු හෙට දින ලෝකය
පිරියෙසුමෙන් නව මං පාදා

මනුවග යහපත-දියුණුව සලසමු
දෙස දෙස යස රැව් ගොස පතුරා

විදුහුරු නුවණයි
සිප්ලකු දැනුමයි

ජන දිවියට-නව පණ නල පිඹිමින්
රට වෙනුවෙන්-මතු වැඩ සලසා

ඉදිරියටම යමු අදිටන මුසුකොට
සමබර සිප්ලකු නුවණ සදා

විදුහුරු නුවණයි
සිප්ලකු දැනුමයි

සිරිලක් වාසී දනට බෙදා දෙන
ජාතික විද්‍යා පදනම අපගේ

නවමු ලොවක තුඟු සවියයි
නවමු ලොවක තුඟු සවියයි

- *පද රචනය* : *සුනිල් සරත් පෙරේරා*
- *සංගීතය හා තනුව* : *රෝහණ වීරසිංහ*
- *ගායනය* : *අමරසිරි පීරිස් සහ ශශිකා නිසංසලා*













**ජාතික විද්‍යා පදනම**
**47/5 මේට්ලන්ඩ් පෙදෙස**
**කොළඹ 07**